# ප්‍රගති වාර්තාව

# අධිකරණ අමාත්‍යාංශය

**2016 - ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**

**අධිකරණ අමාත්‍යාංශය**

**උපරිමාධිකරණ සංකීර්ණය**

**කොළඹ 12.**

**www. justiceministry.gov.lk**

ගරු අධිකරණ අමාත්‍යතුමාගේ පණිවිඩය



**අධිකරණ අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ ප්‍රගති වාර්තාව එළිදැක්වීම වෙනුවෙන් සුභ පැතුම් පණිවුඩයක් එක් කරනුයේ ඉමහත් සතුටිනි.**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යහපාලන රජයේ රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව අධිකරණ ක්ෂේත්‍රය යළිත් ජාත්‍යන්තර ප්‍රජාවගේ මෙන්ම මෙරට මහජනතාවගේ ද විශ්වාසය දිනාගත් විශිෂ්ට ආයතනයක් බවට පත් කිරීමට හැකිවීම පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මම සතුටු වෙමි.

පසුගිය කාලපරිච්ඡේදයේදී මෙරට නීති කෙටුම්පත් සම්පාදනය කිරීම හා නීති සංශෝධනයන් නිසි කලට ඉටු නොවීම හේතුවෙන් යුක්තිය පසිදලීමේ කාර්ය භාර්යය කාර්යක්ෂමව ඉටු කිරීමට බාධාවක් වූ බව අප සියලු දෙනාම හොඳින් දන්නා කරුණකි. එවන් පසුබිමක යුක්තිය පසිදලීමේ කාර්යභාර්යය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා පසුගිය වසරේදී අධිකරණ අමාත්‍යාංශය ඉටුකළ කාර්යභාර්යය වඩාත් ප්‍රශංසාත්මක වන අතර විශේෂයෙන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් ආරම්භ කළ ස්වාධීන කොමිෂන් සභා මෙන්ම වසර ගණනාවක් මුළුල්ලේ හමස් පෙට්ටියට ඇද දමා තිබූ ඖෂධ පනත, වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත,කාලාවරෝද විශේෂ විධි විධාන පනත වැනි මහජන අවශ්‍යතාවයන් මත සම්පාදනය කළ නීති අණ පනත් ගණනාවක් පාර්ලිමේන්තුවට ගෙන ඒමට ලැබීම මෙරට ජනතාව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

පසුගිය කාලපරිච්ඡේදයේ අපරාධ වර්ධනය වීමට ප්‍රබලව බලපා තිබූ සාක්ෂිකරුවන්ගේ හා වින්දිතයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීති අන පණත් මෙන්ම ඊටම වෙන්වූ අධිකාරියක් නොමැති වීම මෙරට යුක්තිය පසිදලීමේ කාර්යභාර්යයට ප්‍රබල බාධකයක් වූ බැවින් මෙම වසරේ සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීම සඳහා වෙනම අධිකාරියක් ස්ථාපිත කර මෙරට නීති පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ සාධනීය පියවර  අධිකරණ පද්ධතිය පිළිබඳ මහජනතාවගේ විශ්වාසය වර්ධනය වීමට හේතුවක් වී තිබේ.

වසර 30 කට අධික කාලයක් මෙරට පැවති යුධමය වාතාවරණය හේතුවෙන් තම පාරම්පරික ඉඩ කඩම්, දේපල අහිමි වූ ජනතාවගේ දේපල හිමිකම් සනාථ කර ගැනීම සඳහා කාලාවරෝද විශේෂ විධි විධාන පනත හඳුන්වා දෙමින් උතුරු නැගෙනහිර පලාත්වල ජනතාවට යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීමට ලබාදුන් නීතිමය රැකවරණය මහජන අවශ්‍යතාවයන් මැනවින් තේරුම්ගෙන සිදුකළ නීතිමය සංශෝධනයකි.

මෙරට අධිකරණ පද්ධතියට යොමුවන  ආරවුල් හා ගැටලු පාලනය කරමින් අධිකරණ ක්‍රියාමාර්ග වලින් තොරව මහජනතාවට නීතියේ සහන ලබාදීම සඳහා ස්ථාපිත කළ සමථ මණ්ඩල ක්‍රමය වඩාත් ශක්තිමත් කිරීම සඳහා එහි ආරවුල් සම්බන්ධව පැවති නීතිමය සීමාව රුපියල් ලක්ෂ 05ක් දක්වා වැඩි කිරීම මෙරට මහජනතාවගේ යුක්තිය පසිදලීමේ කාර්යභාර්යය ශක්තිමත් කිරීමට ගනු ලැබූ සාධනීය පියවරක් වන අතර මෙරට අධිකරණ පද්ධතියේ පවතින භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම, කොළඹ විශ්ව විද්‍යාලය සමග නීති පර්යේෂණ ඒකකයක් පිහිටුවීම, අපරාධ නඩු විධි විධාන සංශෝධන පනත හා සිවිල් නඩු විධි විධාන සංශෝධන පනත සම්පාදනය කිරීම සඳහා මහජන අදහස් ලබාගැනීම පසුගිය වසරේදි අධිකරණ අමාත්‍යාංශය විසින් සිදු කළ සේවාවන් අතර ප්‍රමුඛතාවයක් ගෙන ඇති අතර විශේෂයන් ආසියාවේ දියුණුතම රස පරීක්ෂක වාර්තා ලබාදීමේ මධ්‍යස්ථානයක් ලෙස රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවද කොරියානු ආධාර මත නවීකරණය කිරීමට අධිකරණ අමාත්‍යාංශය ගනු ලැබූ තීරණ පැසසිය යුතුයි.

වසරක් වැනි කෙටි කාලයක් තුළ මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ආයතන ප්‍රධානීන් විසින් ඉටු කළ සේවය අගය කරන අතර යුක්තිය පසිදලීමේ කාර්යය වාඩාත් විශ්වාසනීයව හා ඵලදායීව සිදු කිරීමට ලබාදෙන සහයෝගය අගය කොට සලකමි.

ආචාර්ය ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ
අධිකරණ හා බුද්ධශාසන අමාත්‍ය

# ගරු අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



පාර්ලිමේන්තුව නියෝජනය කරන ළාබාලතම මන්ත්‍රීවරයෙකු මෙන්ම නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වශයෙන් රටේ උත්තරීතර පරිපාලන ආයතන කිහිපයක කාර්යභාරයන්, විෂය පථය වූ අධිකරණ අමාත්‍යාංශයේ 2016 ප්‍රගති වාර්තාව සඳහා පණිවිඩයක් එක් කිරීමට ලැබීම සතුටට කරුණකි. පසුගිය කාලසීමාව තුළ අප විසින් යුක්තිය පසිදලීමෙහිලා දැක් වූ දායකත්වයත්, ජනතාභිලාෂයන් සපුරාලීමට නිති ප්‍රතිශංස්කරණ හා නීතියේ ආධිපත්‍ය ශක්තිමත් කිරීම තුළින් සිදු කළ දායකත්වය පිළිබඳවත්, නවීකරණය වන සංකීර්ණ ජන සමාජය තුළ අධිකරණ අමාත්‍යාංශය වශයෙන් අපගේ ඉදිරි කාර්යභාරය පිළිබඳවත් මෙමගින් අවබෝධයක් ලැබෙනු ඇතැයිද හුදෙක්ම බලාපොරොත්තු වෙමි.

කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිදලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරිම අපගේ ප්‍රමුඛතම කාර්යභාරයයි. ඒ ඔස්සේ 2016 වසරේ ගත වූ කාලසීමාව තුළ අධිකරණ අමාත්‍යාංශය වශයෙන් මෙන්ම අනුබද්ධ ආයතන වෙන් වෙන් වශයෙනුත් විශාල කාර්යභාරයක් ඉටුකර ඇත. විශේෂයෙන් යුක්තිය පසිදලීමෙහිලා සිදු කරන පරිපාලනමය ක්‍රියාවලියේදී ඇති වන ප්‍රමාදයන් හා දෝෂ අවම කිරිම සඳහා දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි අති විශාල මූල්‍ය ප්‍රතිපාදනයන් යෙදවීම තුළින් අධිකරණ සේවාවන් කාර්යක්ෂම කිරිමටත් ජනතාව තුළ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව ඇති විශ්වාසය තීව්‍ර කිරීමටත් හැකියාව ලැබී ඇත.

නීති කෙටුම්පත් සැකසීම, රාජ්‍ය ආයතන සඳහා නීති උපදෙස් ලබාදීම අතින් ගත් කල ගෙවුණු වසරක කාලසීමාව තුළ අධිකරණ අමාත්‍යාංශය සුවිශේෂී ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. විශේෂයෙන් විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති නීති බවට පත් කරමින් යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීමට රජයට සහය ලබාදීම එහි ප්‍රමුඛතම අරමුණයි. නඩු ප්‍රමාදයට බලපෑ රස පරීක්ෂක වාර්තා, ප්‍රමාදයකින් තොරව ලබාදීම සඳහා එම දෙපාර්තමේන්තුවෙන් නවීන පහසුකම් සැපයිමට අවශ්‍ය මූලික පියවර ගැනිම මෙන්ම අධිකරණවල ගොඩගැසී තිබෙන නඩු භාණ්ඩ පිළිබඳ ගැටළුව විසඳීම සඳහා කාලෝචිත ලෙස නීති වෙනස් කිරීම මෙහිලා සඳහන් කිරීම වැදගත් වේ.

රටේ මූලික නීති පද්ධතිය යාවත්කාලීන කර ශක්තිමත් කරනවා සේම තරුණ ප්‍රජාව හා සබැදි විශේෂයෙන් අන්තර්ජාලය භාවිතයේදී පැන නගින ගැටළුවලට නීතිමය රාමුවක් සැකසිමත් ඒ තුලින් ඔවුන්ට සැකයකින් බියකින් තොරව එය භාවිත කිරීමේ නිදහසක් ඇති කිරීමටත් පරිගණක අපරාධ මැඩලීමට තරුණ දායකත්වය වැඩි වශයෙන් ලබා ගැනීමටත් ඉදිරි කාල සීමාව තුළ බලාපොරොත්තු වේ.

අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රගතිය ගැන සඳහන් කරන මේ මොහොතේ අත්පත් කරගත් ජයග්‍රහණ මෙන්ම ඉදිරි වැඩසටහන් සඳහා සක්‍රියව දායකත්වය ලබා දෙන ගරු අධිකරණ අමාත්‍යතුමන්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියළු නිලධාරීන්, අමාත්‍යාංශයේ සියළු කාර්ය මණ්ඩල සාමාජිකයින්, අධිකරණ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන හා දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ කැපවීම, දායකත්වය විශේෂයෙන් සඳහන් කරන අතර ඔවුන්ට මාගේ කෘතඥතාවය පුද කරමි.

*නීතිඥ සාරථී දුෂ්මන්ත*
*අධිකරණ හා බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍ය*

# අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය



මහජන විශ්වාසය දිනා ගත් ශක්තිමත් යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා සුවිශේෂී ජයග්‍රහණ රැසක් 2016 වර්ෂයේ මේ දක්වා අත්කර ගැනීමට හැකි වූ බව සඳහන් කරන්නේ ඉමහත් සතුටිනි.

පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය උදෙසා වූ පනත් කෙටුම්පත් 15ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින අතර ඉන් ඉතා වැදගත් පනත් 04ක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට හැකි වීම සුවිශේෂී වේ. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවද වසරේ මේ වන විට පනත් කෙටුම්පත් 42ක වැඩ අවසන් කර ඇති අතර ඉන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ඇතුළුව පනත් 16ක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට හැකි විය.

අධිකරණයේ පවතින අධික නඩු ප්‍රමාදය වළක්වමින් ජනතාවට කඩිනමින් යුක්තිය ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යය ලෙස සලකනු ලබයි. ඒ අනුව අපරාධ නඩු විධාන සංග්‍රහය, දණ්ඩ නීති සංග්‍රහය සහ සිවිල් නඩු විධාන සංග්‍රහයට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන් දෙපලකගේ ප්‍රධානත්වයෙන් කමිටු දෙකක් පත් කර තිබෙනවා. එසේම නඩු විභාග වේගවත් කිරීම සඳහා පූර්ව නඩු විභාග කාර්යය පටිපාටි හඳුන්වා දීමේ සිවිල් නඩු විධාන සංග්‍රහ සංශෝධන පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය. එමෙන්ම 2016 විශේෂ අයවැය යෝජනා අනුව අධිකරණ පද්ධතිය පූර්ණ ස්වයංක්‍රීයකරණය සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර ආරම්භක පියවර වශයෙන් මේ වසරේ අධිකරණ ශාලා 35ක ශ්‍රව්‍ය පටිගත කිරීම් සහිත ස්වයංක්‍රීය නඩු ගොනු පද්ධති ස්ථාපිත කිරීම අවසන් අදියරේ පවතී.

වසරේ මේ වන විට සමථ මණ්ඩලයට යොමු වූ ආරවුල් සංඛ්‍යාව 115,780ක් වන අතර එය අධිකරණයේ කටයුතු අඩු කිරීමට හා පහසු කිරීමට හේතු වී ඇත. තවද මේ වසරේ දිස්ත්‍රික්ක 05ක ඉඩම් ආරවුල් පිළිබඳ විශේෂ සමථ මණ්ඩල පිහිටුවීමට හැකි විය. එසේම වාණිජ ආරවුල් සමථකරණයෙන් විසඳීම අරමුණු කර ගනිමින් 2000 වසරේ සම්මත කළ පනත එල දරමින් ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය මේ වසරේ ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතී.

වර්තමානයේද ක්‍රියාත්මක ඉතා පැරණි අණ පනත් කාලයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අභියෝගය ජය ගනිමින් දීර්ඝ කාලයක් තිස්සේ නීති ක්ෂේත්‍රයේ අඩුපාඩුවක්ව පැවැති නීති පර්යේෂණ ඒකකයක් කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය හා ඒකාබද්ධව ආරම්භ කිරීමට කටයුතු කිරීම ඉතාමත් සුවිශේෂී වේ.

එසේම පසුගිය වසරේ සම්මත වූ පනත යථාර්තයක් බවට පත් කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් අපරාධයක සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය මෙම වසරේ ජනවාරි මාසයේ විවෘත කිරීමට හැකි විය. මෙම අධිකාරියේ සහන මහජනතාවට ලබා දීම තවදුරටත් පුළුල් කිරීම සඳහා නව පොලිස් කොට්ඨාසයක්ද ආරම්භ කරන ලදි.

යුක්තිය පසිඳලීමේ ඵලදායි යාන්ත්‍රණයක් සඳහා ඉතා හොඳ අධිකරණ ගොඩනැඟිලි ඇතුළු යටිතල පහසුකම් ඉතා වැදගත් වේ. ඒ අනුව මෙම වසරේ රුපියල් මිලියන 984ක මුදලක් අධිකරණ ගොඩනැඟිලි ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා වැය කිරීමට නියමිතය. වර්ෂයේ මේ වන විට මුතූර් දිසා මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැඟිල්ල හා ආණමඩුව, ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ හා නිකවැරටිය දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාල ගොඩනැඟිලි විවෘත කිරීමට හැකි විය. එසේම යාපනය කම්කරු විනිශ්චය සභාව වසර 30 කට පසු ආරම්භ කිරීමට හැකිවූ අතර නොවැම්බර් මාසයේදී රුපියල් මිලියන 480 වියදමින් ඉදි කළ හෝමාගම අධිකරණ සංකීර්ණය ගරු අග්‍රාමාත්‍යතුමාගේ සුරතින් ජනතා අයිතියට පැවරීමට නියමිතය.

කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් සඳහා ඉතා දක්ෂ විනිශ්චයකාරවරුන් අත්‍යවශ්‍ය බැවින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් දේශීය විදේශීය පුහුණු පාඨමාලා විශාල ප්‍රමාණයක් පවත්වා

ඇත. එසේම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අවශ්‍ය නවීන උපකරණ රැසක් මේ වසරේ මිලදී ගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව එම ආයතනයෙන් ලබා දෙන සේවා රැසක් පුළුල් කිරීමට හැකි වී ඇත.

රට තුළ ස්ථාපිත නීති ආධාර මධ්‍යස්ථාන 77ක් මඟින් සිදු කරන සුවිශාල මහජන සේවයද සඳහන් කළ යුතුමය. වසරේ මේ දක්වා නීති ආධාර මධ්‍යස්ථානවල සේවය ලබා ගත් ගණන 69,636කි.

මරණ දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් ලෙස ලිහිල් කිරිම පිණිසනිර්දේශ ඉදිරිපත් කිරිමට ගරු අධිකරන අමාත්‍යතුමා විසින් පත් කළ කමිටුවේ නිර්දේශ මත මේ දක්වා මරණීය දණ්ඩනය නියම වූ 187 දෙනෙකුට අතිගරු ජනාධිපතිතුමා විසින් ජීවිත සමාව ලබා දී ඇත.

මේ සා විශාල ප්‍රගතියක් අත් කර ගැනීමට නිරන්තර උපදෙස් ලබා දුන් හා මඟ පෙන්වූ ගරු අධිකරණ හා බුද්ධශාසන අමාත්‍ය ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමාටත් ගරු අධිකරණ හා බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍ය නීතිඥ සාරතී දුෂ්මන්ත මැතිතුමාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. එසේම ඒ සඳහා කැපවීමෙන් කටයුතු කළ අධිකරණ අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්යය මණ්ඩලයත්, අධිකරණ අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයත් ඉතාමත් කෘතවේදීව සිහිපත් කරමි.

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | අධිකරණ අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | |
| 2. | අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් | 04 |
| 3. | අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන | 05 |
| 4. | අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව | 07 |
| 5. | අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ ප්‍රගතිය | |
| 5.1 | නීති අංශය | 08 |
| 5.2 | ආයතන අංශය | 16 |
| 5.3 | ගිණුම් අංශය | 19 |
| 5.4 | යටිතල පහසුකම් අංශය | 20 |
| 5.5 | සංවර්ධන අංශය | 24 |
| 5.6 | සැලසුම් අංශය | 24 |
| 5.7 | අභ්‍යන්තර විගණන අංශය | 25 |
| 6. | අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන | |
| 6.1 | නීතිපති දෙපාර්තමේන්තුව | 26 |
| 6.2 | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | 28 |
| 6.3 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 31 |
| 6.4 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 33 |
| 6.5 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | 35 |
| 6.6 | ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | 39 |
| 6.7 | සමථ මණ්ඩල කොමිෂන් සභාව | 43 |
| 6.8 | කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | 47 |
| 6.9 | අධිකරණ නොවන නිලධාරින් සඳහා පුහුණු ආයතනය | 49 |
| **7.** | **අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය ආයතන** | |
| 7.1 | නීති ආධාර කොමිෂන් සභාව | |
| 7.2 | උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය | |
| 7.3 | ශ්‍රී ලංකා විනිශ්වයකාරවරුන්ගේ ආයතනය | |
| 7.4 | සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරිමේ ජාතික අධිකාරිය | |
| **8.** | **අධිකරණ** | |
| 8.1 | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | 52 |
| 8.2 | අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | 54 |
| **8**.3 | කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි | 55 |
| 9. | **අනුබද්ධිත ආයතන** | |
| 9.1 | නීති විද්‍යාලය | |

# අධිකරණ අමාත්‍යාංශය

## දැක්ම

- ❖ යුක්තිය පසඳලීමේ කාර්යක්ෂම ක්‍රමයක්

- ❖ ගෝලීය උන්නතීන්ට හා ජනතා අපේක්ෂාවන්ට සරිලන පරිදි සමාජීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## මෙහෙවර


- ❖ කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිඳලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
- ❖ පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## 02. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන්


- යුක්තිය පසිඳලීම, පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාලවන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම,පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැය ගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිදු ආයතනයක් වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු.
- සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදු කිරීම.
- උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුලුව සමස්ථ පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව කාර්යක්ෂමව ඉටු කිරීම.
- රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු.
- රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම.
- නීති කෙටුම්පත් කිරීම.
- යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඩුවම් සම්බන්ධයෙන් සමාවදීම, එම දඬුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- සමස්ථ ක්වාසි පද්ධතියේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- කම්කරු විනිශ්චය සභා පරිපාලනයට සහ ඊට අදාළ අනෙකුත් කටයුතු.
- නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම.
- නීති ශබ්ද මාලා පිළියෙල කිරීම.
- ශ්‍රී ලංකා නිති වර්තා පලකිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන අධීක්ෂණය සහ එම ආයතනවලට පැවරි ඇති අනෙකුත් සියලුම විෂයයන්.
- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට අදාළ සියළුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- 2000 අංක 44 ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතට අදාල කටයුතු.

# 03. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

## අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු



# අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන



## 04. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව

- අමාත්‍යාංශයේ කාර්යයන් පහත අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,

    i. නීති අංශය
    ii. **ආයතන අංශය**
    iii. ගිණුම් අංශය
    iv. යටිතල පහසුකම් අංශය
    v. සංවර්ධන අංශය
    vi. සැලසුම් අංශය
    vii. අභ්‍යන්තර විගණන අංශය

**i. නීති අංශය**

යුක්තිය පසිඳලීමට අදාළ නීති සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, නීති වාර්තා පලකිරීම, නීති ආධාර ලබා දීම, අපරාධ, සිවිල් සහ වාණිජ කරුණු සම්බන්ධයෙන් සහ අන්තර්ජාතික ළමා අපහරණය පිළිබඳ සිවිල් පැතිකඩයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා දීම සඳහා මධ්‍යම බලධාරියා වශයෙන් කටයුතු කිරීම, 1995 අංක 05 දරණ පනත යටතේ සිරකරුවන් මාරුකිරීම, ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභා පැවැත්වීම, සිරකරුවන්ට සමාව ප්‍රදානය කිරීම පිළිබඳ නිර්දේශයන් ලබා දීමත් නීති අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

**ii. ආයතන අංශය**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් හැර අනිකුත් සියලුම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පරිපාලන කටයුතු කිරීම.

**iii. ගිණුම් අංශය**

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල මූල්‍ය සැලසුම් කළමනාකරණය සහ පාලනය.

**iv. යටිතල පහසුකම් අංශය**

අධිකරණ ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස සහ කම්කරු විනිශ්චය සභා සහ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම.

**v. සංවර්ධන අංශය**

සංවර්ධන අංශය මඟින් අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි සංවර්ධන කාර්යයන් ඉටු කිරිම හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

**vi. සැලසුම් අංශය**

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රගති පාලනය සහ සුපරීක්ෂණය.

**vii. අභ්‍යන්තර විගණන අංශය**

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල ගිණුම් විගණනය.

# 05. අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි ප්‍රගතිය

## 5.1 නීති අංශය

### 5.1.1 2016 වර්ෂයේ ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 වන විට අධිකරණ අමාත්‍යාංශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද පනත් සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යෝජිත පනත් කෙටුම්පත්

#### 5.1.1.1 සම්මත කර ගන්නා ලද පනත්

**01. කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත**

1983 මැයි මස 01 දිනෙන් ආරම්භ වී 2009 මැයි මස 18 දිනෙන් අවසන් වන කාලසීමාව තුළ පැවති යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායම් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන අධිකරණයේ දී ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපලක් ආපසු ලබා ගැනීම සඳහා සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ නීතිමය විධිවිධාන සැලැස්වීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති පනතකි. මෙය 2016 අංක 05 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත ලෙස 2016.04.26 දින සම්මත කොට ගෙන ඇත.

**02. සමථ මණ්ඩල කොමිෂන් සභා (සංශෝධන) පනත.**

සමථකරණය සඳහා ආරවුලක් සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකි නිමිත්තේ වටිනාකම ලෙස පැවති රුපියල් දෙලක්ෂ පනස්දහස වෙනුවට එම වටිනාකම රුපියල් ලක්ෂ 5 දක්වා ඉහළ දැමීම සඳහා සමථ මණ්ඩල පනතට කරන ලද සංශෝධනය 2016 අංක 09 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත වශයෙන් 2016 ජූලි 08 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී.

**03. අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත් කෙටුම්පත.**

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 431 සිට 432 වගන්ති යටතේ නඩුවලට අදාළව නඩු භාණ්ඩ ලෙස අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන දේපළ බැහැර කිරීම සඳහා වූ ප්‍රතිපාදන යටතේ හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම මගින් බැහැර කිරීමේ දී මහේස්ත්‍රාත් විසින් ඒ සම්බන්ධයෙන් දැන්වීම් කළ දින සිට නඩු භාණ්ඩ සඳහා හිමිකම් පෑමේ කාලය ලෙස සඳහන් මාස 06ක කාල සීමාව මාස 02 දක්වා අඩු කිරීම සහ එම නඩු භාණ්ඩ සම්බන්ධව පුවත්පත්වල පල කළ යුතු දේපලෙහි වටිනාකම රු.2500 සිට රු.100,000 දක්වා වැඩි කිරීමට මෙම සංශෝධනය මගින් ප්‍රතිපාදන සලසයි. එය 2016.10.04 දින පාර්ලිමේන්තුවේ සම්මත විය.

**04. 1969 අංක 03 දරණ නීති කොමිෂන් සභා පනත සංශෝධනය.**

මෙම පනත යටතේ පිහිටුවා ඇති නීති කොමිෂන් සභාවේ ඒකකයක් වශයෙන් පත් කරනු ලබන සාමාජිකයින්ට අමතරව නිල බලයෙන් සාමාජිකයින් පත් කිරීම සඳහා මෙම සශෝධනයනයෙන් ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව අධිකරණ විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ ධූරයට අඩු නොවන ඔහුගේ නාමිකයකු, නීතිපතිවරයා විසින් නම් කරනු ලබන අතිරේක සොලිසිටර් ජනරාල්වරයකුගේ ධූරයට අඩු නොවන ධූරයක් දරනු ලබන නිලධරයකු සහ නීති කෙටුම්පත් සම්පාදකවරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයකුගේ ධූරයට අඩු නොවන ධූරයක් දරනු ලබන ඔහුගේ නාමිකයකු පත්

කිරීම සඳහා මෙම සංශෝධනය ඉඩකඩ සලසා ඇත. මෙකී පනත 2016.10.04 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගනනා ලදී.

### 5.1.1.2 යෝජිත සංශෝධන පනත් කෙටුම්පත්

**01. අපරාධ වරදක වගකීම් දැරීමේ අවම වයස් සීමාව ඉහළ නැංවීම**

**a. දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන පනත් කෙටුම්පත.**

මෙම යෝජිත සංශෝධනයෙන් වයස අවු.12 කට අඩු ළමයකු කරනු ලබන කිසිවක් වරදක් නොවන බවට ප්‍රතිපාදන සලසා ඇත. තව ද වයස අවු.12ට වැඩි සහ 14ට අඩු ළමයකු සම්බන්ධ වන විටෙක එම ළමයා විසින් සිදු කරන ලද දෝෂාරෝපිත අපරාධය සම්බන්ධයෙන් ප්‍රමාණවත් චේතනාවක් හෝ අවබෝධයක් දරා ගැනීමට හැකියාවක් ඇති විචාරණ මේරු බුද්ධියක් එම ළමයාට තිබේ ද යන්න තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට අභිමතය ප්‍රදානය කිරීමට ප්‍රතිපාදන සැලසේ. මෙම සංශෝධනය 2016.10.24 අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

**b. අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධන පනත් කෙටුම්පත.**

ඉහත සඳහන් දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන පනත් කෙටුම්පතට ආනුෂාංගික වශයෙන් මහේස්ත්‍රාත්වරයාට ළමයාට ප්‍රමාණවත් විචාරණ, මේරු බුද්ධියක් ඇති දැයි කියා තීරණය කිරීමට සහයෝගය දීමට වෛද්‍යවරයකු වෙත ළමයා යොමු කිරීම සඳහා ප්‍රතිපාදන සැලැස්වීම පිණිස මෙම සංශෝධනය ඉදිරිපත් වේ. මෙකී කෙටුම්පත කෙටුම්පත් කරමින් පවතී.

**02. ළමා ආරක්ෂාව පිළිබඳ පනත් කෙටුම්පත. (Child Protection Justice Bill)**

ශ්‍රී ලංකාව විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අපරානුමත කිරීමත් සමඟම ළමුන්ගේ රැකවරණය සහ ළමා අධිකරණ පද්ධතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩුවලට ඉක්මන් සහ දිගුකාලීන ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය උද්ගත වුණි. වර්තමානයේ මේ සම්බන්ධයෙන් 1939 අංක 48 දරන ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත අදාළ වේ. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස එම විෂයයට අදාළ අමාත්‍යාංශ, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ UNICEF සංවිධානය, පොලිසිය, අධිකරණ වෛද්‍ය නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන ආදී ප්‍රධාන පෙලේ සේවා සපයන්නන් සමඟ පවත්වන ලද සාකච්ඡාවන් පදනම් කර ගෙන ඉහත ආඥා පනතේ I, II, V සහ VI යන පරිච්ඡේද පරිච්ජින්න කිරීමටත් ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අඩංගු ප්‍රමිතීන් ඇතුළත් කර ජාත්‍යන්තරය පිළිගත් පනත් කෙටුම්පතක් සකස් කිරීමට කැබිනට් මණ්ඩලය 2015.02.18 දින අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව තවදුරටත් ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව අධිකරණමය ක්‍රියාවලියට ඇතුළත් වන ළමයකු සම්බන්ධයෙන් නීතිමය කටයුතු ඉටු කළ යුතු ආකාරය පිළිබඳ මෙම පනත් කෙටුම්පත මඟින් විධිවිධාන සලසයි. මේ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද නීති කෙටුම්පත නීතිපතිගේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය සඳහා ඉදිරිපත් කර ඇත.

**03. අසභ්‍ය ප්‍රකාශන පනත් කෙටුම්පත.**

අසභ්‍ය ප්‍රකාශනවලට අදාළ වර්තමාන නීතිය 1995 සහ 1883 පනත්වලින් සංශෝධිත 1927 අශ්ශීල ප්‍රකාශන ආඥා පනතේ ද අන්තර්ගත වේ. මෙම නීති ප්‍රඥප්ති දෙකෙහි අන්තර්ගත නෛතික විධිවිධාන වර්තමානයේ විශේෂයෙන්ම ළමුන් සම්බන්ධයෙන් පනතෙහි අපරාධ මැඩලීමට ප්‍රමාණවත් නොවේ. මෙම තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාව විශේෂයෙන්ම පරිගණක උපයෝගී කර ගෙන ළමුන්ට එරෙහිව සිදු කරන අපරාධ පිළිබඳව කටයුතු කිරීම පාදක කරගත් පනත් කෙටුම්පතක් නොමැති වීම සලකා බලා මෙකී පනත් කෙටුම්පත සම්පාදනය කිරීමට

කැබිනට් මණ්ඩල අනුමැතිය 2016.03.09 වන දින ලබා දෙන ලදී. ඒ අනුව පරිගණක අපරාධ පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු තාක්ෂණික නියෝජිතායතනය (ICTA) සහ ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය (CERT) සමඟ සාකච්ඡා කරමින් පවතී.

**04. <u>1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය</u>.**

2016.08.15 වන දින ගැසට් පත්‍රයේ පල කරන ලද යෝජිත පනත් කෙටුම්පත මඟින් සිරභාරයට ගනු ලැබූ තැනැත්තකුට නීතිඥවරයකුගේ සේවය සහ උපදෙස් ලබා ගැනීමට ඇති අයිතිය ඔවුන් මහේස්ත්‍රාත්වරයකු වෙත පමුණුවාලීමට පෙර ප්‍රකාශ සටහන් කිරීමෙන් ඉක්බිතිව ලබා දීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සුරක්ෂිත කිරීම අපේක්ෂා කරන ලදී. මේ වන විට මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තු සභානායක වෙත යොමු කිරීමෙන් අනතුරුව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික කමිටුව වෙත යොමු කරන ලදී. ඒ අනුව එකී ආංශික කමිටු රැස්වීමේ දී කෙටුම්පත සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට අධිකරණ අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දෙන ලදී. අධිකරණ අමාත්‍යවරයා විසින් එම ආංශික කමිටුවේ උපදෙස් මත පහත නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීමට නියමිතව ඇත.

1. සභාපති - ගරු නීතිපතිතුමා.
2. සාමාජික - නීති කෙටුම්පත් සම්පාදක.
3. සාමාජික - සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
4. සාමාජික - නියෝජ්‍ය පොලිස්පති (නීති).
5. සාමාජික - සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය.
6. සාමාජික - ලේකම්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය.
7. සාමාජික - උපදේශක, අධිකරණ අමාත්‍යාංශය.
8. කැඳවුම්කරු සහ සාමාජික - අතිරේක ලේකම් (නීති) අධිකරණ අමාත්‍යාංශය.

05. **<u>අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් වෙත සහාය හා ආරක්ෂාව සැලැස්වීමේ පනතට යෝජිත සංශෝධන.</u>**

2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය හා ආරක්ෂාව සැලැස්වීමේ පනතේ මූලික පරමාර්ථයක් වන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් වෙත සහාය හා ආරක්ෂාව සැලැස්වීම තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා 2016.07.05 වන දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව වෙනත් රටක සිටින සාක්ෂිකරුවකුට ශ්‍රී ලංකාවට නොපැමිණ අදාළ රටෙහි පිහිටි මෙරටට අයත් තානාපති කාර්යාලයක සිට නිසි ක්‍රමවේදයකට යටත්ව සහ සාක්ෂියෙහි නිරවද්‍ය බව ආරක්ෂාවන බව තහවුරු වෙමින් සාක්ෂි ලබා දීමේ හැකියාව ලබා දීමට මෙම සංශෝධනය මඟින් යෝජිතය. දැනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ලද මූලික කෙටුම්පත සාකච්ඡාවට භාජන වෙමින් පවතී.

**06. <u>මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත සඳහා සංශෝධන</u>.**

ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් 2016.10.08 වන දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුකූලව ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සංශෝධනය කිරීම සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් පත් කර ඇත. එකී අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් මෙම පනත සංශෝධනය කිරීම පිළිබඳව සලකා බලනු ඇත.

## 07. ඇටෝර්නි බලපත් (සංශෝධන) පනත් කෙටුම්පත.

ඉඩම් ආශ්‍රිත වංචා සිදුවීම්වල සිදු වී ඇති ප්‍රාමාණික වැඩිවීම් සැලකිල්ලට ගෙන එකී ගැටළුවලට පාදක වන මූලික පනතේ ඌනතා හඳුනාගෙන එකී ඌනතා මඟහැරවීමට ජීවමිතික අත්සන් භාවිතය සහ ඇටෝර්නි බලපත්‍රයක දීමනාකරුගේ සහ ලැබුම්කරුගේ ඡායාරූපයක් සැපයීමේ අවශ්‍යතාවයක් ඇතුළත් කිරීම ආදී වශයෙන් සංශෝධන මෙම කෙටුම්පතට ඇතුළත් කර ඇත. මෙම සංශෝධනයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අධිකරණ අමාත්‍යාංශය සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් එක්ව ඉදිරිපත් කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016 මැයි මස 31 දින ලබා ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකසන ලද මූලික කෙටුම්පත ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

## 08. පූර්ව නඩු විභාග කාර්යය පටිපාටිය සඳහා විධිවිධාන සැලසීම පිණිස සිවිල් නඩු විධාන සංග්‍රහයසංශෝධනය කිරීම.

නඩු කීමේ දී අත්විදීමට සිදුවන අධික ප්‍රමාදය, මහජනතාව විසින් අධිකරණ පද්ධතිය කෙරෙහි ගොඩනගාගෙන ඇති විශ්වාසය ගිලිහී යාම, එමඟින් මහජනතාවට මුහුණ දීමට සිදුවන දැඩි ආර්ථික දුෂ්කරතාවන් යන්න සැලකිල්ලට ගෙන නඩු විභාග වේගවත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසා දෙමින් පූර්ව නඩු විභාග කාර්යය පටිපාටිය හඳුන්වා දීම පිණිස සිවිල් නඩු විධාන සංග්‍රහයට සංශෝධනයක් සිදු කර ඇත.

එමඟින් නඩු විභාග කඩිනමින් අවසන් කිරීම සඳහා යම් නිශ්චිත ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම අරමුණු කොට ගෙන පූර්ව නඩු විභාග කාර්යය පටිපාටිය මඟින් පූර්ව නඩු විභාග විනිසුරුතුමන්ට කටයුතු කිරීමට විධිවිධාන සලසා ඇත. ඒ අනුව එම ක්‍රියාමාර්ගය සඳහා කරුණු සහ ලේඛනවලට පිළිගැනීමක් ලබා ගැනීම මඟින් අනවශ්‍ය ඔප්පු කිරීම් සහ ප්‍රමාදයන් වැලැක්වීමත්, විභාග වන නඩු දෙකක් හෝ කීපයක් ඒකාබද්ධ කිරීමත්, අදාළ නඩුව කඩිනමින් සහ අඩු වියදමින් විභාග කර අවසන් කිරීමට දායක වන වෙනත් යම් කවරම වූ හෝ කාරණාවක් අනුගමනය කිරීමත් සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඇතුළත් වේ.

ඊට අදාළ පනත් කෙටුම්පත ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභාව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ කෙටුම්පතට ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු, ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ නීතිපතිගේ සහතිකය ලබා ගෙන ඇත. එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

## 09. අපරාධ වැලැක්වීමේ ආඥා පනත සඳහා කරන සංශෝධනය.

1926 අංක 02 දරන අපරාධ වැලැක්වීමේ ආඥා පනත මඟින් අපරාධකරුවන් හඳුනා ගැනීම හා අධීක්ෂණය කිරීම සම්බන්ධ නීති සංශෝධනය කිරීමට සහ ඒකාබද්ධ කිරීමට මූලික වශයෙන් ද, අපරාධයකට චෝදනා ලබන තැනැත්තන්ගේ ඇඟිලි සලකුණු නඩු විභාගයට පෙර ලබා ගැනීම සඳහාත් විධිවිධාන ඇත.

කෙසේ වෙතත් 1926 අංක 02 දරන ආඥා පනත පැනවීමෙන් පසුකාලීනව ඇතැම් සාපරාධී ක්‍රියා නිගමනය සහ පාලනය කිරීම සඳහා විධිවිධාන සලසමින් නව නීති පාර්ලිමේන්තුව විසින් හඳුන්වා දී ඇති අතර එවැනි සාපරාධී ක්‍රියා /අපරාධ සිදු කරනු ලබන බවට චෝදනා ලබන තැනැත්තන්ගේ ඇඟිලි සලකුණු ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින අපරාධ වැලැක්වීමේ ආඥා පනත යටතේ විධිවිධාන සැලසීම යෝජිත සංශෝධන මඟින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව ඇඟිලි සලකුණු ලබා ගැනීමට අවශ්‍ය බවට ආඥා පනතේ 2 වන වගන්තියේ උපලේඛනයේ දැක්වෙන අපරාධ ලැයිස්තුව පුළුල් කිරීම ප්‍රධාන වශයෙනුත් 5 වන වගන්තියක් ඇතුළත් කිරීම මඟින් එහි I වන උප වගන්තිය යටතේ අපරාධ වරදකට වරදකරු කොට අත්හිටවූ සිර දඬුවමක් නියම කරන

ලද තැනැත්තෙකු දඬුවම ක්‍රියාත්මක වන කාලය අවසන් වන තුරු පොලිස් අධීක්ෂණය යටතේ තැබීමට අධිකරණයට නියෝග කිරීමේ බලය ලබා දීමට යෝජිත සංශෝධන මඟින් අපේක්ෂා කෙරේ. සංශෝධිත පනත් කෙටුම්පත ගරු නීතිපතිතුමන් වෙත නීති කෙටුම්පත් සම්පාදක විසින් 2016.09.30 වන දින නිරීක්ෂණ සහ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

**10.** <u>**බෙදුම් පනතට යෝජිත සංශෝධන**</u>.

පරවේණි නිලකාරයාට බෙදුම් නඩුවක් හෝ පංගුවට අයත් ඉඩමක් සම්බන්ධයෙන් නඩුකරයක් ගෙන ඒමට හැකි වන පරිදි බෙදුම් පනත සංශෝධනය කිරීම මෙමඟින් අරමුණු කරයි. මෙය විභාග වෙමින් පවතින සියලු නඩු ආවරණය වන ලෙස අතීතයට බලපාන පරිදි සංශෝධනය කිරීමට නියමිතය. ඒ අනුව සකස් කරන ලද සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති වෙත යොමු කර ඇති අතර මීට අදාළ වැඩිදුර සාකච්ඡා සිදු කරමින් පවතී.

**11.** <u>**අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු අවලංගු කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත**</u>.

අමාත්‍ය මණ්ඩලය විසින් 2015.11.11 වන දින ලබා දෙන ලද අනුමැතිය ප්‍රකාරව ''අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු'' නිසි බලය ඇති අධිකරණයක් විසින් කරන නියෝගයක් මත පමණක් අවලංගු කිරීම සඳහා විධිවිධාන මූලික වශයෙන් සලසන ලද මෙම සංශෝධනය උදෙසා කෙටුම්පතක් සකසන ලද අතර 2016.09.09 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව 2016.10.04 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත බලවත් අකෘතඥතාවය මත අවලංගු කළ හැකි තෑගි ඔප්පු නිසි අධිකරණයක නියමය මඟින් පමණක් අවලංගු කළ හැකි බවට ප්‍රතිපාදන සලස්වා ඇත.

පසුව සිදු කරන ලද සංශෝධනයට අදාළ ව මෙම පනත් කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා නීතිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

**12.** <u>**භාර ආඥාපනත**</u>.

1917 අංක 09 දරන භාර ආඥා පනතේ ප්‍රතිපාදන මඟින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවධානම අවම කිරීම පිණිස මෙම පනතේ විෂය පථය පුළුල් කොට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය ආසියා ශාන්තිකර කණ්ඩායම විසින් පවත්වන ලද ඇගයීම් මඟින් සහ මූල්‍ය බුද්ධි ඒකකය මඟින් පෙන්වා දී ඇත. එම කරුණු සලකා බලා ඉදිරියේ දී භාර ආඥා පනත සංශෝධනය කිරීමට මෙම අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද සංදේශයට 2016.03.30 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද කෙටුම්පත සම්බන්ධයෙන් අදාළ අංශ සමඟ සාකච්ඡා කරමින් පවතී.

**13.** <u>**ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත**</u>.

2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කෙටුම්පත කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ අභ්‍යන්තර යුද්ධය හේතුවෙන් දිවයිනේ උතුරු පළාතෙන් පලා යාමට බල කිරීම හේතුවෙන් ස්වකීය ගම්බිම් සහ දේපළ අතහැර දමා දිවයිනේ සෙසු ප්‍රදේශවල තාවකාලික වාසස්ථාන සහ නවාතැන්වල ලැගුම් ගන්නා ලද අවතැන් වූ තැනැත්තන්ගේ ඡන්ද ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දීමට කටයුතු කර ඇත. මෙම පනත ගෙන එන ලද්දේ වසර දෙකක කාලයකටය.

එම 2013 අංක 27 දරන පනත වර්ෂ 2015 ජුනි මස සිට බල රහිතව ඇති බැවින් එම පනත යටතේ ලබා දෙන ලද ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන නොමැත යන කරුණ සැලකිල්ලට ගැනීමත් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් යෝජිත කෙටුම්පත සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව සකස් කරන ලද යෝජිත පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2016.10.04 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පනත් කෙටුම්පතේ අඩංගු විධිවිධාන තවදුරටත් පරීක්ෂා කිරීම සහ නිර්දේශ ලබා දීම සඳහා පහත නම් සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් පත් කිරීමට කටයුතු කරන ලදී.

1. ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා. (ජ.නී.)
2. ගරු රවුෆ් හකීම් මැතිතුමා - නගර සැලසුම් සහ ජල සම්පාදක අමාත්‍ය.
3. ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

ඒ අනුව යෝජිත පනත් කෙටුම්පත සඳහා නිර්දේශ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවෙන් ලබා දීමට නියමිතය.

**14. <u>නොතාරිස් ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත.</u>**

ව්‍යාජ ලෙස ලේඛන ලියා සහතික කිරීම, ව්‍යාජ ලේඛන මත ඉඩම් විකිණීම වැනි වංචා සහගත ඉඩම් ගනුදෙනු බහුල ලෙස පැවතීම හේතුවෙන් එම කටයුතු අවම කිරීම සඳහා නොතාරිස් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඔප්පුවට අත්සන් තබන අවස්ථාවේ දී ජීවමිතික අත්සන් උපයෝගී කර ගැනීම සඳහාත් වංචා වැලැක්වීම සඳහාත් ප්‍රතිපාදන අන්තර්ගත කරමින් සකස් කරන ලද පනත් කෙටුම්පත ව්‍යවස්ථාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් අනුමත කිරීමෙන් පසු ඉදිරි පියවර සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

**15. <u>සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත</u>.**

2002 වසරේ දී සම්මත කරන ලද 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතට අදාළව ආසියා ශාන්තිකර කණ්ඩායමේ, එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියේ නිර්දේශ සහ බුඩාපෙස්ට් සම්මුතියට අදාළ ජාත්‍යන්තර බැඳීම් සැලකිල්ලට ගෙන මෙම පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමින් සංදේශයක් ඉදිරිපත් කිරීමට යෝජිතය.

## 5.1.2 ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම.

### 5.1.2.3 <u>බන්ධනාගාරවල තදබදය වැළැක්වීම පිණිස පිහිටුවන ලද කාර්යය සාධන බලකාය</u>

බන්ධනාගාර තදබදයට බලපානු ලබන නීතිමය හා අධිකරණ කාරණා සොයා බැලීම සඳහා කාර්යය සාධන බලකාය ස්ථාපිත කළ අතර, ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම් හා හින්දු කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ සම සභාපතිත්වයෙන් මෙහෙය වනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂම, නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, විනිශ්චයකරුවන් පුහුණු කිරීමේ ආයතනය, නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ අමාත්‍යාංශයේ නියෝජනය ද සමඟ මෙම බලකාය කටයුතු කරනු ලබයි.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් මෙම කාර්යය සාධන බලකාය වෙත පහසුකම් සැපයීම සිදු කරන අතර, බන්ධනාගාර පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට නිර්දේශිත ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ මඟ පෙන්වනු ලබයි. මෙහි දී බන්ධනාගාර තදබදය අඩු කිරීම හා ප්‍රතිසංස්කරණය ද ඇතුළුව බන්ධනාගාර ආශ්‍රිත අංශ සංවර්ධනය කිරීමට සුදුසු සැලැස්මක් සකස් කිරීම කාර්යය සාධන

බලකායේ විෂය ක්ෂේත්‍රයෙහි දක්වා ඇති අරමුණු ළඟා කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම මෙහි මූලික අරමුණු වේ.

ඒ අනුව කාර්යය සාධන බලකායේ විධිවිධානයන්ට අනුව බන්ධනාගාර තදබදය අවම කර ගැනීම සඳහා මාර්ගෝපදේශනයන් හා සංශෝධන යෝජනා කිරීමට බලාපොරොත්තු වේ.

### 5.1.2.4 විදේශයන්හි දී ලියවිලි හා සිතාසි භාර දීම සම්බන්ධ කටයුතු

2000 අංක 39 දරන සිවිල් හා වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනත සහ 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනත යන පනත් මඟින් සපයා ඇති ප්‍රතිපාදන යටතේ 2016 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලයට අදාළව ශ්‍රී ලංකාවේ උසාවිවලින් නිකුත් කරන ලද සිතාසි 257ක් පහත දක්වා ඇති පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විවිධ උසාවිවලට භාර දී ඇත.

| රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව | රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 15 | මලයාසියාව | 06 |
| බහරේන් | 04 | මාලදිවයින | - |
| බංගලිදේශය | 02 | මෝල්ටාව | - |
| කැනඩාව | 10 | මුරිසිය | - |
| චීනය | - | නෙදර්ලන්තය | 01 |
| සයිප්‍රස් | 05 | නවසීලන්තය | 02 |
| ඩෙන්මාර්ක් | 02 | නෝර්වේ | 01 |
| දෝහා කටාර් | 12 | ඕමානය | 03 |
| පින්ලන්තය | - | පකිස්ථානය | - |
| ප්‍රංශය | 05 | පිලිපීනය | 01 |
| ජර්මනිය | 02 | රුසියාව | 03 |
| ඉන්දියාව | 12 | සීෂෙල්ස් | - |
| ඉන්දුනීසියාව | - | සිංගප්පූරුව | 01 |
| අයර්ලන්තය | - | ස්පාඤ්ඤය | - |
| ඊශ්‍රායලය | 04 | ස්වීඩනය | 01 |
| ඉතාලිය | 37 | ස්විස්ටර්ලන්තය | 02 |
| ජපානය | 09 | එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 10 |
| ජෝර්දානය | 08 | එක්සත් රාජධානිය | 48 |
| කොරියාව | 05 | ඇමරිකා එක්සත් ජනපදය | 11 |
| සවුදි අරාබිය | 12 | වියට්නාමය | 02 |
| කුවේට්ය | 12 | ලෙබනනය | 02 |
| බෙල්ජියම | 02 | චෙකොස්ලොවැකියාව | 02 |
| ග්‍රීසිය | 01 | ලක්ෂම්බර්ග් | 02 |
| එකතුව | | | 257 |

තව ද 2000 අංක 39 දරන සිවිල් හා වාණිජ කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය ලබා දීමේ පනත යටතේ ලියවිලි භාර දීමට අදාළ ඉල්ලීම් 48ක් විදේශ රටවලින් මෙරටට ලැබී ඇත. 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය ලබා දීමේ පනත යටතේ විදේශ රටවලින් මෙරටට ලැබුණු ඉල්ලීම් ප්‍රමාණය 41ක් වන අතර විශේෂ විමර්ශන කටයුතු සඳහා ඉල්ලීම් 63ක් ශ්‍රී ලංකාව විසින් විවිධ රටවල් වෙත යොමු කර ඇත.

### 5.1.2.5 **අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහය දැක්වීමේ ගිවිසුම්**

අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර කිරීමේ අරමුණින් චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, ඉන්දියාව, තායිලන්තය, බෙලාරුස්, පකිස්ථානය, රුසියාව යන රටවල් සමඟ ශ්‍රී ලංකා ජනරජය ගිවිසුම්වලට එළඹ ඇත. විමර්ශනය, චෝදනා ඉදිරිපත් කිරීම, නඩු විභාග කිරීම සහ එහි ප්‍රතිඵලය ලෙස ඇති වන නීති කෘත්‍යයන් ඇතුළු සාපරාධී කාරණාවලදී එක් එක් පාර්ශවය වෙත අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව ලබා දීමේ අපේක්ෂාවෙන් චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, ඉන්දියාව, තායිලන්තය, බෙලාරුස්, පකිස්ථානය, රුසියාව යන රටවල් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මෙම අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇත. ශ්‍රී ලංකාව මෙන්ම එම රාජ්‍යයන්ට ද ප්‍රතිලාභ අත්කර දෙන ආකාරයෙන් සහ මෙම රාජ්‍යයන්වල නීති සහ රාජ්‍යයන් දෙක විසින් පිළිගෙන ඇති හෝ අත්සන් කර ඇති ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූල වන ආකාරයෙන්, දෙරටෙහි නීති පද්ධතිය, ආයතන සහ ව්‍යවස්ථා සංවර්ධනය කිරීම ආශ්‍රිතව පවත්නා ගැටළු සම්බන්ධයෙන් නෛතික රාමුවක ස්වරූපයක් ගන්නා සහයෝගීතාවක් ඇති කිරීමට ක්‍රියා කිරීම ශ්‍රී ලංකාව සහ ඒ ඒ රාජ්‍ය අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුම් මඟින් අපේක්ෂා කරයි.

යුක්රේනය සහ ශ්‍රී ලංකාව අතර මෙවැනිම අවබෝධතා ගිවිසුමක් 2016.06.25 වන දින අත්සන් කර ඇත.

තව ද 2015.05.28 වන දින රුසියාව සමඟ එළඹි ගිවිසුමට අදාළ ව 2002 අංක 25 දරන පනතේ දෙවන වගන්තිය යටතේ නිකුත් කරන ලද අංක 1926/46 සහ 2015.08.06 දිනැති නියමය 2016.07.08 දින පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා ලදී.

### 5.1.2.6 **මරණ දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් ලෙස ලිහිල් කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීමට ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කළ කමිටුව**

2013.09.26 දින වන විට සියළු නඩු හා අභියාචන අවසන්ව මරණ දඬුවම ලබා දී ඇති සිරකරුවන් සම්බන්ධයෙන් සලකා බලා ඔවුන් වෙත පනවා ඇති මරණීය දණ්ඩනය ජීවිතාන්ත සිරදඬුවම් බවට පත් කිරීම මෙම කමිටුව මඟින් සිදුවේ.

අතිගරු ජනාධිපතිතුමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව මඟින් පවරා ඇති බලතල මත මරණ දඬුවම නියමව සිටි සිරකරුවන්ට පහත පරිදි වාර 03කදී ජීවිත සමාව ලබා දී ඇත.

| දිනය | සිරකරුවන් ගණන |
|---|---|
| 2015.12.11 | 34 |
| 2016.04.20 | 83 |
| 2016.05.20 | 70 |
| එකතුව | 187 |

### 5.1.2.7 **2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැර ගෙන යාම පිළිබඳ පනත.**

2001 අංක 10 දරන පනත යටතේ, ළමා අපහරණය පිළිබඳ අයදුම්පත් 5ක් අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබී ඇත. ඒ අතුරින් එක් සිද්ධියකට අදාළව මව්පිය දෙපාර්ශ්වයේ එකඟත්වය මත දරුවා සුපුරුදු වාසස්ථානය වෙත රැගෙන යන ලදී. අනෙකුත් සිද්ධීන්ට අදාළව නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තව ද මීට පෙර වර්ෂවල යොමු කරන ලද අයදුම්පත්

දෙකකට අදාළව ජපානයෙන් රැගෙන එන ලද දරුවෙක් සහ ඕස්ට්‍රේලියාවේ සිට රැගෙන ආ දරුවන් දෙදෙනකු නඩු පැවරීමෙන් තොරව නැවත එම රටවලට යැවීමට හැකි විය.

### 5.1.2.8 <u>වරදකරුවන් හුවමාරු කිරීම.</u>

ශ්‍රී ලංකාව තුළදී වරදක් කර වැරදිකරුවෙකු බවට පත් වූ වෙනත් රටක පුරවැසියකු එරටට භාර දීම සහ වෙනත් රටකදී වරදකරුවකු වූ ශ්‍රී ලාංකික පුරවැසියකු ශ්‍රී ලංකාවට භාර දීම සම්බන්ධයෙන් 1995 අංක 05 දරන මෙම පනත මඟින් ක්‍රියාත්මක වේ. ඒ අනුව ඉන්දීය ජාතික වරදකරුවන් 23 දෙනෙකු, පකිස්ථානු ජාතික වරදකරුවන් 50 දෙනෙකු සහ මාලදිවයින් වරදකරුවෙකු එම රටවලට භාර දී ඇත. මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික සිරකරුවන් 10 දෙනෙකු ලංකාවට ගෙන එන ලද අතර ඔවුන් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගත කර ඇත. බ්‍රිතාන්‍ය සිර දඬුවම් විඳි ශ්‍රී ලාංකික සිරකරුවන් දෙදෙනෙකු ද ලංකාවේ බන්ධනාගාර තුළ ඉතිරි දඬුවම් කාලය ගෙවීම පිණිස රැගෙන එන ලදී. ශ්‍රී ලංකාවේ දී දඬුවමට ලක් වූ ඉන්දියානු ජාතිකයන් තුන්දෙනෙකු ද නැවත ඉන්දියාවේ දී දඬුවම් කාලය ගෙවීම සඳහා එම රටට යැවීමට අධිකරණ අමාත්‍යතුමන්ගේ අනුමැතිය ලැබී ඇත.

### 5.1.2.9 <u>මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය</u>

2010 වර්ෂයේදී, අධිකරණ අමාත්‍යාංශය විසින් මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාව තුළ මිනිස් ජාවාරමට එරෙහිව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම පිණිස මෙම කාර්ය සාධක බලකාය ජාතික සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි. නඩු පැවරීම වේගවත් කිරීමත් සහ වින්දිතයන්ගේ ආරක්ෂාව දැඩි කිරීමත් පිණිස රජයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය, සවිබල ගැන්වීම මෙම ජාතික කාර්ය සාධක බලකායේ අරමුණයි. රට තුළ සිදුවන මිනිස් ජාවාරම්වලට විසඳුම් සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන වශයෙන් හඳුනා ගන්නා ලද සියළුම රාජ්‍ය ආයතනයන්හි නියෝජිතවරුන්ගෙන් මෙම ජාතික කාර්ය සාධක බලකාය සමන්විත වේ.

මිනිස් ජාවාරමට ගොදුරු වූ වින්දිතයින් හඳුනාගැනීම, උපදෙස් සඳහා යොමු කිරීම සහ ඔවුන්ගේ ආරක්ෂාව නංවාලීම සහ වැඩි ආරක්ෂාව නංවාලීම සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි, කාර්ය සාධක බලකාය විසින් වැඩි දියුණු කරන ලදී. එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, 2015 මාර්තු මාසයේදී ක්‍රියාත්මක කරන ලදී.

කාර්ය සාධක බලකාය විසින් මිනිස් ජාවාරම පිළිබඳව මහජනතාව සහ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී සාමාජික ආයතනය අධීක්ෂණයට ලක් කරයි. තවද ශ්‍රී ලංකා පොලිසිය සඳහා ශක්‍යතා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි කාර්ය සාධක බලකායේ විශේෂ අවධානය යොමු වී ඇත. මිනිස් ජාවාරම සම්බන්ධ නඩු කඩිනම් කිරීම, ඒ සඳහා විශේෂ පොලිස් ඒකකයක් පිහිටුවීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් කිරීම ආදී අංශ ගණනාවක් ඔස්සේ කාර්ය සාධක බලකාය කටයුතු කරමින් සිටී.

### 5.1.2.10 <u>11thSenior Officials Meeting of the Bali Process Ad hoc group.</u>

බාලි ප්‍රොසෙස්හි 11 වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සමුළුව 2016.11.15 සහ 16 යන දෙදින ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමට මෙම අමාත්‍යාංශය කටයුතු කර ගෙන යනු ලැබේ. බාලි ප්‍රොසෙස් ආරම්භක සාමාජිකයකු වශයෙන් ශ්‍රී ලංකාව මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරමට එරෙහිව ගන්නා ලද පියවරක් වශයෙන් ද ඒ සඳහා අන්තර්ජාතික සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ අරමුණින් මෙම සමුළුව පැවැත්වෙනු ඇත.

### 5.1.2.11 **Eighth session of the Conference of Parties to the UNTOC**

ඕස්ට්‍රියාවේ වියානා නුවර 2016.10.17 දින සිට 2016.10.21 දක්වා පවත්වන එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ පිළිබඳ සමුළුවට සමගාමීව පාර්ශ්වීය වැඩසටහනක් වශයෙන් අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ මැඩලීම සඳහා අන්තර්ජාතික සහයෝගීතාව (International Cooperation on Combating Translational Organized Crime) යන මාතෘකාව යටතේ වැඩසටහනක් පැවැත්වීමට යෝජිතය. මෙමඟින් අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ මැඩලීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර අන්තර්ජාතික සහයෝගීතාව ලබා ගැනීම ආදී පුළුල් ක්ෂේත්‍රයක් මෙමඟින් ආවරණය කිරීමට බලාපොරොත්තු වේ. නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ඇතුළුව, පොලීසිය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මීට සහභාගී වනු ඇත.

## 5.1.3 අනෙකුත් කටයුතු

### 5.1.3.1 සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධන අධිකරණ අමාත්‍යතුමන් විසින් පත්කරන ලද කමිටුව.

සිවිල් නඩු විධාන සංග්‍රහය සලකා බලා කාලානුරූපීව අන්තර්ජාතික නීති ප්‍රමිතිවලට අනුකූල වන ලෙස එයට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන ලෙස දන්වා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු ප්‍රියසාත් ඩෙප් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. මෙම කමිටුව සිවිල් ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ වෘත්තීය නීතඥයන්ගෙන් සැදුම්ලත් කමිටුවකි. කමිටු වාර්තා ඉදිරි කාලය තුළ දී ලබා දීමට අපේක්ෂා කරයි.

### 5.1.3.2 අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සහ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන සඳහා අධිකරණ අමාත්‍යතුමන් විසින් පත් කරන ලද කමිටුව.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත හා දණ්ඩ නීති සංග්‍රහයට කාලානුරූපීව සහ අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුකූල වන ලෙස අවශ්‍ය සංශෝධන නිර්දේශ කරන ලෙස දන්වා ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු බුවනෙක අළුවිහාරේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත. එය අධිකරණ අමාත්‍යාංශ නිලධාරීන්, අපරාධ නීති ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

### 5.1.3.3 ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන යෝජිත ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති වාර්තා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ගරු අධිකරණ අමාත්‍යතුමාගේ සභාපතීත්වය යටතේ ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පත් කරන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව යටතේ නිලධාරීන්ගේ කමිටුවක් පත් කරන ලද අතර එම නිලධාරී කමිටුව විසින් ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳව අධ්‍යයනය කොට සිය නිර්දේශ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත වාර්තා කරනු ලැබේ. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කැඳවුම්කරු වන අතර ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් නිලධාරී මට්ටමෙන් විශ්ලේෂණ සහ නිර්දේශ සිදුකරනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයේ දී ය. බොහෝ විට මෙම නිර්දේශ ව්‍යවස්ථා කෙටුම්පතක් ආකාරයෙන් ක්‍රියාත්මක කෙරේ.

අනතුරුව, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් නිලධාරීන්ගේ කමිටුවේ නිර්දේශ කියවා බලා අනුකාරක සභාවේ නිර්දේශ සටහන් කරනු ලබයි. අධිකරණ අමාත්‍යාංශය විසින් මෙම නිර්දේශ සංග්‍රහ කොට අවශ්‍ය කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශය වෙත යවනු ලැබේ. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත ඉදිරිපත් කෙරෙන සියලු පනත් කෙටුම්පත් සහ ප්‍රතිපත්ති වාර්තා සකස් කර නිර්දේශ කඩිනමින් යැවීමට කටයුතු කර ඇත.

### 5.1.3.4 <u>නීති පර්යේෂණ ඒකකයක් පිහිටුවීම.</u>

දීර්ඝ කාලයක් මුළුල්ලේ නීති ක්ෂේත්‍රයේ පැවති නීති පර්යේෂණවල අඩුපාඩු හේතුවෙන් නීති සම්පාදනයෙහිලා අවශ්‍ය තොරතුරු ලබාගැනීම ප්‍රමාණවත් නොවීම රටේ නීති ක්ෂේත්‍රයේ ප්‍රගමනයට යම් ගැටළුදායක තත්ත්වයක් මතුවිය හැකි බැවින් ප්‍රජාවට බලපානු ලබන නීති ගැටළු හඳුනාගෙන යුක්තිය පසිඳලීමේ කාර්යෙහිලා වඩාත් වැදගත් වන නීති තොරතුරු ක්ෂේත්‍රයන් හඳුනාගෙන නීති පර්යේෂණ කටයුතු දියුණු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය සමඟ ඒකාබද්ධව නීති පර්යේෂණ ඒකකයක් පිහිටුවීමට 2016 අයවැය යෝජනා යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් කටයුතු ආරම්භ කර ඇත.

### 5.1.3.5 <u>ශ්‍රී ලංකා නීති වාර්තා පල කිරීම</u>

ශ්‍රී ලංකා නීති වාර්තා පලකිරීම නීති අංශය මඟින් සිදු කරයි. ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් ලබාදුන් ඉතා වැදගත් නඩු තීන්දු ඇතුළත් කරමින් සෑම වසරකම වෙළුම් දෙකක් මුද්‍රණය කරනු ලබයි. 2016 වසර තුළ දී 2012 -1 වෙළුම, 2013- 1 වෙළුම සම්පූර්ණ කර ඇත. 2014 ශ්‍රී ලංකා නීති වාර්තා 1 වෙළුම මුද්‍රණය ආරම්භ කර ඇත.

### 5.1.3.6 <u>ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම.</u>

මෙම මධ්‍යස්ථානය මගින් වාණිජ ආරවුල් විසඳීම සඳහා ජාතික සහ අන්තර්ජාතික සමාගම් වෙත අවස්ථා උදා කරනු ඇත. ශ්‍රී ලංකාව, මෙම කලාපයේ පිහිටි ජාත්‍යාන්තර බේරුම්කරණ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම රජයේ අපේක්ෂාවයි. ලෝක වෙළඳ මධ්‍යස්ථානය ව්‍යාපාරික කේන්ද්‍රස්ථානයක් මධ්‍යයේ පිහිටා තිබීමත්, තරු පන්තියේ හෝටල සහ ආපනශාලා මෙන්ම සංචාරක ආකර්ශනීය ස්ථානවලට ඉතා සමීප වීමත්, ජාත්‍යන්තර බේරුම්කරණය සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම්වලට ආසන්න වීමත් නිසා මෙම බේරුම්කරණ මධ්‍යස්ථානය ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වන මහලේ ස්ථාපිත කර ඇත.

මෙම මධ්‍යස්ථානය 2015 මාර්තු මාසයේ විවෘත කරන ලදී. මෙය පවත්වාගෙන යාම සඳහා සමාගමක් ස්ථාපිත කර ගැනීම පිණිස අවශ්‍ය පියවර ගෙන ඇත. සමාගමේ සංගමික ව්‍යවස්ථාවලිය අවසන් වශයෙන් සකස් කර බේරුම්කරණ කටයුතු සහ බේරුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, බේරුම්කරුවන් පුහුණු කිරීම වැනි බේරුම්කරණය ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා ද බේරුම්කරණ මධ්‍යස්ථානය මේ වන විට විවෘතව ඇත. මධ්‍යස්ථානයේ ව්‍යවස්ථාවලිය අනුමැතිය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර ඇත.

### 5.1.3.7 <u>වාණිජ සමථ මණ්ඩලය පිහිටුවීම</u>

වාණිජ ආරවුල් විසඳීම හා බේරුම් කිරීම හා සමථ කිරීම හා සමඟි කිරීම පුළුල් ලෙස පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පාර්ශ්වයන් දිරි ගැන්වීම ඇතුළුව සමථකරණයෙන් වාණිජ ආරවුල් විසඳීම අරමුණු කර ගනිමින් 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ මධ්‍යස්ථාන පනත (2005 අංක 37 දරන පනතින් සංශෝධිත) ක්‍රියාත්මක වේ. ඒ අනුව මෙම පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය 2016 අගෝස්තු මස 08 වන දින සහ අංක 1979/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පිහිටු වීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින අතර, පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය වෙනුවෙන් පිහිටුවනු ලබන කළමනාකරණ මණ්ඩලය පත් කිරීම සඳහා කටයුතු කර ඇත.

### 5.1.3.8 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ අමාත්‍යාංශය වෙත ලැබී ඇති අරමුදලින් මත්ද්‍රව්‍ය වැටලීම්වලදී විමර්ෂකයාගේ කාර්යභාරය පිළිබඳව පොලිස් නිලධාරීන්, රේගු නිලධාරීන්, හා ආගමන විගමන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2016.04.26 වන දිනද, ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය හා මත්ද්‍රව්‍ය නිවාරණ මාසය වෙනුවෙන් අමාත්‍යාංශය යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තු හා ආයතන සහභාගී කරවා ගනිමින් 2016.06.21 දින ද වැඩමුළුවක් පවත්වන ලදී. මේ සඳහා ජනාධිපති මත්ද්‍රව්‍ය වැඩසටහනේ නිලධාරීන් දෙදෙනෙකු සම්පත්දායකයින් වශයෙන් කටයුතු කරන ලදී.

2016 නොවැම්බර් මස අග වන විට ශ්‍රී ලංකා පොලිසිය, රේගු නිලධාරීන් ඇතුළු මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන යටතේ වන නිලධාරීන් 145 දෙනෙකුගේ සහභාගීත්වයෙන් තවත් එක් දින වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

## 5.1.4 අධිකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

### 5.1.4.1 CSI.ROL/USAID ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීම පහසු කිරීම සඳහා 2016.05.26 වන දින දී අධිකරණ අමාත්‍යාංශය සහ එක්සත් ජනපදයේ අන්තර්ජාතික සංවර්ධන වැඩ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති නියෝජිත ආයතන අතර, එකඟතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

එකී එකඟතා ගිවිසුම යටතේ දෙපාර්ශ්වය විසින් පහත කරුණු ව්‍යාපෘතියේ මූලික අරමුණු ලෙස හඳුනාගන්නා ලදී.

1. ශ්‍රී ලංකාවේ නඩු විසඳීමේ දී සිදු වන ප්‍රමාදයන් වැළැක්වීම සඳහා නඩු කටයුතු කළමනාකරණ ඇගයීම් වාර්තාවක් නඩු කළමනාකරණ සහ නව ස්වයංක්‍රීය ක්‍රමවේදයක් සැලසුම් කිරීමට අවශ්‍ය නිර්දේශ ඇතුළත් කොට අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දීම.
2. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ සේවයේ යෙදෙන ලඝු ලේඛකවරුන් සඳහා නව පුහුණුවීම් වැඩිදියුණු කිරීමට අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතන යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට සහයෝගය සහ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
3. අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය මඟින් ලබා දෙන අධිකරණ නොවන පුහුණු වැඩසටහන් දීර්ඝ කිරීමට සහය ලබා දීම.
4. පවත්නා අධිකරණ නොවන පුහුණු පාඨමාලාව පිළිබඳ ඇගයීම් වාර්තාවක් ලබා දීම.
5. නීති ජාලය සහ අධිකරණ අමාත්‍යාංශ වෙබ් අඩවි නිර්මාණය සහ වැඩි දියුණු කිරීමට සහයෝගය ලබා දීම.

ඒ අනුව පහත ක්‍රියාකාරකම් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කර ඇත.

1. නෛතික කටයුතුවලට අදාළ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පුහුණු පාඨමාලාවක් අධිකරණ ලඝු ලේඛිකාවන් 50 දෙනෙකුට ලබා දීම.
2. ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනයෙහි සම්පත් දායකයන්ගේ සහභාගීත්වයෙන් අධිකරණ ලඝු ලේඛිකාවන් 50 දෙනෙකුට පරිගණක හා තොරතුරු තාක්ෂණ පාඨමාලා සැලසුම් කිරීම.
3. යාපනය ඇතුළු උතුරු පළාතේ අධිකරණයන්හි සේවය කරන අධිකරණමය නොවන නිලධාරීන් 50 දෙනෙකුට සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කිරීම.

4. යාපනය මහාධිකරණයේ අධිකරණමය නොවන නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

### 5.1.4.2 නීතිය බලාත්මක කිරීම, යුක්තියට ප්‍රවේශ වීම ශක්තිමත් කිරීම සහ සමාජ ඒකාබද්ධතා වැඩසටහන. (SELAJSI/UNDP)

**a. නීතිපති දෙපාර්තමේන්තුව තුළ ගොඩනැගී ඇති නඩු කටයුතු කඩිනම් කිරීම.**

නීතිපති දෙපාර්තමේන්තුවේ ගොඩ ගැසී ඇති නඩු ප්‍රමාණය අවසන් කර ගැනීමට සහය වීමක් වශයෙන් මත්ද්‍රව්‍ය සහ ළමා අපචාර නඩු සඳහා සහාය වීමට නීතිඥවරු 8 දෙනකු වෙනුවෙන් ව්‍යාපෘතිය ප්‍රතිපාදන ලබා දෙන ලදී. මේ මඟින් විශාල නඩු ප්‍රමාණයක් අවසන් කර ඇති අතර, ඉක්මනින් නඩුව හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ද හඳුන්වා දී ඇත.

**b. නීති ආධාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

නීති ආධාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාකාරී සැලැස්මක් ලෙස සකස් කොට එය අදාළ අංශ වෙත ඉදිරිපත් කොට ඔවුන්ගේ ද නිරීක්ෂණ සහිත ව විධිමත් සැලැස්මක් ලෙස සකස් කරන ලද අතර, ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය 2016.03.31 වන දින ලබා දෙන ලදී.

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සම්බන්ධ ආයතන තුළ එම කටයුතු නිසි ක්‍රමවේදයකට අනුව කළමනාකරණය කර ගැනීම සඳහා ඇති අභියෝග හඳුනාගැනීමට අධ්‍යයනයක් මේ මඟින් සිදු කරන ලදී. මෙම අධ්‍යයන වාර්තාව 2016 අගෝස්තු 8 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද සාකච්ඡාවේ දී ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත සහ ගරු නීතිපතිතුමා වෙත පිළිගන්වනු ලැබීය.

**c. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය සඳහා සහාය ලබා දීම.**

ඉහත අධිකාරිය මඟින් කරන ලද ඉල්ලීමකට අනුව එම අධිකාරියේ පරිපාලන කටයුතු විධිමත් කර ගැනීම සඳහා කළමනාකාර උපදේශකරවයකුගේ සහය ලබා ගැනීමට ව්‍යාපෘතිය මූල්‍ය දායකත්වය ලබා දී ඇත. මීට අමතරව පොලිස් නිලධාරීන් 200 දෙනෙකුට 2016.11.03 සහ 04 යන දිනයන්හි පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට සංවිධානය කර ඇත.

**d. සිරකරුවන් සඳහා නීති ආධාර ලබා දීම පිළිබඳ විධිමත් පියවර ගැනීම.**

මෙම ව්‍යාපෘතිය මඟින් පල්ලේකැලේ සහ වීරවිල එළිමහන් සිරකඳවුරුවල දී ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධව නෛතික සම්බන්ධයන් පිළිබඳ ව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමට සහයෝගය ලබා දෙන ලදී. නීති ආධාර කොමිෂන් සභාවේ, නීතිඥ සංගමයේ සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන අනෙකුත් පුද්ගලයන්ගේ සහභාගිත්වයෙන් තෝරාගත් නීති මාතෘකා පිළිබඳව රූපවාහිනී සහ ගුවන් විදුලි සාකච්ඡා මාලාවක් පැවැත්වීම සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

**e. ප්‍රධාන නීති ප්‍රඥප්ති සහ පනත් ඒකාබද්ධ කිරීම සහ පරිවර්තනය කිරීම.**

ඒකාබද්ධකළ දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, සාක්ෂි ආඥා පනත සහ අධිකරණ සංවිධාන පනත (භාෂා තුනෙන්ම) මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලයට යොමු කර ඇත. මේ අවස්ථාවේ දී සිවිල් නඩු විධාන සංග්‍රහය ඒකාබද්ධව කරමින් පවතී.

**f. ශ්‍රී ලංකාවේ පවතින දණ්ඩ නීති ක්‍රම පිළිබඳ විස්තීර්ණ අධ්‍යයනය.**

නඩු කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් 8ක ඇති මහාධිකරණවල සහ අභියාචනාධිකරණ සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනයේ තීරණ, අදාළ ප්‍රවනතාවන් සහ පරිචයන් හඳුනා ගැනීම පිණිස ප්‍රමාණාත්මක සහ ගුණාත්මක කෝණයෙන් වර්ග කර විශ්ලේෂණය කරමින් පවතී. දණ්ඩන සමරූපතාවක් අවශ්‍යතාවය ඉදිරිපත් කිරීමේ අදහසින් යුතු ව සමහර දණ්ඩන පරිචයන්වල සුදුසුභාවය මෙම අධ්‍යයනය මඟින් සලකා බලනු ඇත.

### 5.1.4.3 යුනිසෙෆ් සහයෝගිතා ළමා ආරක්ෂාව සහ යුක්තිය පිළිබඳ වැඩසටහන

a. WCD පොලිස් නිළධාරින් පුහුණු කිරීමට පොලිස් විෂය මාලාවක් මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා විසින් සකස් කරන ලදී. තෝරාගත් වෘත්තිකයන් විසින් වර්තමානයේ මොඩියුලයේ සෝදුපත් බැලීම සිදුකරනු ලැබේ. මෙය ළමා ආරක්ෂාව පිළිබඳ පොලිස් නිළධාරින් පුහුණු කිරීමට පරිශීලනය කෙරෙනු ඇත.

b. යුනිසෙෆ් සහයෝගිතාව යටතේ ක්‍රියාත්මක වන ළමා ආරක්ෂාව සහ යුක්තිය පිළිබඳ වැඩසටහන යටතේ, " දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන සඳහා සහයෝගය "(SDDP)යන වැඩසටහනේ විෂය මාලාව උපයෝගී කර ගනිමින් පොලිස් නිළධාරින් පුහුණු කිරීමේ වැඩමුළු අනුරාධපුරය, වවුනියා, මන්නාරම, මඩකලපුව, අම්පාර, මොණරාගල, පුත්තලම ආදි දිස්ත්‍රික් පොලිස් බල ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමට වර්තමානයේ සැළසුම් සකස් කරමින් පවතී.

c. ළමා ආරක්ෂාව සහ යුක්තිය පිළිබඳ වැඩසටහන යටතේ යුනිසෙෆ් සංවිධානයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සහයෝගීතාවෙන් යුතුව අමතර උපකාරක පොලිස් පුහුණු මාලාවක් පැවැත්වීමට නියමිතය. උක්ත දැක්වූ පුහුණු කිරීම් පිළිබඳ විස්තර අවසන් වරට සැකසීමේ විචක්ෂණ සැසිය පැවැත්වීමට නියමිතය. පුහුණු කිරීම්වල දී අවධානය යොමුකරනුයේ උපදේශන මනෝවිද්‍යාව සහ ළමා ආරක්ෂාව සම්බන්ධ වෘත්තියට එහි ඇති වැදගත්කමයි.

d. අපරාධයක වගකීම දැරීමේ අවම වයස් සීමාව පිළිබඳ සංශෝධන - අපරාධයක වගකීම දැරීමේ අවම වයස් සීමාව තීරණය කිරීමේ රැස්වීමක් පැවති අතර, එහි දී අවම වයස් සීමාව 12 දක්වා ඉහළ නැංවීමට තීරණය කරන කැබිනට් පත්‍රිකාව සකස් කර ඇති අතර පරිවර්තනය කිරීම සඳහා යොමුකර ඇත. එම කටයුත්ත නිම වූ වහාම කැබිනට් පත්‍රිකාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

e. ළමා ආරක්ෂාව සහ යුක්තිය පිළිබඳ වැඩසටහන මගින් වර්තමානයේ අනුරාධපුරය, මන්නාරම, අම්පාර, මොණරාගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල ඇති උසාවි වඩා ළමා හිතකාමී උසාවි බවට පත්කිරීමේ අරමුණින් යුතුව ප්‍රදේශ පහක උසාවිවල නවීකරණ කටයුතු කරමින් පවතී. යුනිසෙෆ් ආයතනය මගින් කරන ගෙවීම් සෘජුවම කොන්ත්‍රාත්කරුවාට ලබාදීමට 2015 දී තීරණය කරන ලදී.

## 5.2 ආයතන අංශය

අධිකරණ, අධිකරණ අමාත්‍යාංශය, හා අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන පහලොවෙහි ආයතන කටයුතු ආයතන අංශය මගින් සිදු කරනු ලබයි. පුහුණු හා කාර්යක්ෂම මානව සම්පතක් ලබා දීම සහතික කිරීම, යුක්තිය පසිඳලීමේ කර්තව්‍යයෙහිදී අවශ්‍ය පහසුකම් සැපයීම හා අනෙකුත් සම්බන්ධීකරණ කටයුතුද මෙම අංශයෙන් සිදු කරයි. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම, සුදුස්සන් තෝරා ගැනීම, බඳවා ගැනීම, පුහුණු කිරීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම හා විනය පාලන කටයුතු , අතිකාල ගමන් වියදම්, ණය අත්තිකාරම් ලබා දීම, නඩු භාණ්ඩ නිෂ්කාෂණය කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු, අවශ්‍ය අවස්ථාවන්හිදී චක්‍රලේඛ නිකුත් කිරීම මෙම අංශයෙන් ඉටු කරනු ලබයි.

අධිකරණ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ 263ක ගේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත නිලධාරීන් නොවන අධිකරණ වල සේවයේ නියුතු 3819ක ගේ සියළු ආයතන කටයුතු මෙම අංශයෙන් ඉටු වේ.

උක්ත කාර්යයන් අභ්‍යන්තර පරිපාලන අංශය, අධිකරණ පරිපාලන අංශය, සාම විනිසුරු අංශය, හදිසි මරණ පරීක්ෂක හා අධිකරණ වෛද්‍ය නිලධාරී අංශය, සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් හා දිවුරුම් කොමසාරිස් අංශය, දිවුරුම් දුන් භාෂා පරිවර්තක අංශය, ප්‍රවාහන අංශය හා දෙපාර්තමේන්තු අංශය යන අංශ මඟින් ක්‍රියාවට නංවනු ලබයි.

## 5.2.1 අභ්‍යන්තර පරිපාලන අංශය

### 5.2.1.1 නව තනතුරු ඇති කිරීම

- නව අතිරේක ලේකම් තනතුරක් ඇති කිරීම

### 5.2.1.2 බඳවා ගැනීම් පටිපාටි සකස් කර අනුමත කර ගැනීම

දිවයින පුරා පිහිටි අධිකරණ 183ක සියළුම නඩත්තු කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශය මඟින් සිදු කෙරේ. නඩත්තු කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාම සඳහා වඩු කාර්මික, පෙදරේරු හා කම්කරුවන්ගෙන් සමන්විත නඩත්තු ඒකකයක් පිහිටවනු ලැබූ අතර ඒ සඳහා නව බඳවාගැනීම් පටිපාටි සකස්කර අනුමත කරවාගෙන ඇත.

- වඩු කාර්මික, පෙදරේරු බඳවා ගැනීම් පටිපාටිය
- කම්කරු බඳවාගැනීමේ පටිපාටිය

### 5.2.1.3 බඳවා ගැනීම්

තනතුරු 08ක් සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත.

| තනතුර | විධායක | තෘතියික | ද්විතීය | ප්‍රාථමික | එකතුව |
|---|---|---|---|---|---|
| අතිරේක ලේකම් (විනිසුරු) | 01 | - | - | - | 01 |
| සහකාර ලේකම් (නීති) | 01 | - | - | - | 01 |
| ජලනල කාර්මික | - | - | - | 03 | 03 |
| විදුලි කාර්මික | | | | 03 | 03 |
| එකතුව | 02 | - | - | 06 | 08 |

(වගු අංක 01)

- මීට අමතරව ජලනළ කාර්මික 03, විදුලි කාර්මික 03, වඩු කාර්මික 05 හා පෙදරේරු 05 ක් ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

### 5.2.1.4 පුහුණුවීම් හා හැකියා වර්ධනය

අධිකරණ අමාත්‍යාංශයේ සේවය කරනු ලබන මාණ්ඩලික නිලධාරීන්ගේ සිට සුළු සේවකයින් දක්වා සියලුම සේවක ශ්‍රේණි ආවරණය වන පරිදි පහත දැක්වෙන අයුරින් පුහුණුවීම් ලබා දෙන ලදී.

#### 5.2.1.4.1 දේශීය පුහුණුව

| පුහුණුවේ ස්වභාවය | නිලධාරී සංඛ්‍යාව | වැයකළ මුළු ප්‍රතිපාදන (රු) |
|---|---|---|
| පශ්චාත් උපාධි පාඨමාලාව (විනිසුරුවරුන් සඳහා නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ඇතුලත්ව) | 24 | 8,597,000 |
| භාෂා පුහුණුව | 16 | 226,500 |
| ඵලදායිතා ප්‍රවර්ධනය හා පරිගණක පුහුණුව | 06 | 30,000 |
| නායකත්ව පුහුණුව | 46 | 6,252,500 |
| විෂයානුබද්ධ පුහුණුවීම් | 05 | 783,500 |

| | | |
|---|---|---|
| E – Filling ව්‍යාපෘතිය | 21 | 780,000 |
| එකතුව | 118 | 11,042,250 |

(වගු අංක 02)

- මීට අමතරව රජයට අනුබද්ධිත වෘත්තීය පුහුණු ආයතන මඟින් මාස 06ක ප්‍රායෝගික පුහුණුව සඳහා යොමුකරන පුහුණු ලාභීන් 21 දෙනෙක් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දී අවසන් අතර මේ වන විටත් 18 දෙනෙකුට ප්‍රායෝගික පුහුණුව ලබා දෙමින් පවතී.

5.2.1.4.2 <u>විදේශීය පුහුණුව</u>

| පුහුණුවේ ස්වභාවය | නිලධාරී සංඛ්‍යාව | වැය කළ මුළු ප්‍රතිපාදන (රු) |
|---|---|---|
| විනිසුරුවරුන් - පුහුණු හා සම්මන්ත්‍රණ | 89 | 41,643,297.23 |
| අමාත්‍යාංශ නිලධාරීන් - සම්මන්ත්‍රණ | 07 | 3,539,480.39 |
| අමාත්‍යාංශ නිලධාරීන් - පුහුණු | 06 | 2,638,434.53 |
| එකතුව | 102 | 47,821,212.15 |

(වගු අංක 03)

5.2.1.5 <u>විනය පරීක්ෂණය</u>

2016.01.01 දින සිට 2016.09.30 දක්වා මූලික විමර්ෂණ 24ක් පැවැත්වෙමින් පවතින අතර ඉන් මූලික විමර්ෂණ 02ක් අවසන් කර ඇත. සැකයට පාත්‍ර වූ නිලධාරියාට එරෙහිව විනයානුකූලව ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් චෝදනාවක් බැලූ බැල්මට හෙළිදරව් නොවන බැවින් එම මූලික විමර්ෂණ 02 අවසන් කර ඇත.

5.2.1.6 <u>ණය අනුමත කිරීම</u>

| ණය වර්ගය | නිලධාරීන් සංඛ්‍යාව | මුදල (රු) |
|---|---|---|
| දේපළ/ නිවාස | 07 | 9,488,220.00 |
| ආපදා | 113 | 9,253,846.00 |
| උත්සව | 191 | 1,910,000.00 |
| විශේෂ | 68 | 272,000.00 |
| පාපැදි | 03 | 18,000.00 |
| එකතුව | 382 | 20,942,084.00 |

(වගු අංක 04)

## 5.2.2 <u>අධිකරණ පරිපාලන අංශය</u>

5.2.2.1 <u>නව තනතුරු ඇති කිරීම</u>

අලුතින් ආරම්භ කර ඇති අධිකරණ සඳහා කනිෂ්ඨ සේවක කාර්ය මණ්ඩල 108ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරවාගෙන ඇත.

5.2.2.2 <u>**බඳවාගැනීම් පටිපාටි සකස් කර අනුමත කර ගැනීම**</u>

- සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා හා අධිකරණ සෝෂක ප්‍රවේශක සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
- අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය

5.2.2.3 <u>**බඳවා ගැනීම**</u>

තනතුරු 202ක් සඳහා බඳවාගැනීම් සිදුකර ඇත

| තනතුර | විධායක | තෘතියික | ද්විතීය | ප්‍රාථමික | එකතුව |
|---|---|---|---|---|---|
| කා.සේ.සේ. | - | - | - | 52 | 52 |
| පිස්කල් පියන් | - | - | - | 61 | 61 |
| පිස්කල් (භාරකාර මාතා) | - | - | - | 28 | 28 |
| අධිකරණ ආරක්ෂක | | | | 61 | 61 |
| **එකතුව** | **-** | **-** | **-** | **202** | **202** |

(වගු අංක 05)

- **මීට අමතරව සිතාසි බෙදන්නා හා ඇසිකීසි** ක්‍රියාත්මක කරන්නා, අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු 341ක් බඳවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.
- **තවද, කාර්යාලීය කාර්ය සහායක සේවයට 63ක් සහ අධිකරණ ආරක්ෂක සේවයට 25ක් බඳවා ගැනීමටද කටයුතු කෙරෙමින් පවතී.**

### 5.2.2.4 <u>රාජසන්තක කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීම</u>

රාජසන්තක කරනු ලබන හා හිමිකම් නොපාන නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම සම්බන්ධීකරණය මෙම අමාත්‍යාංශය මඟින් සිදු කෙරේ. ඒ අනුව වෙන්දේසි මඟින් ලත් ආදායම පහත පරිදි වේ.

| වෙන්දේසි සංඛ්‍යාව | ආදායම (රු.) |
|---|---|
| 57 (රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ) | 14,171,590.00 |
| 38 (වැලි) | 5,335,430.00 |
| එකතුව | 19,507,020.00 |

(වගු අංක 06)

තවද රාජ සන්තක කරන ලද වැලි හා දැව ආගමික සිද්ධස්ථාන හා රාජ්‍ය ආයතන වෙත සහන මිලට නිකුත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ 05/2016 නිකුත් කරන ලද අතර ඒ යටතේ වැලි නිකුත් කිරීම සඳහා බලපත්‍ර 198ක් මේ වන විට නිකුත් කර ඇත.

### 5.2.2.5 <u>කාති අධිකරණ</u>

කාති විනිසුරුවරුන්ගෙන් ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බලමින් කාති විනිසුරුවරුන්ගේ දීමනා වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

| දීමනාව | 2007 සිට ගෙවනු ලබන දීමනාව | යෝජිත දීමනාව |
|---|---|---|
| කාති විනිසුරුවරුන් සඳහා | රු.6,000.00 | රු.10,000.00 |
| සහයක සේවාවන් හා ලිපි ද්‍රව්‍ය සඳහා | රු.5,000.00 | රු.7,000.00 |
| එකතුව | රු.11,000.00 | රු.17,000.00 |

(වගු අංක 07)

### 5.2.2.6 <u>අධිකරණ සහ විනිසුරුවරුන් සඳහා පහසුකම් සැපයීම</u>

#### 5.2.2.6.1 <u>සන්නිවේදන පහසුකම් සැපයීම</u>

- අධිකරණ 16කට අභ්‍යන්තර දුරකථන පද්ධති ලබාදීම ඇතුළුව සන්නිවේදන පහසුකම් සැපයීම සඳහා රු.2,818,548.00 ක ප්‍රතිපාදන වෙන්කර දී ඇත.
- උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ සන්නිවේදන දීමනා වැඩි කිරීමට අදාළව අධිකරණ අමාත්‍යාංශයීය චක්‍රලේඛ 03/2016 නිකුත් කර ඇත.

| තනතුර | රාජකාරී කාර්යාලයීය දුරකතන | | රාජකාරී නිවාස, ජංගම දුරකතන හා අන්තර්ජාල පහසුකම් සඳහා දීමනාව | |
|---|---|---|---|---|
| | පෙර | පසු | පෙර | පසු |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් | 5,000.00 | 1,500.00 | 15,000.00 | 18,500.00 |
| අභියාචනාධිකරණ විනිසුරුවරුන් | 5,000.00 | 1,500.00 | 15,000.00 | 18,500.00 |

(වගු අංක 08)

5.2.2.6.2 <u>ග්‍රන්ථ දීමනාව</u>

මහාධිකරණ විනිසුරුවරුන් හා සියළුම මුල් අවස්ථා අධිකරණ විනිසුරුවරුන් සඳහා රු.20,000.00ක මාසික ග්‍රන්ථ දීමනාවක් තබා ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන හා අධිකරණ අමාත්‍යාංශයීය චක්‍රලේඛ අංක 07/2016 නිකුත් කර ඇත.

## 5.2.3 සාම විනිසුරු අංශය

**අංක 1954/34 දරණ හා 2016.02.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ග්‍රාම නිලධාරීන් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල නිල බලයෙන් සාම විනිසුරුවරුන් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.**

- **<u>මෙම වසර තුල සාම විනිසුරුවරුන් පත් කිරීම</u>**

| පත්වීම් ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| මුළු දිවයිනටම බල පැවැත්වෙන පරිදි | 2,368 |
| අධිකරණ කළාපයට බලපැවැත්වෙන පරිදි | 1,118 |
| නිල බලයෙන් (ග්‍රාම නිලධාරීන්) | 14,022 |
| එකතුව | 17,508 |

(වගු අංක 09)

- **සාම විනිසුරු හැඳුනුම්පත් 1,379 ක් නිකුත් කර ඇත.**

## 5.2.4 හදිසි මරණ පරීක්ෂක හා අධිකරණ වෛද්‍ය නිලධාරී අංශය

- දිවයින පුරා හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශ 674 ක් ආවරණය වන පරිදි හදිසි මරණ පරීක්ෂකවරු 564 ක් සේවයේ යෙදී සිටින අතර කොට්ඨාශ 05 ක් ආවරණය වන පරිදි හදිසි මරණ පරීක්ෂකවරුන් 05 ක් මෙම වසර තුළ පත් කර ඇත. තවත් දිස්ත්‍රික්ක 03ක පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරෙමින් පවතින අතර හදිසි මරණ පරීක්ෂකවරු 50 ක් මෙම වසර තුළදීම බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත් වෙමින් පවතී.
- විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන් විසින් ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බලා විශේෂඥ අධිකරණ වෛද්‍ය දීමනා වැඩි කිරීම වෙනුවෙන් අධිකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අංක 4/2016 නිකුත් කරන ලදී.

| දීමනාව | පැවති ගෙවීම් | | නව ගෙවීම් | |
|---|---|---|---|---|
| | විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරීන් සඳහා | විශේෂඥ නොවන අධිකරණ වෛද්‍ය නිලධාරීන් සඳහා | විශේෂ අවස්ථා | විශේෂ නොවන අවස්ථා |
| පශ්චාත් මරණ අධීක්ෂණ සඳහා<br>I ) මහේස්ත්‍රාත් නියෝගය මත සිදු කෙරෙන පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා<br>II) හදිසි මරණ පරීක්ෂණයේ ඉල්ලීම මත සිදු කෙරෙන මරණ පරීක්ෂණ සඳහා | -<br>- | -<br>- | රු.1,000<br>රු.3,000 | රු.750<br>රු.1500 |
| | - | - | රු.2000 | රු.1000 |
| මාසික ඉන්ධන දීමනාව | ලීටර් 140 | නැත. | ලීටර් 170 | නැත. |
| අධිකරණ වෛද්‍ය වාර්තාව සැපයීම | 250 | 250 | 500 | 500 |

(වගු අංක 10)

## 5.2.5 සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් හා දිවුරුම් කොමසාරිස් අංශය

- වෘත්තියේ වසර 15ක සේවා කාලයක් සපුරා ඇති නීතිඥවරු 61 ක් සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත්වරු ලෙස මෙම වසර තුල පත් කර ඇත.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥවරුන් 753 ක් දිවුරුම් කොමසාරිස්වරුන් ලෙස පත් කර ඇත.

## 5.2.6 දිවුරුම් දුන් භාෂා පරිවර්තක

**දැනට දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් 1663ක් දිවයින පුරා විසිරී සිටින අතර** දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන් විසින් පරිවර්තනය කරනු ලබන ලේඛන සහතික කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත පැමිණීමට විශාල පිරිසකට සිදු වූ අතර, එය මහජනයාට විශාල අපහසුතාවක් වූ බැවින් විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා සඳහා දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන් විසින් පරිවර්තනය කරනු ලබන ලේඛන විදේශ කටයුතු අමාත්‍යාංශයේදීම සනාථ කර ගැනීමට අවස්ථාව සලසා ඇත.

## 5.2.7 ප්‍රවාහන අංශය

සියළුම මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, වාහන රක්ෂණ කිරීම හා සියළුම වාහන නඩත්තු කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

### 5.2.7.1 නිල රථ රක්ෂණය කිරීම

| ආයතනය | නිල රථ සංඛ්‍යාව | | මුදල (රු.) |
|---|---|---|---|
| අමාත්‍ය කාර්ය මණ්ඩලය | 19 | (පූර්ණ) | 1,745,951.33 |
| අධිකරණ නිලධාරීන්ගේ නිල රථ | 149 | (පූර්ණ) | 6,896,126.46 |
| අමාත්‍යාංශයේ නිල රථ | 46 | (පූර්ණ) | 1,759,411.29 |
| | 01 | (තුන්වන පාර්ශව) | 745.30 |
| එකතුව | 215 | | 10,402,234.38 |

(වගු අංක 11)

- වෙළඳ තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 පනත යටතේ මොටර් රථ ආනයනය/ මිලදී ගැනීම සඳහා අධිකරණ නිලධාරීන් 32ක් සඳහා බලපත්‍ර ලබාදෙන ලදී.
- ජාතික අයවැය චක්‍රලේඛ 01/2016 මෙහෙයුම් හා කල්බදු ක්‍රමය යටතේ මහාධිකරණ විනිසුරුවරුන් හා අධිකරණ නිලධාරීන් සඳහා වාහන 24ක් ලබා ගැනීමටත් නීතිපති දෙපාර්තමේන්තුවට වාහන 89ක් ලබා ගැනීමටත් අනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
- නිලරථ ලබා නොගන්නා මහාධිකරණ විනිසුරුවරුන් හා අධිකරණ නිලධාරීන්ට ගෙවනු ලබන මාසික ප්‍රවාහන දීමනාව මහාධිකරණ විනිසුරුවරුන් සහ විශේෂ ශ්‍රේණියේ අධිකරණ නිලධාරීන් සඳහා රු.60,000.00ක් ලෙසද අනෙකුත් මුල් අවස්ථා වල අධිකරණ නිලධාරීන් සඳහා රු.50,000.00 ක් ලෙසද අධිකරණ අමාත්‍යාංශයීය චක්‍රලේඛ 08/2016 මඟින් වැඩිකර ඇත.

## 5.2.8 දෙපාර්තමේන්තු අංශය

### 5.2.8.1 නව තනතුරු ඇති කිරීම

| ආයතනය | විධායක | තෘතියික | ද්විතීය | ප්‍රාථමික | එකතුව |
|---|---|---|---|---|---|
| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | - | - | 02 | - | 02 |
| ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 01 | - | - | - | 01 |
| අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය | 08 | 22 | 10 | 12 | 52 |
| එකතුව | 09 | 22 | 12 | 12 | 55 |

(වගු අංක 12)

### 5.2.8.2 බඳවාගැනීම් පටිපාටි අනුමත කිරීම

- නියෝජ්‍ය මහාභාරකාර තනතුර සඳහා වන විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුමත කර ඇත.
- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ඇත.
- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අතිරේක නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ඇත.
- ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ පර්යේෂණ නිලධාරී තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ඇත.
- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය සඳහා අනුමත තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි පහත පරිදි අනුමත කර ඇත.
- ප්‍රාථමික - ශිල්පීය නොවන
- ප්‍රාථමික - ශිල්පීය
- කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)
- කණිෂ්ඨ කළමනාකාර
- කළමනාකාර

### 5.2.8.3 පත් කිරීම

| ආයතනය | තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| නිතිපති දෙපාර්තමේන්තුව | රජයේ අධිනීතිඥ | 17 |
| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | **සහකාර නීති කෙටුම්පත් සම්පාදක** | **05** |
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | සහකාර ලේකම් | 21 |

(වගු අංක 13)

- **කම්කරු විනිශ්චය සභාවේ ලඝු ලේඛක තනතුරු 17ක පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර වෘත්තීය පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.**

- **ණය සහනදායි මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක තනතුරු 03ක පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර වෘත්තීය පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.**

- **කම්කරු විනිශ්චය සභාවේ භාෂණ පරිවර්තක තනතුරු 07ක පුරප්පාඩු පිරවීමට මේ වන විට අයදුම්පත් කැඳවා ඇති අතර අයදුම්පත් තේරීමේ මූලික කටයුතු කෙරෙමින් පවතී.**

- **නිති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ සහකාර ලේකම් තනතුරු 02ක පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නියමිතය.**

## 5.3 ගිණුම් අංශය

අධිකරණ අමාත්‍යාංශයේ ගිණුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශ පාලන හා අධිකරණ පාලන වැය ශීර්ෂයන් යටතේ පහත සඳහන් පරිදි ගිණුම් විධිමත් කිරීමේ කටයුතු 2016 වර්ෂයේ සිදුකර ඇත.

මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් පහත ආකාරයෙන් ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ.

1. ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය.
2. අමාත්‍යාංශ පරිපාලනය.
3. අධිකරණ පරිපාලනය.
4. සමථ මණ්ඩල කොමිෂන් සභාව.
5. නීති ආධාර කොමිෂන් සභාව / ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

### 5.3.1 2016.01.01 සිට 2016.09.30 දක්වා ප්‍රගතිය

#### 5.3.1.1 අමාත්‍යාංශ පරිපාලන ශීර්ෂ 110 - 1, 2 , 3

| විස්තරය | ප්‍රතිපාදන (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 844,431,000 | 515,430,438 |
| ප්‍රාග්ධන වියදම් | 498,490,000 | 9,6210,088 |
| **මුළු එකතුව** | **1,342,921,000** | **611,640,526** |

#### 5.3.1.12 අධිකරණ පරිපාලන 228 - 1, 2

| විස්තරය | ප්‍රතිපාදන (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 5,406,440,000 | 3,927,209,669 |
| ප්‍රාග්ධන වියදම් | 1,224,450,000 | 547,012,035 |
| **මුළු එකතුව** | **6,630,890,000** | **447,4221,704** |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 5.4 යටිතල පහසුකම් අංශය

අධිකරණ අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශය මගින් අධිකරණ පද්ධතිය සඳහා අවශ්‍ය නව අධිකරණ සංකීර්ණ හා විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, අලුත් වැඩියා කිරීම, නඩත්තු කටයුතු වැනි වැදගත් කාර්යභාරයන් රාශියක් ඉටු කරනු ලබයි.

අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකට ක්‍රියාත්මක වේ. එනම්,

- මහා පරිමාණ ඉදිකිරීම්
- සුළු පරිමාණ ඉදිකිරීම්
- ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති

මෙම වසරේ ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

## 5.4.1 මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති

| විස්තරය | 2016 වසර සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | | 2016.09.30 දිනට භෞතික ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථනය | |
|---|---|---|---|---|---|---|
| | | අගය (රු) | % | | අගය (රු) මිලියන | % |
| ගාල්ල අධිකරණ සංකීර්ණය | 156,000,000 | 45,122,000 | 29% | 44% | 62 | 40% |
| හෝමාගම අධිකරණ සංකීර්ණය | 150,000,000 | 109,155,000 | 73% | 83% | 150 | 100% |
| වත්තල අධිකරණ සංකීර්ණය | 46,000,000 | 17,614,000 | 38% | 92% | 40 | 87% |
| ගලගෙදර අධිකරණ ගොඩනැගිල්ල | 38,400,000 | 9,614,000 | 25% | 85% | 38 | 99% |
| මාතර අධිකරණ ගොඩනැගිල්ල | 194,000,000 | 100,000,000 | 51% | 8.5% | 194 | 100% |
| මුළු මුදල | **584,400,000** | **281,505,000** | **48.17%** | | **484** | **82.82%** |

## 5.4.2 සුළු පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති

| විස්තරය | 2016. වසර සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | | 2016.12.31 දිනට පුරෝකථනය | |
|---|---|---|---|---|---|
| | | අගය (රු) | ප්‍රතිශතය | අගය (රු) මිලියන | ප්‍රතිශතය |
| සුළු පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති | 200,000,000 | 68,752,000 | 34% | 180 | 90% |

## 5.4.3 ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති

| විස්තරය | 2016. වසර සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | | 2016.12.31 දිනට පුරෝකථනය | |
|---|---|---|---|---|---|
| | | අගය (රු) | ප්‍රතිශතය | අගය (රු) මිලියන | ප්‍රතිශතය |
| ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති | 200,000,000 | 101,526,000 | 51% | 200 | 100% |

## 5.4.4 2016.01.01 සිට 2016.09.30 දක්වා ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතින මහා පරිමාණ ව්‍යාපෘති

1. ගාල්ල අධිකරණ සංකීර්ණය




2. හෝමාගම අධිකරණ සංකීර්ණය




3. වත්තල අධිකරණ සංකීර්ණය




4. ගලගෙදර අධිකරණ සංකීර්ණය




5. මාතර අධිකරණ සංකීර්ණය



## 5.4.5 2016.01.01 සිට 2016.09.30 දක්වා ඉදිකිරීම් අවසන් කර ඇති සුළු පරිමාණ ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | 2016 වසර සඳහා ප්‍රතිපාදන (රු. මි.) | ඇතුලත් කර ඇති පහසුකම් |
|---|---|---|---|
| 1 | මුතූර් දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ ඉදිකිරීම | 19.32 | අධිකරණ ශාලාව<br>කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 2 | පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණයේ යෝජිත ගොඩනැගිල්ල හා ළමුන්ට ක්‍රීඩා කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම | 1.59 | මහජනතාව සඳහා පොදු පහසුකම්<br>ළමුන්ට රැදී සිටීම සඳහා ස්ථානයක් |
| 3 | මහනුවර බෞද්ධ අධිකරණයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සහ දිසා අධිකරණයේ ලේඛණාගාරය ඉදිකිරීම | 3.99 | අධිකරණ ශාලාව<br>ලේඛණාගාරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 4 | බදුල්ල අධිකරණ සංකීර්ණයේ කාර්යාලය හා ආපන ශාලාව ඉදිකිරීම | 3.55 | මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 5 | කෑගල්ල සිවිල් අභියාචනා මහාධිකරණයේ දෙවන මහළ ඉදිකිරීම | 3.33 | කාර්යාලය<br>ලේඛණාගාරය |
| 6 | කල්පිටිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2.62 | අධිකරණ ශාලාව<br>කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 7 | ➢ නිකවැරටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නව ලේඛණාගාර හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම<br>➢ ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ නව ලේඛණාගාර හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම<br>➢ ආනමඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ නව ලේඛණාගාර හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම<br>➢ හෙට්ටිපොළ මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛණාගාර හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම | 50.64 | කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 8 | වැල්ලවාය අධිකරණයේ ලේඛනාගාරය ඉදිකිරීම | 5.92 | කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 9 | ඇඹිලිපිටිය නව මහේස්ත්‍රාත් අධිකරණය හා තාප්පය, නිල නිවස ඉදිකිරීම | 22.98 | මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල |

| | | | |
|---|---|---|---|
| | | | තාප්පය<br>නිල නිවස |
| 10 | ගම්පහ මහාධිකරණය, දිසා අධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම හා අනෙකුත් අලුත්වැඩියා ව්‍යාපෘතිය | 3.21 | මහාධිකරණයේ මුරකුටිය,<br>මහජන වැසිකිලිය<br>දිසා අධිකරණයේ ජල ටැංකිය |
| 11 | මීනුවන්ගොඩ දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ මුරකුටිය හා යතුරුපැදි නවතා තැබීමේ ස්ථානය ඉදිකිරීම හා රෙජිස්ට්‍රාර් කාමරය බෙදා වෙන්කිරීම | 0.83 | මුරකුටිය<br>යතුරුපැදි නවතා තැබීමේ ස්ථානය<br>රෙජිස්ට්‍රාර් කාමරය බෙදා වෙන්කිරීම |
| 12 | කොළඹ වාණිජ මහාධිකරණයේ හදිසි අලුත්වැඩියා කිරීම | 0.13 | පොළව සකස් කිරීම |
| 13 | සයින්දමදුරු කාති අධිකරණය ඉදිකිරීම | 0.91 | කාති අධිකරණය ඉදිකිරීම |
| 14 | පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණයේ යෝජිත ගොඩනැගිල්ල හා ළමුන්ට ක්‍රීඩාකිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම | 1.59 | ළමයින් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම |
| 15 | මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයේ යෝජිත ගොඩනැගිල්ල හා ළමුන්ට ක්‍රීඩාකිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම | 2.34 | ළමයින් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම |

### 5.4.6 <u>2016.01.01 සිට 2016.09.30 දක්වා ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතින සුළු පරිමාණ ව්‍යාපෘති</u>

| | ව්‍යාපෘතිය | 2016 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන) | භෞතික ප්‍රගතිය | ඇතුලත් කර ඇති පහසුකම් |
|---|---|---|---|---|
| 1 | කලවන්චිකුඩි අධිකරණයේ නව ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම | 12.07 | 65% | කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 2 | ගාල්ල දිසා අධිකරණයේ තාප්පය හා කෑම කාමරය ඉදි කිරීම | 3.27 | 80% | පොදු පහසුකම් |
| 3 | තිස්සමහාරාම දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය ඉදි කිරීම | 7.04 | 90% | කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 4 | ඇල්පිටිය අධිකරණයේ කාර්යාලය ඉදිකිරීම | 6.75 | 65% | කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |
| 5 | ඇඹිලිපිටිය සහ වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයන්හි ලේඛනාගාර හා නඩු භාණ්ඩ කාමර සඳහා රාක්ක සපයා සවි කිරීම | 8.73 | 40% | රාක්ක සවි කිරීම |
| 6 | පේදුරුතුඩුව දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය ඉදිකිරීම | 12.84 | 85% | කාර්යාලය<br>ලේඛණාගාරය<br>නඩු භාණ්ඩ කාමරය<br>මහජනතාව සඳහා පොදු පහසුකම් |

| | | | | |
|---|---|---|---|---|
| 7 | පොළොන්නරුව මහාධිකරණ විනිසුරු නිල නිවස ඉදිකිරීම බිබිල මහේස්ත්‍රාත් නිල නිවස ඉදිකිරීම | 10.69 | 34% | විනිසුරු නිල නිවස<br>මහේස්ත්‍රාත් නිල නිවස |
| 8 | කැස්බෑව දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම | 14.60 | 98% | ලේඛනාගාරය<br>නඩු භාණ්ඩ කාමරය |
| 9 | අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ යෝජිත ගොඩනැගිල්ල හා ළමුන්ට ක්‍රීඩාකිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම | 1.06 | 8% | ළමයින් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම |

## 5.4.7 2016.01.01 සිට 2016.09.30 දක්වා කාලය තුළ ප්‍රතිසංස්කරණය කර ඇති ගොඩනැගිලි

| | ව්‍යාපෘතිය | 2016 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු. (මි) | ඇතුලත් කර ඇති පහසුකම් |
|---|---|---|---|
| 1 | මාතර දිසා විනිසුරු නිල නිවස අලුත් වැඩියා කිරීම | 0.15 | නිල නිවස අළුත් වැඩියාව |
| 2 | කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අලුත් වැඩියා කිරීම | 0.35 | ගරාජය ඉදිකිරීම<br>තීන්ත ආලේපය<br>මායිම් තාප්පය |
| 3 | කොළඹ 7 මහාධිකරණ විනිසුරු නිල නිවසේ වැසිකිලිය හා පැතිබැම්ම අලුත්වැඩියා කිරීම | 2.18 | නිල නිවස අළුත් වැඩියාව |
| 4 | කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියා කිරීම | 1.39 | අධිකරණය වැඩි දියුණු කිරීම |
| 5 | ගම්පහ කම්කරු විනිශ්චය සභා ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම | 0.19 | වහල සහ සිවිලිම |
| 6 | මහර මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියා කිරීම | 0.38 | ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම |
| 7 | කොළඹ 12 අමාත්‍යාංශ නව ගොඩනැගිල්ලේ විනිසුරු පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ඇතුළත තීන්ත ආලේප කිරීම | 0.29 | තීන්ත ආලේප කිරීම |
| 8 | වරකාපොළ දිසා විනිසුරු නිල නිවසේ සම්පූර්ණ අලුත්වැඩියා කිරීම | 1.88 | ගරාජය වැඩි දියුණු කිරීම<br>මුළුතැන්ගෙයි වැඩි දියුණු කිරීම<br>මැද මිදුල වැඩි දියුණු කිරීම |
| 9 | කෑගල්ල අතිරේක දිසා විනිසුරු නිල නිවසේ සම්පූර්ණ අලුත්වැඩියා කිරීම | 1.52 | මායිම් තාප්පය<br>බිත්ති තීන්ත ආලේපය<br>සිවිලිම සහ වහල සකස් කිරීම |
| 10 | වාරියපොළ දිසා විනිසුරු නිල නිවසේ අලුත්වැඩියා කිරීම | 0.3 | නිල නිවස සම්පූර්ණ අළුත් වැඩියාව |
| 11 | මතුගම දිසා විනිසුරු නිල නිවසේ අලුත්වැඩියා කිරීම | 0.9 | නිල නිවස අළුත් වැඩියාව |
| 12 | බත්තරමුල්ල වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය පිහිටි ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | 0.51 | තීන්ත ආලේප කිරීම |
| 13 | සරණ මාවත, කොළඹ 7 විනිසුරු නිල නිවසේ හදිසි අලුත්වැඩියා කිරීම | 0.2 | තීන්ත ආලේප කිරීම |

| | | | |
|---|---|---|---|
| 14 | ස්ටැන්මෝ ක්‍රිසෙන්ට්,නො.11 ඒ, කොළඹ 7 විනිසුරු නිල නිවසේ හදිසි අලුත්වැඩියා කිරීම | 1.9 | නිල නිවස අළුත් වැඩියාව |
| 15 | ස්ටැන්මෝ ක්‍රිසෙන්ට්, නො.11 බී,කොළඹ 7 විනිසුරු නිල නිවසේ හදිසි අලුත්වැඩියා කිරීම | 2.1 | නිල නිවස අළුත් වැඩියාව |
| 16 | කොළඹ 7 අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමාගේ නිල නිවස අලුත්වැඩියා කිරීම | 2.1 | නිල නිවස අළුත් වැඩියාව |
| 17 | කොළඹ 12 අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සැපයුම් අංශයේ ඇලුමිනියම් පාටිෂන් ඉවත්කිරීම හා සවි කිරීම | 0.06 | කාර්යාලය වැඩි දියුණු කිරීම |
| 18 | කන්තලේ මහේස්ත්‍රාත් නිල නිවස අලුත් වැඩියා කිරීම | 2.51 | වහලය සහ බිත්ති අළුත් වැඩියාව<br>තීන්ත ආලේපය |
| 19 | දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණයේ සම්පූර්ණ අලුත්වැඩියා කිරීම | 10.29 | කාර්යාලය හා විවෘත අධිකරණය අළුත්වැඩියාව |
| 20 | ගම්පහ දිසා අධිකරණ ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම, කාර්යාලය සඳහා එකතු කිරීම හා වැඩිදියුණු කිරීම, සාක්ෂි මඩුව කෑම කාමරය ලෙස පරිවර්තනය කිරීම | 1.47 | වහලය සහ බිත්ති අළුත් වැඩියා කිරීම<br>ලේඛනාගාරයේ ජනේල සවි කිරීම |

### 5.4.8 2016.01.01 සිට 2016.09.30 දක්වා කාලය තුළ ප්‍රතිසංස්කරණය වෙමින් පවතින ගොඩනැගිලි

| අංකය | ව්‍යාපෘතිය | 2016 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු. (මිලියන) | භෞතික ප්‍රගතිය | ඇතුලත් කර ඇති පහසුකම් |
|---|---|---|---|---|
| 1 | අක්කරෙයිපත්තු මහේස්ත්‍රාත් අධිකරණයේ අලුත් වැඩියා කිරීම | 2.27 | 60% | විවෘත අධිකරණයේ වහලය අළුත්වැඩියාව |
| 2 | බත්තරමුල්ල අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ තෙවන මහල කම්කරු විනිශ්චය සභාව, අංක 1 පිහිටුවීම සඳහා ඇලුමිනියම් බෙදා වෙන් කිරීම | 1.44 | ප්‍රදානය කර ඇත | ඇලුමිනියම් බෙදා වෙන් කිරීම |

## 5. 5 සංවර්ධන අංශය

### 5.5.1 සංවර්ධන අංශය මගින් 2016.01.01 සිට 2016.09.30 දක්වා කාල සීමාව තුළ ඉටු කළ කාර්යයන්

#### 5.5.1.1 අධිකරණ අමාත්‍යාංශය සතු ඉඩම් වල නිරවුල් භාවය තහවුරු කිරීම

**ඉඩම් නිරවුල් කිරීමට අදාළව සංවර්ධන අංශය මගින් 2016.01.01 සිට 2016.09.30 දින දක්වා සිදු කළ කාර්යයන්.**

1. නව අධිකරණ පිහිටුවීමට, නිල නිවාස ඉදිකිරීමට හා සංචාරක උසාවි සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට සුදුසු ඉඩම් සපයා ගැනීමට කටයුතු කිරීම.

a. කොළඹ නව අධිකරණ පියස ඉදිකිරීම සඳහා බී.සී.සී.ලංකා ආයතනයට අයත් භූමියෙන් අක්කර 6 ක (හෙක්ටෙයාර 1.80618 ක) ප්‍රමාණයක් ලබා ගැනිම සඳහා අංක: අපම/16/0597/731 හා 2016.04.20 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය අනුව අනුමැතිය ලබාදී ඇත. ඉඩම පවරාගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවතී

b. ගාල්ල අධිකරණ සංකීරණය ඉදි කිරීම සඳහා බූස්ස ප්‍රදේශයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා නාවික හමුදාව භුක්තිවිදින ඉඩම් වලින් ප්‍රමාණවත් බිම් කොටසක් ලබා ගැනීම සඳහා අංක: අපම/16/0787/731/023 හා 2016 ජුනි මස 15 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබාදී ඇත. ඉඩම පවරාගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවතී.

2. දැනට අධිකරණ පිහිටුවා ඇති ඉඩම් නිරවුල් කිරීම සඳහා තොරතුරු රැස් කිරීමට කටයුතු කිරීම

a. ඉඩම් නිරවුල් කිරීම සඳහා සියළු අධිකරණයන් මගින් තොරතුරු කැඳවන ලද අතර දැනට තොරතුරු යොමුකර ඇති අධිකරණ 40 ක ඉඩම් පිළිබඳ තොරතුරු එක්රැස් කර ලේඛනයක් සකස් කර ඇත. 2017.03.31 දින වනවිට සියලුම අධිකරණවල තොරතුරු ඇතුළත් කොට ඉඩම් තොරතුරු ලේඛණය සම්පූර්ණ කිරීමට නියමිතය.

3. ඉඩම් නිරවුල් කර ගැනීමේදී ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉටුවියයුතු කාර්‍යයන් කඩිනමින් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට 2016.07.14 හා 15 දෙදින තුල පැවති දිස්ත්‍රික් ලේකම් සමුළුවේදී දිස්ත්‍රික් ලේකම් වරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද අතර දිස්ත්‍රික් ලේකම් වරුන් 14 දෙනෙකු වෙත ඉඩම් නිරවුල් කිරීමට අවශ්‍ය සහාය ලබා ගැනීම සඳහා ඉල්ලීම් යොමුකරන ලදී.

a. ඒ අනුව 2016.09.30 දින වන විට දිස්ත්‍රික් ලේකම්වරු 08 දෙනෙකු විසින් ප්‍රාදේශිය ලේකම් වරුන් 15 දෙනෙකු වෙත ඉඩම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අදාළ උපදෙස් යොමු කර ඇත.

| දිස්ත්‍රික් ලේකම් | අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | 2016.09.30 දිනට ප්‍රගතිය |
|---|---|---|
| කොළඹ | වේල්ලවීදිය, කොළඹ | - |
| ගම්පහ | මහර | 2016.08.22 දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලදී. |
| මොනරාගල | බුත්තල | 2016.08.26 අදාළ උපදෙස් යොමුකර ඇත. |
| කෑගල්ල | රුවන්වැල්ල | 2016.08.23 අදාළ උපදෙස් යොමුකර ඇත. |
| බදුල්ල | බිබිල, තණමල්විල | - |
| කුරුණෑගල | කුලියාපිටිය-බටහිර, කුරුණෑගල, රිදීගම, පොල්ගහවෙල | - |
| නුවරඑළිය | වලපනේ, හගුරන්කෙත, | - |

| | | |
|---|---|---|
| | හැටන්, කොත්මලේ | |
| මහනුවර | දෙල්තොට, තුම්පනේ | 2016.08.04 අදාළ උපදෙස් යොමුකර ඇත. |
| මඩකලපුව | වාලච්චේන, වෙරුගල් | - |
| අම්පාර | පොතුවිල්, අම්පාර, ලාහුගල | 2016.08.08 අදාළ උපදෙස් යොමුකර ඇත. |
| ගාල්ල | හික්කඩුව, බද්දේගම, තවලම | 2016.08.10 හා 2016.09.22 අදාළ උපදෙස් යොමුකර ඇත. |
| රත්නපුර | ඇඹිලිපිටිය, රත්නපුර | 2016.08.18 අදාළ උපදෙස් යොමුකර ඇත. |
| කළුතර | කළුතර, බණ්ඩාරගම | - |
| මාතර | මුලටියන | 2016.08.03 අදාළ උපදෙස් යොමු කර ඇත. |

### 5.5.1.2 <u>අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ විනිසුරුවරුන් සඳහා නිල නිවාස සඳහා ගොඩනැගිලි බදු හෝ කුලී පදනම මත ලබා ගැනීම.</u>

1. අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ගොඩනැගිලි බදු පදනම මත ලබා ගැනීම

a. ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22වන මහලේ පිහිටුවීම සඳහා අංක අමප/16/0765/731/022 හා 2016.05.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලද අනුමැතිය ප්‍රකාරව 2016.08.19 දින ඉදිරි වසර 03ක කාලයක් සඳහා බදු ගිවිසුම අත්සන් තබා ඇත.

2. කම්කරු විනිශ්චය සභා පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි බදු පදනම මත ලබා ගැනීම

a. 2016.01.01 සිට 2016.09.30 දක්වා වූ කාලය තුළ රත්මලාන, වත්තල හා මාතර කම්කරු විනිශ්චය සභා සඳහා ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමට බදු ගිවිසුම් 03ක් අලුතින් සකස් කර ඇත.

3. **විනිසුරුවරුන් සඳහා නිල නිවාස බදු පදනම මත ලබා ගැනීම**

a. **මේ වනවිට ක්‍රියාත්මකව පවතින බදු ගිවිසුම් 88ක් පවතින අතර 2016.01.01 සිට 2016.09.30 දක්වා කාල සීමාව තුළ නිල නිවාස 53ක් වෙනුවෙන් පහත පරිදි බදු ගිවිසුම් සකස් කර ඇත.**

| දිස්ත්‍රික්කය | සකස් කර ඇති බදු ගිවිසුම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | මහාධිකරණ/සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරු නිල නිවාස | දිසා විනිසුරු/අතිරේක දිසා විනිසුරු නිල නිවාස | මහේස්ත්‍රාත්/ අතිරේක මහේස්ත්‍රාත් නිල නිවාස | එකතුව |
| කොළඹ | 2 | 4 | 5 | 11 |
| රත්නපුර | 1 | 3 | 1 | 5 |
| කුරුණෑගල | 1 | - | 3 | 4 |
| මහනුවර | - | 1 | - | 1 |
| නුවර එළිය | - | 1 | 1 | 2 |
| බදුල්ල | - | - | 1 | 1 |
| මාතර | 1 | 2 | 2 | 5 |

| | | | | |
|---|---|---|---|---|
| ගාල්ල | 2 | 1 | 1 | 4 |
| අනුරාධපුර | 1 | - | 1 | 2 |
| පොළොන්නරුව | - | 1 | - | 1 |
| කළුතර | 1 | 1 | 3 | 5 |
| පුත්තලම | 1 | 2 | 1 | 4 |
| මොණරාගල | 1 | - | 1 | 2 |
| අම්පාර | 1 | 1 | - | 2 |
| ත්‍රිකුණාමලය | - | - | 1 | 1 |
| කෑගල්ල | - | 1 | 1 | 2 |
| මාතලේ | - | - | 1 | 1 |
| | 12 | 18 | 23 | 53 |

**5.5.1.3 <u>අධිකරණ ගොඩනැගිලි විවෘත කිරීම</u>**

**2016.07.29 වන දින මුතූර් දිසා මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල විවෘත කිරීම**





**2016.09.13 වන දින ආණමඩුව මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම.**





**2016.09.13 වන දින නිකවැරටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම.**





**2016.09.13 වන දින ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම.**





**201.05.27 වන දින යාපනය කම්කරු සභාව විවෘත කිරිම.**





## 5. 6 සැලසුම් අංශය

### 5.6.1 හැඳින්වීම

සැලසුම් අංශය මගින් අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන වලට අදාලව සැලසුම් කිරීම, ව්‍යාපෘති වල පසු විපරම් කටයුතු මෙන්ම පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- අම◌ාත්‍යාංශය සඳහා වාර්ෂික මූලධන අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

- ඊට අදාළ ප්‍රගති සමාලෝචනය.
- ප්‍රගති වාර්තාව, වාර්ෂික කාර්යය සාධන වාර්තාව සහ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- නඩු සම්බන්ධ සංඛ්‍යා ලේඛන රැස් කිරීම සහ නඩු පිළිබඳ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම.
- ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ලබා ගැනීමට කටයුතු කිරීම.
- අධිකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ සහ ආංශික අධීක්ෂණ කමිටුවේ සහ පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- රජයේ සංවර්ධන වැඩසටහන් හා ප්‍රදර්ශන සම්බනධීකරණය
- තොරතුරු තාක්ෂණ ඒකකයේ කටයුතු අධීක්ෂණය.

## 5.6.2 ප්‍රගතිය 2016.01.01 සිට 2016.09.30 දක්වා

### 5.6.2.1 අය වැය ඇස්මේන්තු ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ මූලධන වියදම් ඇස්තමේන්තු 2016.08.15 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

### 5.6.2.2 ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම

a. 2016 වර්ෂයේ මූලධන වියදම් සඳහා අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්ම ජනාධිපති ලේකම් කාර්යාලයට, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයට, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට 2016.01.20 දින ඉදිරිපත් කරන ලදී.

b. 2016 අයවැය යෝජනා සඳහා ක්‍රියාකාරී සැලැස්ම 2016.04.07 වන දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

### 5.6.2.3 ප්‍රගති සමාලෝචනය

| කරුණ | සංඛ්‍යාව |
|---|---|
| මූලධන වියදම් සඳහා කාර්තුමය වශයෙන් සකස් කල ප්‍රගති වාර්තා ගණන | 03 |
| සංවර්ධන ව්‍යාපෘති සඳහා මාසිකව සකස් කල ප්‍රගති වාර්තා ගණන<br>(මහා පරිමාණ ව්‍යාපෘති 05, සුළු පරිමාණ 25 සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 351) | 09 |
| පැවැත්වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | 03 |
| පසු විපරම් කල සංවර්ධන ව්‍යාපෘති ගණන | 387 |

### 5.6.2.4 ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

| වාර්තාව | ආයතනය |
|---|---|
| ජාතික අයවැය චක්‍රලේඛ 6 /2015 අනුව සංවර්ධන ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය | ජාතික අයවැය දෙපාර්තමේන්තුවට මූල්‍ය ප්‍රගතිය දෙසතියකට වරක් සහ භෞතික ප්‍රගතිය මාසිකව වාර්තා කර ඇත |

| | |
|---|---|
| ජාතික අයවැය චක්‍රලේඛ 6 /2015 අනුව අනෙකුත් මූලධන වියදම් වල ප්‍රගතිය | ජාතික අයවැය දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා කර ඇත |
| දේශීය හා විදේශීය සංවර්ධන ව්‍යාපෘති සහ අයවැය යෝජනාවල ප්‍රගතිය | a. ව්‍යාපෘති කළමනාකරණ හා අධික්ෂණ දෙපාර්තමේන්තුවට, ජනාධිපති ලේකම් කාර්යාලයට හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට කාර්තුමය වශයෙන් වාර්තා කර ඇත<br>b. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව සඳහා තොරතුරු ඉදිරිපත් කර ඇත |
| දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට වාර්තා කර ඇත |

5.6.2.4.1 ව්‍යාපෘති කළමනාකරණ හා අධික්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය සඳහා පවත්වා ගෙන යන වෙබ් අඩවිය පළමු කාර්තු තුන සඳහා යාවත්කාලීන කර ඇත.

5.6.2.5 <u>වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම</u>

| ආයතනය | වාර්තාව | දිනය |
|---|---|---|
| ශ්‍රී ලංකා විනිශ්වයකාරවරුන්ගේ ආයතනය | * 2013 වාර්ෂික වාර්තාව | 2016.04.25 |
| අධිකරණ අමාත්‍යාංශය | 2015 කාර්ය සාධන වාර්තාව | 2016.05.26 |
| රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 2015 කාර්ය සාධන වාර්තාව | 2016.06.16 |
| මහා භාරකාර දෙපාර්තමේන්තුව | 2015 කාර්ය සාධන වාර්තාව | 2016.07.05 |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 2015 කාර්ය සාධන වාර්තාව | 2016.07.05 |
| නීතිපති දෙපාර්තමේන්තුව | 2014/2015 කාර්ය සාධන වාර්තා | 2016.08.02 |
| නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | 2012,2013,2014 සහ 2015 කාර්ය සාධන වාර්තා | 2016.08.10 |

* ශ්‍රී ලංකා විනිශ්වයකාරවරුන්ගේ ආයතනයේ 2014 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

5.6.2.6 **<u>පාර්ලිමේන්තු ප්‍රශ්න සහ ආංශික අධීක්ෂණ කමිටුවට අදාළ ප්‍රගතිය</u>**

| කරුණ | සංඛ්‍යාව |
|---|---|
| පිළිතුරු සැපයූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන | 11 |
| පැවැත්වූ නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම් ගණන | 07 |

5.6.2.7 <u>නඩු සම්බන්ධ සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙනයාම</u>

a. 2015 නඩු සම්බන්ධ වාර්ෂික සංඛ්‍යා ලේඛණ වාර්තාව සකස් කල අතර එහි සාරංශය පහත දැක්වේ.

| අධිකරණ | 2014 වර්ෂයෙන් ඉදිරියට ගෙනා නඩු සංඛ්‍යාව | 2015 වර්ෂයේ ගොනු කල නඩු සංඛ්‍යාව | 2015 වර්ෂය තුළ අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 2015 වර්ෂය අවසානයේ ඉතිරිවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 3,006 | 1,507 | 924 | 3,589 |
| අභියාචනාධිකරණය | 4,663 | 1,313 | 1,295 | 4,681 |
| පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ | 6,395 | 2,290 | 2,338 | 6,347 |
| මහාධිකරණය | 18,346 | 8,535 | 9,921 | 16,960 |
| දිසා අධිකරණ | 152,461 | 51,317 | 42,142 | 161,636 |
| මහේස්ත්‍රාත්අධිකරණ | 499,710 | 578,793 | 558,189 | 520,314 |
| කම්කරු විනිශ්චය සභා | 4,818 | 2,546 | 2,344 | 5020 |
| කාති අභියාචනා මණ්ඩලය | 184 | 82 | 112 | 154 |
| කාති උසාවි | 5,005 | 7,037 | 7,032 | 5,010 |
| එකතුව | 694,588 | 653,420 | 624,297 | 723,711 |

b. නඩු සම්බන්ධයෙන් කාර්තුමය වශයෙන් වාර්තා සකස් කරන අතර 2016.09.30 දක්වා නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛණ පහත පරිදි වේ.

| අධිකරණ | 2015 වර්ෂයෙන් ඉදිරියට ගෙනා නඩු සංඛ්‍යාව | 2016.01.01 සිට 2016. 09.30 දක්වා ගොනු කල නඩු සංඛ්‍යාව | 2016.01.01 සිට 2016. 09.30 දක්වා අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 2016.09.30 දිනට ඉතිරිවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 3,589 | 1,333 | 1,436 | 3,486 |
| අභියාචනාධිකරණය | 4,681 | 952 | 816 | 4,817 |
| පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ | 6,347 | 1,632 | 2,089 | 5,890 |
| මහාධිකරණය | 16,960 | 7,227 | 7,376 | 16,811 |
| දිසා අධිකරණ | 161,636 | 32,343 | 26,034 | 167,945 |
| මහේස්ත්‍රාත්අධිකරණ | 520,314 | 311,951 | 296,621 | 535,644 |
| කම්කරුවිනිශ්චය සභා | 5,020 | 1,872 | 1,844 | 5,048 |
| කාති අභියාචනා මණ්ඩලය | 154 | 80 | 59 | 175 |
| කාති උසාවි | 5,010 | 5,825 | 5,460 | 5,375 |
| එකතුව | 723,711 | 363,215 | 341,735 | 745,191 |

5.6.2.8 <u>ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරිම</u>

| | ව්‍යාපෘතිය | ඉදිරිපත් කල ආයතනය | දිනය |
|---|---|---|---|
| 01 | ගම්පොළ, රුවන්වැල්ල, මුලතිවු දිසා මහේස්ත්‍රාත් අධිකරණ සහ පස්සර මහේස්ත්‍රාත් අධිකරණය සහ මාන්කුලම්, කහටගස්දිගිලිය හා මැදවච්චිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ සහ කල්මුණේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව | 2016.08.10 |
| 02 | ජාතික නීති මධ්‍යස්ථානයක් පිහිටුවීම | KOICA ආයතනය | 2016.05.13 |
| 03 | රජයේ අධිනීතිඥවරුන් සඳහා ව්‍යවහාරික විද්‍යා පුහුණු පාඨමාලාව | KOICA ආයතනය | 2016.06.02 |
| 04 | අධිකරණ පියස ඉදිකිරිම | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 2016.06.09 |
| 05 | අධිකරණ පද්ධතියේ යටිතල පහසුකම් | විදේශ සම්පත් | 2016.10.14 |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධනය කිරීම | දෙපාර්තමේන්තුව | |
| 06 | අධිකරණ පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පූර්ව ශක්‍යතා වාර්තාව | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 2016.08.30 |
| 07 | අධිකරණ ක්ෂේත්‍රයේ ධාරිතාව ඉහළ නැංවීම | ආසියානු සංවර්ධන බැංකුව | 2016.09.20 |

5.6.2.9 <u>අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම</u>

| | කරුණ | අනුමත වූ දිනය |
|---|---|---|
| 01 | කොළඹ නව අධිකරණ පියස ඉදිකිරීමේ සැලසුම් සකස් කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම. | 2016.05.31 |
| 02 | අධිකරණ සඳහා නව යටිතල පහසුකම් ඉදිකිරීම (ගම්පොළ, රුවන්වැල්ල, මාන්කුළම, මුලතිව්, පස්සර අධිකරණ ගොඩනැඟිලි ඉදිකිරීම) | 2016.08.16 |

5.6.2.10 <u>රජයේ සංවර්ධන වැඩසටහන් හා ප්‍රදර්ශන සම්බනක්ධීකරණය</u>

a. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.07.30 වන දින පොළොන්නරුවේ රාජකීය විද්‍යාලයේ පවත්වන ලද නිල මෙහෙවර ජංගම සේවයේ අධිකරණ අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටියක් පැවැත්විම.
b. ගාල්ල දිස්ත්‍රික්කයේ නිල මෙහෙවර ජනපති ජනතා සේවයේ වැඩසටහනේ මේ වන විට සම්බන්ධිකරණ කටයුතු සිදුකෙරෙමින් පවති.

5.6.2.10 <u>තොරතුරු තාක්ෂණ කටයුතු</u>

අධිකරණ අමාත්‍යාංශයේ **වෙබ් අඩවිය සහ *lawnet* වෙබ් අඩවිය ප්‍රති නිර්මාණය කරමින් පවතින අතර එම කටයුතු 2016 දෙසැම්බර් මාසයේ අවසන් කිරිමට නියමිතය.**

## 5.6.3 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය

2016 අයවැය කථාව මඟින් පහත යෝජනා අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් ඉදිරිපත් කරන ලදි.

| යෝජනා අංකය | යෝජනාව | ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|---|
| 442 | ශ්‍රව්‍ය පටිගත කිරිම සහිත ස්වයංක්‍රීය නඩු ගොනු කළමනාකරණ පද්ධති පිහිටුවීම | 230.20 |
| 444 | දැනට පවත්නා පනත් සහ නීති පද්ධති ප්‍රතිසංස්කරණයන් සඳහා | 61.5 |
| 445 | අධිකරණ පුහුණු ආයතන ශක්තිමත් කිරීමට, නීතිපති දෙපාර්තමේන්තුවේ මෙන්ම නීති කෙටුම්පත් සම්පාදක හා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ධාරිතාව වැඩි කිරීම සඳහා | 190.6 |

## 5.6.3.1 යෝජනා 442

**ශ්‍රව්‍ය පටිගත කිරීම සහිත ස්වයංක්‍රීය නඩු ගොනු කළමනාකරණ පද්ධති පිහිටුවීම**

නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් පවතින අතර අධ්‍යනයකින් පසු පූර්ණ ස්වයංක්‍රීය පද්ධතියක් අධිකරණවල ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. 2016.09.30 වන විට ප්‍රගතිය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම | අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව සහ අධිකරණ අමාත්‍යාංශය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය සහ විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ 2016.05.25 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. |
| මෙහෙයුම් කමිටුවක් පත් කිරීම | එසේම මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ නියෝජිතයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කර ඇත. |
| අධිකරණ පූර්ණ ස්වයංක්‍රීයකරණය සඳහා අධ්‍යයනයක් සිදු කිරීම | අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීය කිරීම සඳහා අධ්‍යනයක් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයට මඟින් සිදු කිරීම සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 4.8ක ප්‍රතිපාදනයක් ලබා දී ඇත. මේ වන විට එම අධ්‍යයනය සඳහා සමාගම් විසින් ඉදිරිපත් කර ඇති ලංසු ඇගයීමට ලක් කරමින් පවතී. |
| ශ්‍රව්‍ය පටිගත කිරීම් පද්ධති ස්ථාපිත කිරීම | කොළඹ අධිකරණ කලාපයේ අධිකරණ ශාලා 35ක ශ්‍රව්‍ය පටිගත කිරීම් පද්ධති ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 120ක මුදලක් වෙන් කර ඇත. මේ වන විට ලංසු ඉදිරිපත් කරන ආයතන විසින් ස්ථාන පරීක්ෂණ අවසන් කර ඇති අතර 2016.11.10 වන දින ලංසු විවෘත කිරීමට නියමිතය. |
| නඩු කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම | අධිකරණ ශාලා 35ක නඩු කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය දෘඩකාංග මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇති අතර මේ වන විට ලංසු ඇගයීමට ලක් කරමින් පවතී |
| තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවීම | පද්ධතිය පාලනය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 9.9ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන ලබා දීමට නියමිතය. |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉලෙක්ට්‍රොණික නඩු ගොණු කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම | ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු සඳහා ස්ථාපිත ඉලෙක්ට්‍රොණික නඩු ගොණු කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීමට රුපියල් මිලියන 05 මුදලක් වෙන් කර ඇති අතර මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. |
| මාතර ස්ථාපිත ඉලෙක්ට්‍රොණික නඩුගොනු කිරීමේ පද්ධතිය | මාතර සිවිල් අභියාචන මහාධිකරණයේ රුහුණු විශ්ව විද්‍යාලය මඟින් ස්ථාපිත ඉලෙක්ට්‍රොණික නඩු ගොනු කිරීමේ පද්ධතියට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 5.2ක මුදලක් වෙන් කර ඇති අතර මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. |

## 5.6.3.2 යෝජනා 444

<u>දැනට පවත්නා පනත් සහ නීති පද්ධති ප්‍රතිසංස්කරණයන් සඳහා</u>

මේ යටතේ 2016.09.30 වන විට පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කොට ඇත

| | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | නීති සංශෝධනය හා නව නීති සම්පාදනය සඳහා නීති උපදේශකවරුන් දෙදෙනෙකු බඳවා ගැනීම | <u>මේනකා ලේකම්වසම් මෙනවිය</u><br>සිවිල් නඩු විධාන සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ දණ්ඩ නීති සංග්‍රහය යන නීති සංශෝධන සඳහා ගරු ඇමතිතුමා විසින් පත්කරන ලද විශේෂ කමිටු දෙකට පර්යේෂණ සහය දක්වන අතර අනෙකුත් නීති සංශෝධනයට සංකල්පමය පත්‍ර ගොනු කිරීමට කටයුතු කරමින් සිටියි.<br><br><u>නීතිඥ හර්ෂ ප්‍රනාන්දු මහතා</u><br>ආයෝජනය වාතාරණ ප්‍රතිසංස්කරණ (Investment ClimateReforms) යටතේ වන ව්‍යාපෘතියට අවශ්‍ය කටයුතු සඳහා උපදේශකත්වය ලබා දෙමින් සිටියි. |
| 02 | නීති පර්යේෂණ අංශයක් පිහිටුවීම | 2016.10.06 දින කොළඹ විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කළ අතර මේ වන විට පර්යේෂණ ඒකකය ස්ථාපිත කරමින් පවතී. |
| 03 | සමථ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම | සමථ පුහුණු නිලධාරින් සඳහා වැඩ මුළු පැවැත්විම, සමථ සභාපතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විම සහ පාසල් සමථ වැඩසටහන් පැවැත්විම සිදු කර ඇත. |
| 04 | ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පරිවර්තන ඒකකය පිහිටු විම | පරිවර්ථකයින් 04 දෙනෙකු බඳවාගෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු ගොනු පරිවර්තනය සඳහා ඒකකයක් පිහිටුවා ඇත |

## 5.6.3.3 යෝජනා 445

පහත පරිදි ආයතනයන්ගේ ධාරිතාවය වර්ධනය සම්බන්ධයෙන් 2016 .09.30 වන විට ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

| 01. රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ ධාරිතාව වර්ධනය කිරීම |
|---|
| a. නිලධාරින් දෙදෙනෙකු ඖෂධ විශ්ලේෂණය පිළිබඳ පාශ්චාත් උපාධි අධ්‍යනය සඳහා එක්සත් රාජධානියට යවා ඇත. |
| b. Micro X - ray Florescence Spectrometer උපකරණයේ ටේගු නිශ්කාශන කටයුතු සිදු කරමින් පවතී. |
| c. **Gas Chromatograph MS Withmulty mode auto sampler උපකරණ ලැබී ඇත. ණයවර ලිපියෙන් 80% ක් නිදහස් කර ඇත.** |

| | |
|---|---|
| d. | **Laptop 25 ක් මිලදී ගෙන ඇති අතර ඊට අදාල අවසන් ගෙවීම් කටයුතු සිදු කර ඇත.** |
| e. | **GC MSMS උපකරණය රේගුවට ලැබී ඇති අතර රේගු නිෂ්කාෂණ කටයුතු සඳහා ලේඛණ ලැබීමට නියමිතය.** |
| 02. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ පුහුණු ආයතනයේ ධාරිතාව වර්ධනය කිරීම | |
| **a.** | **දිවයින පුරා සිටින විනිශ්චයකාරවරයන් සඳහා ලැප්ටොප් ලබා දීමට මිල ගණන් කැඳවා** ඇති අතර මේ වන විට ලංසු ඇගයීමට ලක් කරමින් පවතී. |
| **b.** | **දත්ත පද්ධතියේ යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කර ඇත.** |
| c. | **ආයතනයේ වෙබ් අඩවියේ නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී.** |
| 03. නීතිපති දෙපාර්තමේන්තුවේ ධාරිතාව වර්ධනය කිරීම | |
| **a.** | **රජයේ අධිනීතිඥයන් 15 දෙනෙකු සඳහා පුහුණු** වැඩසටහනක් **2016.08.15 දින පවත්වන ලදී.** |
| **b.** | **රජයේ අධිනීතිඥයන් 04 දෙනෙකු විදේශ පුහුණු** වැඩසටහන් **සඳහා සහභාගී විය.** |
| c. | **නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පොත් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවා ඇත.** |
| 04. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ධාරිතාව වර්ධනය කිරීම | |
| නිළධාරීන් දෙදෙනෙකු අමරිකා එක්සත් ජනපදයට හා නිළධාරීන් තිදෙනෙක් එක්සත් රාජධානියට පුහුණු වැඩසටහන් සඳහ සහභාගි කරවා ඇත. | |

## 5.7 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු, උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය, විනිසුරු පුහුණු ආයතනය සහ නීති ආධාර කොමිෂන් සභාව යන ව්‍යවස්ථාපිත ආයතන තුනත්, අමාත්‍යංශ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන සමථ මණ්ඩල කොමිෂන් සභාවත්, අධිකරණ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයත් අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ වන මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වල ගිණුම් විගණනය කිරීම අභ්‍යන්තර විගණන අංශය විසින් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය සහකාර නිලධාරින් 05 ක්, සංවර්ධන නිලධාරින් 05ක්, සහ කළමනාකරණ සහකාර නිලධාරින් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම නිලධාරින් ක්‍රම විගණනය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව ඉහත සඳහන් ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබන අතර 2016 ජනවාරි 01 දින සිට 2016 සැප්තැම්බර් 30 දින දක්වා මහාධිකරණ 08 ක්, දිසා/මහේස්ත්‍රාත් අධිකරණ 09ක්, දිසා අධිකරණ 07ක්, මහේස්ත්‍රාත් අධිකරණ 10ක්, කම්කරු විනිශ්චය සභා 01 සිවිල් අභියාචන මහාධිකරණ 01ක්, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන19ක් සහ විශේෂ විමර්ෂණ 02ක් ආදී වශයෙන් සම්පූර්ණ විගණන පරික්ෂණ 58ක් සිදුකර ඇත.

2016 වර්ෂය තුළ විගණන පරීක්ෂණ 87ක් සිදු කිරීමට සැලසුම් කර තිබූ අතර 2016.09.30 දින වන විට ඉන් පරීක්ෂණ 58 ක් නිමකර ඇත. ඒ අනුව සැලසුම් කළ විගණන පරීක්ෂණවලින් 67% ක් මේ වන විට අවසන් කර ඇත.

# 06. අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

## 6.1 නීතිපති දෙපාර්තමේන්තුව

### දැක්ම

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරිම සඳහා ඵලදායි ලෙස ප්‍රතිවාර දැක්විමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරිම.

### මෙහෙවර

- ❖ ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරිම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරිම.

- ❖ සාමාජීය සහ ආර්ථික සෞභාග්‍යය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්විමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතිව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතින් ක්‍රියාත්මක කිරිමට නිතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

### අරමුණ

- ❖ ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලු නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දි සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරිම.

### 6.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් නීතිපති තුමා කටයුතු කරයි. "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13, 2015.09.21 දරණ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයට, පළාත් සභාවලට රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහය ලබාදෙයි. එකී සහය ලබාදීමේදී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනෙකුත් අධිකරණ වල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩු වලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශ වලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරන ඊ්ආර් ඒකකය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මකව පවතී.

## 6.1.2 නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කාරණා, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතනවලට උපදෙස් දීම.

- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.

- නව නිති සම්මත කිරීමේදි හා පවතින නිති සංශෝධනය කිරීමේදි අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදී, දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- ➢ අපරාධ නඩු අංශය
- ➢ සිවිල් අංශය
- ➢ රාජ්‍ය නීතිඥ අංශය
- ➢ ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- ➢ සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මකවේ.
එම ඒකක වන්නේ;

- ➢ මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මෙම අංශයයි)
- ➢ ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියාකිරීම පිණිස පිහිටුවා ඇත)
- ➢ ඊ්ආර් ඒකකය (හදිසි අවස්ථා නියෝග සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරයි)
- ➢ ආගමන සහ විගමන ඒකකය (ආගමන හා විගමන පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරයි)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත.

### 6.1.3 එක් එක් අංශයන්හි 2016.01.01 සිට 2016.09.30 දක්වා කාර්ය සාධනය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

| ශාඛාව | විවෘත කල ලිපිගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කල ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කල ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| *සිවිල් අංශය | **2,003** | **-** | **07** | **-** | **182** |
| අපරාධ නඩු අංශය | **3,504** | **1,732** | **961** | **226** | **2,919** |
| *රාජ්‍ය නීතිඥ අංශය | **51** | **-** | **-** | **-** | **955** |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | **380** | **-** | **-** | **-** | **45** |
| සංස්ථා අංශය | **1,734** | **-** | **-** | **-** | **1,431** |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | **2,740** | **299** | **368** | **382** | **1,049** |
| මහජන පෙත්සම් අංශය | **517** | **-** | **-** | **-** | **129** |
| **එකතුව** | **10,929** | **2,031** | **1,336** | **608** | **6,710** |

* සිවිල් අංශය මඟින් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සලකන්න.

### 6.1.4 නීතිපති දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවල ප්‍රගතිය

| ව්‍යාපෘතිය | 2016 වර්ෂයට ප්‍රතිපාදන | 2016.09.30ට මූල්‍ය ප්‍රගතිය | | 2016.09.30 දිනට භෞතික ප්‍රගතිය | 2016.12.31ට පුරෝකථනය | |
|---|---|---|---|---|---|---|
| | | අගය (රු.මි.) | % | | අගය (රු.මි.) | % |
| නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 530 | 26.9 | 5% | 12% | 220 | 42% |
| මන්නාරම නිල නිවාසය ඉදිකිරීම | 20 | 0.99 | 5% | 30% | 10 | 50% |
| වවුනියාව නිල නිවාසය ඉදිකිරීම | 10.80 | 0.91 | 8.5% | 80% | 5 | 46% |
| එකතුව | 560.8 | 28.8 | 5% | | 235 | 42% |

### 6.1.5 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 671,140,000 | **474,313,121** | **70%** | 96% |
| ප්‍රාග්ධන වියදම | 606,300,000 | **45,910,169** | **8%** | 70% |
| **එකතුව** | **1,277,440,000** | 520,223,290 | 41% | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.2 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**දැක්ම**

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

**මෙහෙවර**

රාජ්‍ය ප්‍රතිපත්තීන්, නීතිය බවට පරිවර්තනය කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම

### 6.2.1 හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13, 2015.09.21 දරණ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන අනුනීති  ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගිවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරි ඇති රාජකාරි කටයුතු වේ. මෙම  දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන තවත් රාජකාරියකි.

### 6.2.2 පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය

(1) නව නීති පැනවීම  සඳහාද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම
(2) අනු නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී)අනු නීති කෙටුම්පත් කිරීම
(3) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම
(4) පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම
(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝදනය කිරීම

පනත්, උපකාරක නීති, පලාත් සභා ප්‍රඥප්ති සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් කිරීමේ දී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීමද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීමයි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව රජයේ  අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ

වැඩසටහන සකස්වී තිබීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

## 6.2.3 2016.01.01 සිට 2016.09.30 දක්වා ප්‍රගතිය

### 6.2.3.1 වැඩ නිම කර ඇති ගොනුවල විස්තර - 2016

| රාජකාරියේ ස්වභාවය | 2016.01.01 ට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව | කාලය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු ඉල්ලුම් සංඛ්‍යාව | එකතුව | 2016.09.30 දිනට කෙටුම්පත් සකස් කර අදාළ පාර්ශවයන් වෙත ලබා දුන් සංඛ්‍යාව | [illegible] ලද ගොනු | 2016.09.30ට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 194 | 59 | 253 | 42 | 13 | 198 |
| නියෝග සංශෝධන කිරීම (උපකාරක නීති) | 124 | 102 | 226 | 77 | - | 149 |
| පළාත් සභා ප්‍රඥප්ති | 23 | 3 | 26 | 1 | - | 25 |
| එකතුව | 341 | 164 | 505 | 120 | 13 | 372 |

### 6.2.3.2 වැඩ නිම කර ඇති ගොනුවල විස්තර - 2016

| | |
|---|---|
| අණ පනත් කෙටුම්පත් කිරීම - මූලික හා සංශෝධන නීති (භාෂාත්‍රයෙන් යවා ඇති සහ සම්මත වූ පනත්) සම්මත වූ පනත් | 16 |
| භාෂාත්‍රයෙන් යවා ඇති පනත් | 26 |
| එකතුව | 42 |

*** අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාවේ උපදෙස් පරිදි පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් සම්බන්ධ කටයුතු තාවකාලිකව නතර කර ඇත.**

### 6.2.3.3 2016.01.01 සිට 2016.09.30 දිනට අවසන් කර පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනත්

| | | |
|---|---|---|
| 01 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 50/2015 |
| 02 | ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 46/2015 |
| 03 | සේවකයින්ගේ ජාතික අවම වේතන පනත | එල්.ඩී.ඕ. 51/2015 |
| 04 | සේවකයින්ගේ අයවැය සහන දීමනාව පනත | එල්.ඩී.ඕ. 27/2015 |
| 05 | කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත | එල්.ඩී.ඕ. 21/2010 |
| 06 | ක්ෂුද්‍ර මූල්‍ය පනත | එල්.ඩී.ඕ. 32/2012 |
| 07 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත | එල්.ඩී.ඕ. 04/2016 |
| 08 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 33/2013 |

| | | |
|---|---|---|
| 09 | සමථ මණ්ඩල (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 60/2015 |
| 10 | හෝමියෝපති පනත | එල්.ඩී.ඕ. 46/2005 |
| 11 | ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත | එල්.ඩී.ඕ. 28/2014 |
| 12 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත | එල්.ඩී.ඕ. 04/2015 |
| 13 | මුල්‍ය කළමණාකරණ (වගකීම) (සංශෝධන) පනත | එල්.ඩී.ඕ. 16/2016 |
| 14 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම, කර්තව්‍යය ඉටුකිරීම) පනත | එල්.ඩී.ඕ. 32/2016 |
| 15 | සත්ව ආහාර පනත | එල්.ඩී.ඕ. 69/2006 |
| 16 | මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විශේෂ ) සංශෝධන පනත | එල්.ඩී.ඕ. 41/2015 |

### 6.2.3.4 <u>2016.09.30 දිනට වැඩ අවසන් කළ පනත් කෙටුම්පත්</u>

| | |
|---|---|
| 17 | විදේශ විනිමය කළමනාකරණ (සංශෝධිත) පනත් කෙටුම්පත |
| 18 | ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ බලතල පැවරීමේ (සංශෝධිත) පනත |
| 19 | වෛද්‍ය (සංශෝධිත) ආඥාපනත |
| 20 | වැටුප් මණ්ඩල (සංශෝධිත) පනත |
| 21 | ඉංජිනේරු සභාව පිහිටුවීම |
| 22 | විශ්ව විද්‍යාල පනත |
| 23 | ථෙරවාදි භික්ඛු කතිකාවත ලියාපදිංචි කිරිමේ පනත |
| 24 | විහාර දේවාලගම් (සංශෝධිත) ආඥාපනත |
| 25 | බුද්ධිමය දේපල (සංශෝධිත) පනත |
| 26 | විගණන පනත් කෙටුම්පත |
| 27 | පළාත් සභා මැතිවරණ (සංශෝධන) |
| 28 | පළාත් පාලන මැතිවරණ (සංශෝධන) |
| 29 | නීති කොමිෂන් සභාව (සංශෝධන) පනත |
| 30 | ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන පනත) |
| 31 | තිරසාර සංවර්ධන පනත |
| 32 | අපරාධ නඩු විධාන (සංශෝධන) පනත |
| 33 | ඉඩම් (අන්සතු කිරීමේ සීමාවන්) |
| 34 | වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද |
| 35 | අගය එකතු කළ බද්ද |
| 36 | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| 37 | විසර්ජන (සංශෝධන) පනත |
| 38 | සත්ව (සංශෝධන) පනත |
| 39 | දිවි නැගුම (සංශෝධන) පනත |
| 40 | ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව (සංශෝධන) පනත |
| 41 | අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු අවලංගු කිරීමේ (විශේෂ විධි විධාන) පනත |
| 42 | අපරාධ නඩු විධාන සංග්‍රහයේ 431, 432 වගන්ති සංශෝධනය |

**6.2.3.5** **දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

- **ඉතිරිව ඇති සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 05 පිරවීමට අදාළ සියළු කටයුතු නිම කර ලකුණු රාජ්‍ය සේවා කොමිෂම වෙත යවා ඇති අතර 2016 නොවැම්බර් මස සිට ඔවුන් වෙත පත්වීම් ලිපි ලැබෙතැයි අපේක්ෂා කෙරේ.**
- **භාෂා පරිවර්තක නිලධාරීන් 23 ක් බඳවා ගැනීමට අදාළ විභාගය 2016 සැප්තැම්බර් 4 දින විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.**
- **ලේඛණ සහකාර තනතුර සඳහා නිලධාරීන් 08ක් හා සංස්කාරක තනතුර සඳහා නිලධාරීන් 08ක් 2016.09.15 දින සිට බඳවා ගැනීමට පත්වීම් ලිපි නිකුත් කර ඇත.**
- **ජ්‍යෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන්ගේ තනතුරු පිරවීමට කණිෂ්ඨ නිලධාරීන් නියමිත සේවා කාලය සම්පූර්ණ වන තෙක් සිටිය යුතු බැවින් එතෙක් එය සිදු කළ නොහැක.**

**6.2.3.6 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 86,560,000 | 54,670,000 | 63% | 95% |
| ප්‍රග්ධන වියදම | 31,300,000 | 7,570,000 | 24% | 83% |
| එකතුව | 117,860,000 | 62,240,000 | 53% | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.3 නීති කොමිෂන් සහා දෙපාර්තමේන්තුව

1969 අංක 3 දරණ නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

දැක්ම

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

මෙහෙවර

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

### 6.3.1 අරමුණු සහ කාර්යයන්

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කර ගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.
II. නීතියේ විෂමතා නැති කිරීම.
III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.
IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.
V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.
VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.
VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.
VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.
IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.
X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.
XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

### 6.3.2 2016.01.01 සිට 2016.09.30 දක්වා ප්‍රගතිය

| 1. ත්‍රස්තවාදී පනතෙන් ජාතික ආරක්ෂාව සුරැකීම | |
|---|---|
| **පසුබිම** | ත්‍රස්තවාදී ක්‍රියා හඳුනාගැනීම, වගකීම් ආකාර, අත්අඩංගුවට ගැනීමේ බලය, ඇතුළු වීමේ බලය, සෝදිසි සහ අල්ලා ගැනීමේ බලය, රැකවරණ නියෝග, නඩු විභාග පටිපාටිය, පාපොච්චාරණ, නඩු විභාග සහ අභියාචනා සඳහා ප්‍රමුඛත්වය, ඒකාබද්ධ වගකීම, නිලධාරීන් ආරක්ෂා කිරීම යනාදිය. |
| **වත්මන් තත්ත්වය** | 2016.02.17 වන දින අවසාන කරන ලද පනත් කෙටුම්පත ගරු අධිකරණ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. ඊට අදාළ විශේෂ උනන්දුවක් ඇති අය සමග රැස්වීමක් අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර ආරක්ෂක අමාත්‍යාංශය සමග වෙනමම පනත් කෙටුම්පතක් සෑදීමට තීරණය කරන ලදී. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ද සංගමයේ සාමාජිකයෙකි. |
| 2. දැනට පවතින දික්කසාදය, රැකවරණය සහ දික්කසාද දීමනා නීතිය සඳහා සංශෝධන | |
| **පසුබිම** | හරිගස්වා ගත නොහැකි විවාහ බිඳවැටීම් සම්බන්ධයෙන් වන විට, දික්කසාදය, දික්කසාද දීමනා සහ රැකවරණය පිළිබඳව දැනට |

| | |
|---|---|
| | පවතින නීති ආඥා පනත්, එම කරුණු පහසුවෙන් අවබෝධ කර ගත හැකි ලෙස ක්‍රමානුකූලව සකසා එකී නීති ආඥා පනත් සියල්ලම එකට එකතු කර එක් ආඥා පනතක් ලෙස සංග්‍රහගත කිරීම.<br>• පොදු එකඟතාවක් ඇති අවස්ථාවක්.<br>• එක් පාර්ශවයකට දික්කසාදය අවශ්‍ය නෙවෙන, සුහද කැමැත්ත් නොමැති අවස්ථාවක්.<br>රැකවරණය: දරුවාගේ වැඩි උනන්දුවට.<br>දික්කසාද දීමනා:සාධාරණ සහ යුක්ති සහගත අධිකරණ බලය.<br>නඩත්තු: අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයකට නොව දිස්ත්‍රික් අධිකරණයකට පැවරිය යුතු අතර ඊට ඌනපූරකව එකතු කළ බලය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් කිරීම සහ දඩුවම් පිණිස වන බලය දිස්ත්‍රික් අධිකරණය වෙත පැවරිය යුතුය. |
| **වත්මන් තත්ත්වය** | 2016.06.17 දින රැස්වීමේදී පනත් කෙටුම්පත සාකච්ඡා කර සකස් කරන ලදී. දැනට එය අවසාන කර නැත. |
| 3. 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතට සහ විශේෂයෙන්ම එහි 11 වන වගන්තියට සංශෝධන. | |
| **පසුබිම** | ළමා පැහැරගෙනයාම සම්බන්ධ මූර්තිත අපරාධවලට මුහුණ දීමට |
| **වත්මන් තත්ත්වය** | නව මාතෘකාවක් ලෙසට සාකච්ඡා කිරීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කොට ඇත. |

### 6.3.3 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (235-01-01)

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 14,860,000 | 9,224,315 | 62% | 81% |
| ප්‍රාග්ධන වියදම | 1,800,000 | 940,214 | 52% | 90% |
| **එකතුව** | **16,660,000** | **10,164,529** | **60%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.4 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**දැක්ම**

සාධාරණ සහ නීති ගරුක සමාජයක් ගොඩනැගීම.

**මෙහෙවර**

අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා ක්ෂේත්‍රයන් සම්බන්ධ විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශක සේවාවන් සැපයීම.

### 6.4.1 කාර්යයන්


ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා රසායනාගාරය වේ. ආහාර විද්‍යා අංශය, ආහාර හා මධ්‍යසාර, කිරි සහ ජලය යනුවෙන් වූ විද්‍යා හතරකින් ද අධිකරණ විද්‍යා අංශය ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය සහ ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය අංශය, මස්තු විද්‍යා හා DNA, අධිකරණ ධූලක විද්‍යා, සැක කටයුතු ලේඛන අංශය, විවිධ අංශය යනුවෙන් ප්‍රධාන අංශ හතකින්ද යනුවෙන් අනු අංශ 11කින් සමන්විත වේ. මෙය සේවාවන් සඳහා වෙන්වූ දෙපාර්තමේන්තුවක් වන අතර උසාවි, පොලිස්, රේගුව, සුරාබදු, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය, වරාය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂණයන්ට ලක් කිරීම සහ ඒවා පිළිබඳ වාර්තා නිකුත් කිරීම කරනු ලැබේ. මීට අමතරව විවිධ රාජ්‍ය, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය, අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශවල තත්වය පිළිබඳ පරීක්ෂා කරනු ලබන අතර ශ්‍රී ලංකා රේගුව යොමු කරන ආදර්ශ තත්ත්වය සහ තීරුබදු වර්ගීකරණය යන කරුණු දෙකම උදෙසා පරීක්ෂා කරනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කිරීම හා වාර්තා කිරීමද මෙම දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකාර ඖෂධ පනත, තහනම් පිහි පනත, මෝටර් වාහන පනත, අපරාධ නඩු විධාන සංග්‍රහය සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ සිටින විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විද්‍යාඥයින් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදු කරයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

## 6.4.2 2016.01.01 සිට 2016.09.30 දක්වා ප්‍රගතිය

| අංශය | 2016.01.01 දින ඉතිරි නඩු සංඛ්‍යාව | ලැබී ඇති නඩු සංඛ්‍යාව | වාර්තා කල නඩු සංඛ්‍යාව | 2016.09.30 දක්වා වාර්තා නොකල නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය අංශය | 617 | **5,721** | 5,082 | **1,256** |
| ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය | 379 | 403 | 370 | **412** |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය | 162 | 289 | 284 | **167** |
| අධිකරණ ධූලක විද්‍යා අංශය | 1,065 | 1,623 | 1,581 | **1,107** |
| අධිකරණ මස්තු විද්‍යා අංශය | 1,284 | 1,018 | 871 | **1,431** |
| සැක කටයුතු ලේඛණ අංශය | 266 | 566 | 589 | **243** |
| අධිකරණ විද්‍යා විවිධ අංශය | 147 | 244 | 247 | **144** |
| ප්‍රධාන කාර්යාලය (මත්පැන්) | 01 | 1,561 | 1,517 | **45** |
| මධ්‍යසාර හා දුම්කොළ | 23 | 1,809 | 1,753 | **79** |
| කුරුණෑගල (මත්පැන්) | 0 | 1,904 | 1,898 | **06** |
| ආහාර පනත යටතේ ආහාර සාම්පල | 07 | 6,713 | 6,662 | **58** |
| විවිධ ආහාර | 04 | 1,039 | 1,028 | **15** |
| **එකතුව** | **3,955** | **22,890** | **21,882** | **4,963** |




### 6.4.3 රසායනාගාර ප්‍රතීකකරණය

විද්‍යාගාර වල වැඩ කටයුතු ISO 17025 අනුව සිදු කෙරෙන්නේද යන්න පිළිබඳව අධීක්ෂණය සඳහා විශේෂඥයින් (Assessors) පැමිණි අතර විද්‍යාගාර 09 ටම ප්‍රතීකකරණය ලබා දිය හැකි බවට නිර්දේශ කර අනුමැතිය සඳහා ශ්‍රී ලංකා ප්‍රතීකකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

### 6.4.4 හැකියා වර්ධනය

- **නිලධාරීන් දෙදෙනෙකු අධිකරණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය හදාරා පැමිණ ඇති අතර එක් නිලධාරියෙකු අධිකරණ ප්‍රක්ෂිප්ත විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය එක්සත් රාජධානියෙහි හදාරමින් සිටියි.**
- **තවත් නිලධාරිනියන් දෙදෙනෙකු ඖෂධ විශ්ලේෂණය පිළිබඳ පශ්චාත් උපාධිය එක්සත් රාජධානියෙහි හදාරමින් සිටියි.**
- **දේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 28 දෙනෙකු මේ වන විට යොමු කර ඇත.**

**6.4.5 අංකිත බහුමාධ්‍ය අපරාධ විමර්ශන විද්‍යාගාරය සඳහා මේ වන විට අවශ්‍ය උපකරණ ලබා දී ඇති අතර පුහුණුව ලබා දෙමින් සිටියි.**

**6.4.6 DNA රසායනාගාරයේ ධාරිතවය පුළුල් කිරීම**

- Bone විශ්ලේෂණ කටයුතු ආරම්භ කර ඇත.
- Mitochondrial විශ්ලේෂණ කටයුතු සඳහා කොරියානු විශේෂඥයින්ගේ සහාය ඇතිව නව ක්‍රම වේද දියුණු කරමින් පවතින අතර නිලධාරින් කොරියාවේදී සහ ශ්‍රී ලංකාවේදී පුහුණු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

**6.4.7 ICTA ව්‍යාපෘතිය**

- දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කර ඇත.

6.4.8 පළතුරු එළවළු වල පලිබෝධනාශක ශේෂ විශ්ලේෂණය

- පළතුරු සහ එළවළු වල අඩංගු පලිබෝධනාශක ශේෂ විශ්ලේෂණය අගෝස්තු මස ආරම්භ කර ඇත. පළමු නියමු අදියර දඹුල්ලෙන් ආරම්භ කර ඇත.

**6.4.8 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (233-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු.) | ප්‍රතිශතය (%) | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම් කොරියානු ව්‍යාපෘති** | **342,000,000** | **115,389,224** | **34%** | **100%** |

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 245,300,000 | 170,534,007 | **70%** | **100%** |
| ප්‍රාග්ධන වියදම | 67,200,000 | 16,755,697 | **25%** | **100%** |
| **එකතුව** | **312,500,000** | **187,289,704** | 60% | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.5 මහා භාරකාර දෙපාර්තමේන්තුව

**<u>දැක්ම</u>**

පරිත්‍යාගශීලි දානපතියන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය අනුව විවිධ කාර්යයන් සඳහා යෙදවීමට පරිත්‍යාගකරන ලද මුදල්/දේපළ අදාළ ස්ථාපකවරුන්ගේ ද තෙස්තමේන්තුකරුවන් ගේ ද පොදු මහජනතාව ගේ ද අභිලාෂයන් සහ අවශ්‍යතාවයන් සපිරෙන පරිද්දෙන් නෛතික රාමුවක් තුළ සැමට උපරිම ප්‍රතිලාභයක් සලසමින් විශ්වාසනීය භාරකරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම.

**<u>මෙහෙවර</u>**

දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද දේපළ, බූදල්, වන්දි සහ මුදල් වෘත්තීමය දැනීම සහ නිපුණතාවය මත පරිපාලනය, කළමනාකරණය සහ ආයෝජනය කරමින් ඒවායේ අර්ථලාභීන්/ උරුමකරුවන්/ යැපෙන්නන්/ ලබන්නන් හට විශ්වාසනීය, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබාදීම.

### 6.5.1 <u>කාර්යභාරය</u>

මහා භාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

1. සාමාන්‍ය භාරකරුවකු, රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
2. දේපළ රැස් කිරීමේ නියෝග යටතේ දේපළ රැස් කිරීම.
3. බාලවයස් කරුවකු ගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
4. සිහිවිකල් පුද්ගලයකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
5. නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති "භාරකාර මණ්ඩලය" මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී).
6. විදේශගත වූ ශ්‍රී ලාංකිකයකු ගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
7. සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
8. ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකු ගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
9. අධිකරණ සංවිධාන පනත මත දේපළ රැස්කරන්නකු ලෙස කටයුතු කිරීම.
10. වරදකට සිරගතවූවකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.
11. ඕනෑම පුද්ගලයෙකු ගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.
12. විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

### 6.5.2 උක්ත කාර්යයන් හැර වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැන ගේ මැදිහත්වීම

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව පැවරී ඇති වෙනත් කාර්යයන්.

- 1988 අංක 61 දරණ පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම කාර්යක්ෂම සහ නිවැරදි ලෙස සිදු කිරීම සහ එකී කාර්යය පහසු කිරීම සඳහා අදාළ සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.
- 1944 අංක 42 දරණ විහාර ඉඩම් (වන්දි) ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
- 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.
- 1973 අංක 28 දරණ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

### 6.5.3 මහා භාරකාරතැනගෙන් සැලසෙන සේවාවන්

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව/අන්තිම කැමතිපත්‍රවල ඇති අරමුණු අනුව/අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය කරනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු.
- විවිධ හේතුන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්චල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා ගේ නිර්දේශ මත බෙදාහැරීම.
- භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ දෙදෙනෙකු හා සභාපති පත්කිරීම.
- විදේශ වන්දි බෙදාහැරීම.
- විහාර වන්දි බෙදාහැරීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබාදීම. (2016 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුල රු: 12,579,045.83ක මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත).

## 6.5.4 භාර බූදල් සංඛ්‍යාව

2016.09.30 දිනට දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාර සංඛ්‍යාව 1,061 ක් වන අතර, දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන බූදල් සංඛ්‍යාව 140 කි. භාර ආරම්භ කළ දානපතින් ගේ අරමුණු අනුව අදාල කාර්යයන් ඉටු කරනු ලැබේ.

| වර්ෂය | ක්‍රියාත්මක කරන භාර සංඛ්‍යාව | ක්‍රියාත්මක කරන බූදල් සංඛ්‍යාව |
|---|---|---|
| 2011 | 981 | 119 |
| 2012 | 999 | 126 |
| 2013 | 1019 | 130 |
| 2014 | 1034 | 134 |
| 2015 | 1044 | 137 |
| 2016.09.30 | 1061 | 140 |

## 6.5.5 රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති මුදල් ප්‍රමාණය

මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති සහ පිහිටුවා ඇති භාර හා බූදල් වලට අදාලව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරනු ලබන මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු පහත පරිදි රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

| වර්ෂය | මුදල (රු:) |
|---|---|
| 2011 | 3,783,187.40 |
| 2012 | 6,543,360.52 |
| 2013 | 6,396,102.51 |
| 2014 | 6,675,487.77 |
| 2015 | 10,188,334.08 |
| 2016.09.30 | 12,579,045.83 |

2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| **විස්තරය** | **2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු)** | **2016.09.30 දිනට වියදම (රු)** | **2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය** | **2016.12.31 දිනට පුරෝකථන වියදම** |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 45,280,000 | 32,910,308 | **73%** | 95% |
| ප්‍රාග්ධන වියදම | 2,080,000 | 1,019,204 | **47%** | 90% |
| **එකතුව** | **47,360,000** | **33,929,512** | 72% | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.6 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**දැක්ම**

නිශ්චල දේපල සම්බන්ධයෙන්වූ ණය ගනුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙළක් සලසාදීම.

**මෙහෙවර**

උකස්කරයක්, පොරෙන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් ණය මුදලක් සඳහා ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේදොර ඉඩකඩම් ආදි වූ නිශ්චල දේපලක් ණය සහනදායි අන්දමට වාරික මඟින් හා අඩු පොලී අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වාදීම.

**අරමුණ**

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි ව අයවිය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

6.6.1 හැඳින්වීම

1941 අංක 39 දරණ ණය සහනදායක අඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය මඟින් මුදල් හිමියන් විසින් අත්නෝමතික ලෙස ණය ගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි, මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණය හිමියන්ටද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපල පිළිබඳව ණය කරුට පහසු වන්නා වූත් ණය හිමි පිළිගනු ලබන්නා වූත් කොන්දේසි මත එම දේපල බේරා ගැනිමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටුකරනු ලැබේ. ගැසට් හා නෙතිසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් වන බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් එයින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

මෙම මණ්ඩලය අමාත්‍යවරයා පත් කරනු ලබන සමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් සමාජිකයෙකු මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි. මෙම මණ්ඩලයේ රාජකාරී කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේදි එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළඹෙන ගිවිසුම් මිස ණය සහන දායක මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවෙයි. එසේ වුවද අසාධාරණ පොලී ප්‍රමාණයන් අඩු කිරිමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණය කරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කල නොතීසිය පරිදි විභාගයට නොපැමිණිය හොත් ඒක පාක්ෂික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කරනු ලබයි.

එසේ වුවද, එම ක්‍රියාමාර්ග ගනු ලබන්නේ, ලියාපදිංචි තැපැලෙන් සහ ග්‍රාම නිලධාරි මඟින් අවස්ථාවෝචිත පරිදි ණය හිමි වෙත දැනුම්දී ණය හිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යයි මණ්ඩලයට නිශ්චිත ලෙස එත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවකදී එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතුවේ. වෙනත් අධිකරණයක මේ පිළිබඳ

විභාගයක් පැවැත්වෙන අවස්ථාවකදී මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුව හොත් ණය මුදල් බේරුම් කිරීම සඳහා අවුරුදු 10ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබාදීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩු කිරීමෙන් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක අඥාපනත යටතේ අධිකරණයට බලතල ලබා දී ඇත.

## 6.6.2 2016.01.01 සිට 2016.09.30 දක්වා කාර්ය සාධනය

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව ( 2016.01.01) | 834 |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | 261 |
| සමාලෝචනය සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 22 |
| **මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව** | **1,117** |
| සමථයට පත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 140 |
| නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 122 |
| සමාලෝචනය කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 27 |
| රෝලෙන් ඉවත් කරන ලද නඩු සංඛ්‍යාව | 01 |
| සහතික නිකුත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 06 |
| ඉල්ලා අස්කර ගත් ඉල්ලුම් පත් සංඛ්‍යාව | 07 |
| **පියවරගත් මුළු සංඛ්‍යාව** | **303** |
| **වසර අවසානයේ අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව** | **814** |

## 6.6.3 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (231-01-01)

| **විස්තරය** | **2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු)** | **2016.09.30 දිනට වියදම (රු)** | **2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය** | **2016.12.31 දිනට පුරෝකථන වියදම** |
|---|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 15,890,000 | 10,504,408 | 66% | 95% |
| ප්‍රාග්ධන වියදම් | 800,000 | 371,000 | 46% | 90% |
| **එකතුව** | **16,690,000** | **10,875,408** | **65%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.7 සමථ මණ්ඩල කොමිෂන් සභාව

### 6.7.1 හැඳින්වීම

1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මඟින් සමථ මණ්ඩල කොමිෂන් සභාව පිහිටුවන ලදී. ඒ යටතේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සඳහාම සමථ මණ්ඩල පිහිටුවීම ආරම්භ කරන ලදි. මෙය අධිකරණ ක්‍රියාවලිය පහසු කරලීමේ අරමුණින් ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස අධිකරණ වෙත ඉදිරිපත් වන ආරවුල් වලින් සුළු ආරවුල් විසඳාලීම උදෙසා සකස් කරන ලද ඉතා වටිනා වැඩපිළිවෙලක් ලෙස හඳුන්වා දිය හැකිය. මේ වන විට ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **329** ක පිහිටුවා ඇති සමථ මූල මණ්ඩලවල සමථකරුවන් 8,266 **ක පමණ** පිරිසක් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබයි.

සමථ මණ්ඩල කොමිෂන් සභාව සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් පත්කිරීමේ බලය අතිගරු ජනාධිපතිතුමා සතුවෙයි. පනතේ සඳහන් පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සාමාජිකයින් පස්දෙනාගෙන් තිදෙනෙකු උපරිමාධිකරණවල විශ්‍රාමික විනිශ්වයකාරවරුන් විය යුතුය. සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථ කාර වරුන් පත් කිරීම, මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය වැනි සමථ මුල මණ්ඩලවලට අදාල පරිපාලනමය කටයුතු සිදුකරනු ලබයි.

සමථකරණ ක්‍රියාවලිය මඟින් පාර්ශවකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස සමථකරුවන් කටයුතු කරනු ලබයි. සමථ මුලමණ්ඩල වලට ලැබෙන අරවුල් ප්‍රමාණය මත සමථ මූල මණ්ඩල වල කාර්යක්ෂමතාවය මනිනු ලබයි.


තමන්ගේ ගැටළු විසඳීමට පහසු හා අඩු වියදම් යාන්ත්‍රණයක් ලෙස ප්‍රජාව විසින් සමථකරණය පිළිගැනීමෙන් පසු ප්‍රජාව සමථකරණය දෙසට යොමු විම ඉහළ ගොස් ඇත. එමනිසා සෑම වසරකදීම ලක්ෂයකට අධික ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙතට යොමු වේ.

### 6.7.2 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා ප්‍රගතිය

| විස්තරය | ආරවුල් සංඛ්‍යාව |
|---|---|
| සමථ මණ්ඩල වෙත යොමු කිරීම් | 115,780 |
| සමථයට පත් කිරීම් | 46,443 |
| ප්‍රතිශතය | 40% |

- 2016.01.01 දින සිට 2016.09.30 වන විට පස්දින වැඩමුළු 51ක් පවත්වා සමථ කාරවරුන් 2,304 කට ආසන්න ප්‍රමාණයක් පුහුණු කර ඇත.
- වැඩසටහන් සහකාර නිලධාරින් විසින් ප්‍රජා සමථකරණය, පාසැල් සමථකරණය හා වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. ඔවුන් පස් දින පාසැල් වැඩසටහන් 26ක් ද, එක්දින පාසැල් වැඩසටහන් 14ක් ද, එක්දින වෙනත් සමථකරණ වැඩසටහන් 23 ක් ද, පවත්වා ඇත.

### 6.7.3 2016.01.01 – 2016.09.30 දින දක්වා පළාත් මට්ටමින් සමථ මණ්ඩල වල ආරවුල් ලැබීම




### 6.7.4 ඉඩම් ආරවුල් පිළිබඳ විශේෂිත සමථ මූල මණ්ඩල

1. යාපනය
2. කිළිනොච්චිය
3. මඩකලපුව
4. ත්‍රිකුණාමලය
5. අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල පිහිටා තිබේ.

### 6.7.5 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (110-01-03)

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 276,756,000 | 146,471,503 | 53% | 90% |
| ප්‍රග්ධන වියදම් | 1,250,000 | 969,382 | 78% | 95% |
| **එකතුව** | **278,006,000** | **147,440,885** | **53%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.8 කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය

**දැක්ම**

"රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරු කිරීම"

**මෙහෙවර**

**"ශක්තිමත් හා පුහුණු කාර්යය මණ්ඩලයක් හරහා කඩිනම් වුත් සාධාරණ වුත් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රියාවලියක් තුලින් රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරු කිරීම"**

### 6.8.1 හැඳින්වීම

1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ 31 (ආ) වගන්තිය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සම්බන්ධ ඉල්ලුම්පත් විභාග කොට විසඳීම කම්කරු විනිශ්චය සභා වෙත පැවරී ඇති මූලික වගකීම වේ. රාජ්‍ය නොවන ආයතනවල සේවක පක්ෂය රැකියා වලින් නෙරපීම් ආදී අසාධාරණකම් පිළිබඳව යුක්තිය ඉෂ්ඨ කරවා ගැනීම සඳහා ඔවුන්ට ඇති මහඟු වරප්‍රසාදයක් ලෙස කම්කරු විනිශ්චය සභාව දැක්විය හැක. කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය යටතේ කම්කරු විනිශ්චය සභා 39 ක් ක්‍රියාත්මක වේ.

**පහත සඳහන් ප්‍රදේශවල කම්කරු විනිශ්චය සභා ස්ථාපිතව ඇත.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 06 | අවිස්සාවෙල්ල | 01 | හලාවත | 01 | නාවලපිටිය | 01 |
| මහනුවර | 01 | මීගමුව | 02 | කඩුවෙල | 01 | පලාපත්වල | 01 |
| ගාල්ල | 01 | මඩකලපුව | 01 | වත්තල | 01 | බලංගොඩ | 01 |
| බදුල්ල | 01 | කුරුණෑගල | 01 | රත්මලාන | 01 | කෑගල්ල | 01 |
| රත්නපුර | 01 | ගම්පහ | 01 | මහරගම | 01 | අම්පාර | 01 |
| නුවරඑළිය | 01 | පානදුර | 01 | කොටපොල | 01 | ත්‍රිකුණාමලය | 01 |
| හැටන් | 01 | මාතර | 01 | බණ්ඩාරවෙල | 01 | කුලියාපිටිය | 01 |
| කළුතර | 01 | අනුරාධපුරය | 01 | තලවකැලේ | 01 | යාපනය | 01 |
| ඇඹිලිපිටිය | 01 | | | | | | |

කම්කරු විනිශ්චය සභා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත්, මූල්‍ය සම්පත් ලබාදීම හා කළමනාකරණය කිරීම කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කාර්යයන් වේ. මේ හැර කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් හැර අනෙකුත් නිලධාරීන්ගේ ආයතන හා පරිපාලන කටයුතු සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම් ඇතුළුව සියළුම මූල්‍ය පරිපාලන හා ගිණුම් කටයුතු ද කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

### 6.8.2 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා ප්‍රගතිය

| 2016.01.01 දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව | 2016.01.01 සිට 2016.09.30 දක්වා | | 2016.09.30 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පැවරූ නඩු ගණන | විසඳූ නඩු ගණන | |
| 5020 | 1872 | 1844 | 5048 |

- යාපනය දිස්ත්‍රික්ක තුල 2016.06.01 දින කම්කරු විනිශ්චය සභාවක් ස්ථාපිත කර රාජකාරි කටයුතු ආරම්භ කිරීම.
- ලඝු ලේඛක පුරප්පාඩු 27 ක් සම්පූර්ණ කිරිම සඳහා ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදු කිරිමට කටයුතු සම්පාදනය කර තිබීම.
- භාෂණ පරිවර්තක නිලධාරි පුරප්පාඩු 07ක් සම්පූර්ණ කිරිමට අදාලව බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව කටයුතු සිදු කරමින් පැවතීම.
- කම්කරු විනිශ්චය සභාවන්හි සහකාර ලේකම් පුරප්පාඩු 25ක් පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් අධිකරණ අමාත්‍යාංශය විසින් පවත්වන ලද අතර ඉදිරියේදි එම සහකාර ලේකම්වරුන් පුරප්පාඩු කම්කරු විනිශ්චය සභා සඳහා අනුයුක්ත කිරීම.
- අවිස්සාවේල්ල, කෑගල්ල, බණ්ඩාරවෙල, රත්නපුර, සහ මහනුවර දිස්ත්‍රික්කවල ස්ථාපිතව ඇති කම්කරු විනිශ්චය සභාවන්හි ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන අනුමත වි ඇති අතර, ඒ අනුව අදාල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.

### 6.8.3 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා මූල්‍ය ප්‍රගතිය (228-01-02)

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **309,020**.000 | 219,989,067 | 71% | 95% |
| ප්‍රාග්ධන වියදම් | 13,050,000 | 5,611,621 | 43% | 90% |
| **එකතුව** | **322,070,000** | **225,600,688** | **70%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 6.9 අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු ආයතනය

**මෙහෙවර**

අධිකරණවල සේවයේ නියුතු විනිසුරුවරුන් හැර අනෙකුත් උපලේඛනගත හා උපලේඛනගත නොවන නිලධාරින් පුහුණු කිරීම තුළින් අධිකරණ සේවයේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මකභාවය ඉහළ නංවා නඩු විසඳීමේ යාන්ත්‍රණයේ ඇති ප්‍රමාදයන් අවම කර ජනතාවට වඩා යහපත් සේවයක් ලබා දීම.

### 6.9.1 හැඳින්වීම

අධිකරණවල සේවය කරන අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීම අරමුණුකර ගනිමින් 2010 වර්ෂයේ බත්තරමුල්ල - පැලවත්තේ පිහිටි අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ලෙහි මෙම අංශය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මගින් මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකරන නිලධාරින් සහ සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් පහත අරමුණු මුල්කර ගනිමින් පවත්වා ඇත.

01. ආකල්ප හා විනය සංවර්ධනය.
02. රාජකාරිය පිළිබඳ අවබෝධය.
03. නව්‍යකරණය හා නිර්මාණකරණය.
04. අල්ලස හා දූෂණය මැඩලීම.

6.9.2 පුහුණු වැඩසටහන් පැවැත්වීම

2016 ජනවාරි **01** සිට සැප්තැම්බර් 30 දක්වා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

| අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් ගණන | පුහුණුවූ පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| **01** | කාර්යාල කාර්ය සහයක තනතුරේ නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහන | 01 | 29 |
| 02 | පෞද්ගලික ලිපි ගොනු සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 40 |
| 03 | ගෙවීම් කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 40 |
| 04 | ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 34 |
| 05 | මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 09 | 329 |
| 06 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 40 |
| 07 | අපරාධ නඩු කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 09 | 312 |
| 08 | සිවිල් නඩු කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 09 | 331 |
| 09 | නීති ක්‍රම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන | 10 | 358 |
| 10 | සේවාරම්භක පුහුණු වැඩසටහන | 01 | 38 |
| 11 | සයමාසික දෙමළ හා ඉංග්‍රිසි භාෂා පුහුණු වැඩසටහන දෙසැම්බර් මාසයේ ආරම්භ කරන ලදී. | 02 | 61 |
| 12 | ත්‍රෛමාසික ඉංග්‍රිසි භාෂා පුහුණු පාඨමාලාව 2016 මැයි මසදි ආරම්භ කරන ලදි. මෙම පාඨමාලාව මෙම පාඨමාලාව විවෘත විශ්ව විද්‍යාලයේ මෙහෙයවීමෙන් පවත්වන ලදී. | 01 | 50 |
| 13 | පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 25 |
| 14 | යාපනය, අනුරාධපුර,පොළොන්නරු, නුවරඑළිය,යන ස්ථානවල පුහුණු වැඩසටහන් පවත්වන ලදී. | 04 | 360 |
| | එකතුව | 51 | 2047 |

# 07. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය ආයතන

## 7.1 නීති ආධාර කොමිෂන් සභාව ( LAC )

නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් ස්ථාපිත කරන ලදි. දරිද්‍රතාව නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට නොහැකි වූ ශ්‍රී ලංකාවේ දුගී ජන කොටස් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය ලබාදීම, සමස්ත සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීම, නව නීති සම්පාදනයේදී හා නෛතික නීති ප්‍රතිසංස්කරණවලදී රජයට උපදේශන කාර්යයේ නිරතවීම යනාදිය මෙහි මූලික කාර්යභාරයන් වේ.


- <u>නීති අංශය</u> -
    1. **යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට හැකියාවක් නොමැති තැනැත්තන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිම.**
    2. **ඕනෑම කෙනෙකුට නොමිලේ නීති උපදෙස් ලබාදීම.**
    3. **නව නීති සම්පාදනයේදී හා නීති ප්‍රතිසංස්කරණවලදී රජයට උපදේශණ කාර්යයේ නිරතවීම.**

සෘජුව ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක කොළඹ නීති ආධාර මධ්‍යස්ථානය ඇතුළුව නීති ආධාර කාර්යාල 77 ක් වේ. අධිකරණමය නීති කෘත්‍යයන් සඳහා ප්‍රාදේශීය ග්‍රාම නිලධාරිවරයා මඟින් කැඳවූ ආදායම් වාර්තා සලකා බලන නමුත් නඩත්තු නඩුවලදී ඒ පිළිබඳව සලකා බලනු නොලැබේ.

### 7.1.1 <u>නීති ආධාර කොමිෂන් සභාව මගින් සේවා සපයන ලද නඩු පිළිබඳ විස්තර.</u>

| අංකය | නඩු පිළිබඳ විස්තරය | නඩු ප්‍රමාණය |
|---|---|---|
| 01 | 2015 වසරේ ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව | 23,609 |
| 02 | 2016 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | 8,526 |
| 03 | 2016 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා පැවති මුළු නඩු ගණන | 32,135 |
| 04 | 2016 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 6,434 |
| 05 | 2016 ඔක්තෝම්බර් 01 වන දිනට රැගෙන ගිය නඩු සංඛ්‍යාව | 25,701 |
| 06 | 2016 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා දෙනු ලැබූ මුළු උපදේශන සංඛ්‍යාව | 69,636 |

## 7.1.2 නීති ආධාර කොමිෂන් සභාව මගින් පළාත් මට්ටමින් ආරවුල් විසඳීම




## 7.1.2 වැඩසටහන් හා ව්‍යාපෘති අංශය

### 7.1.2.1 ජනමාධ්‍ය වැඩසටහන්

a. විවිධ රූපවාහිනි නාලිකා සහ පුවත්පත් මගින් මහජනතාව දැනුවත් කිරිම සඳහා වැඩසටහන් සිදුකර ඇත. මේවායින් බොහොමයක් ආරධිත වැඩසටහන්ය.

රූපවාහිනී වැඩසටහන් - 62

ගුවන් විදුලි වැඩසටහන් - 03

b. සතිපතා පුවත්පත් මගින් මහජනතාවගේ නිති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

දෙසතියකට වරක් සඳුදා ඩේලිනිවුස් පුවත්පත ඉංග්‍රිසි මාධ්‍ය.

දෙසතියකට වරක් අඟහරුවාදා ලංකාදීප පුවත්පත සිංහල මාධ්‍ය

ලංකාදීප නීතියේ සරණ පුවත්පත - 20

ඩේලි නිවුස් නීති පිටුව - 20

### 7.1.2.2 දැනුවත් කිරීමේ සහ සමාජ සහභාගීත්වයෙන් පවත්වන වැඩසටහන්

| | වැඩසටහන | වැඩසටහන් ගණන |
|---|---|---|
| 01 | නෛතික දැනුම ලබා දීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරිම, වරප්‍රසාද ලබාදීමට සහයෝගය දැක්වීමේ වැඩසටහන් | 166 |
| 02 | නෛතික දැනුම ලබා දීම, ගුණාත්මක සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ළඟා කර ගැනීම | 19 |
| 03 | ගැටළු හඳුනා ගැනිම හා විසඳුම් කරා පහසු ප්‍රවේශය, නීති ආධාර සේවය ව්‍යාප්තිය | 11 |
| 04 | නීති වෘත්තියට පිවිසීමට බලාපොරොත්තුවන ආධුනික නීතිඥවරුන් හට ප්‍රායෝගික පුහුණුව ලබාදීම | 01 |
| 05 | නීති අධ්‍යයනය සඳහා උනන්දුවක් දක්වන්නන් වෙත නීතිය සම්බන්ධයෙන් මූලික දැනුමක් ලබාදීම | 01 |
| 06 | විදේශ ගතවන ශ්‍රමිකයින්ගේ නීතිමය ගැටළු අවම කිරීම | 01 |
| 07 | ආරාධිත දේශන මගින් සම්පත් දායකත්වය ලබාදුන් | 33 |

| | | |
|---|---|---|
| | වෙනත් වැඩසටහන් | |
| 08 | ධීවර ප්‍රජාව සඳහා වැඩසටහන් | 03 |
| 09 | වතු කම්කරු වැඩසටහන් | 03 |
| 10 | ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම සම්බන්ධ වැඩසටහන් | 02 |
| 11 | නීති සායන හා දැනුවත් කිරීමේ වැඩසටහන්<br>රූපවාහිනී මඟින් සිදු කළ වැඩසටහන් - 05<br>පුවත් පත් මඟින් සිදු කළ වැඩසටහන් - 03 | 08 |
| | එකතුව | 248 |

## 7.1.3 සංවර්ධන නීති ආධාර අංශ

### 7.1.3.1 විගමණික සේවකයින් සම්බන්ධයෙන් තොරතුරු ඒකකය

ගැටළුවලට මුහුණපෑ විගමණික සේවකයින් සඳහා මෙම අංශය විසින් 2016 වසරේ උපදේශන වැඩසටහන් පවත්වා තිබේ. උපදේශන සේවා ලබාදීමෙන් පසු එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී. මේ අනුව විගමනික ශ්‍රමික පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන් 01ක් මේ වසරේ පවත්වා ඇත. තොරතුරු රැස් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් මට්ටමින් "ගැමි සංසදය" නමැති ප්‍රජා මූල ඒකක 17ක් පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග ඒකාබද්ධව ක්‍රියාත්මකවේ.

### 7.1.3.2 බන්ධනාගාර රැඳවියන්ගේ ඒකකය

බන්ධනාගාරවල තදබදය අවම කිරීමෙහිලා සියළුම ජනතාවට යුක්තිය සඳහා පහසු ප්‍රවේශයක් ලබාදීම සඳහාත් රාජ්‍ය පිරිවැය අවම කිරිමත් අපේක්ෂාවෙන් මෙම ඒකකය ක්‍රියාත්මක වේ. එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මඟින් මුල්‍ය අනුග්‍රහය සපයනු ලබන අතර 2016 අගෝස්තු මස සිට මෙය පුළුල්ව බන්ධනාගාර දෙපර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වේ.

### 7.1.3.3 ආධුනික නීතිඥයින් සඳහා වන පුහුණු වැඩසටහන

ස්වයං මුල්‍ය වැඩසටහනකි. ශ්‍රී ලංකා නිති විද්‍යාලය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වේ. වසරකට නීතිඥවරුන් වශයෙන් දිවුරුම් දෙන ආධුනික නීතිඥයින් පුහුණු කිරීම මෙහි අරමුණවේ. මෙම වසර තුළදී එක් කණ්ඩායමක් යටතේ ආධුනික නීතිඥයින් 156ක් පුහුණු කොට ඇත.

### 7.1.3.4 නීති අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව

ස්වයං මුල්‍ය වැඩසටහනකි. සහභාගිවන්නන්ගේ ශාලා ගාස්තු, නිබන්ධන සැකසීම බාහිර දේශකයින් සඳහා දිමනා පියවා ගැනිමට පමණක් වන නාමික මුදලක් පමණක් අයකෙරේ. මෙම වසරට අදාළව එහි පළමු කණ්ඩායම 2016.07.23 වන දින සිට ආරම්භ කරන ලද අතර එහි 40කට ආසන්න පිරිසක් වෙති.

### 7.1.3.5 ආදිවාසි ජනතාවගේ අයිතිවාසිකම් සඳහා වන වැඩසටහන

ආදිවාසි ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් 01 වැඩසටහනක් රතුගල ප්‍රදේශයේදී පැවැත්විය.

#### 7.1.3.6 ආපදා කළමණාකරන වැඩසටහන

අරණායක සාමසාර කන්ද නාය යාම මගින් විපතට පත් ජනතාව වෙනුවෙන් නීතිමය ලිපි ලේඛන ලබාදීම සඳහා නීති ජංගම සායනයක් පවත්වන ලදී. එහි පසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

### 7.1.4 නිලධාරීන් පුහුණු කිරීම

| අනු අංකය | නිලධාරීන් | නිලධාරින් ගණන |
|---|---|---|
| 01 | නීතිඥවරුන් | 120 |
| 02 | ගණකාධිකාරි | 03 |
| 03 | කළමණාකරණ සහකාර | 07 |
| 04 | රියදුරන් | 02 |

### 7.1.5 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (110-01-02)

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 124,536,000 | 120,302,618 | 97% | 100% |
| ප්‍රාග්ධන වියදම් | 25,000,000 | 6,366,906 | 25% | 79% |
| **මුළු වියදම්** | **149,536,000** | **126,669,524** | **84%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 7.2 උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

**දැක්ම**

ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම කළමණාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීම.

**මෙහෙවර**

උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලයේ මෙහෙවර වනුයේ පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරිම මගින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළුව සියළු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජන හිතකාමී පරිසරයක් සැකසීම තුළින් ආයතනයේ දර්ශනය සාක්ෂාත් කර ගැනීම වේ.

උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගොඩනැගිල්ලට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම හා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා

1987 අංක 50 දරණ පනත මගින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ස්ථාපිත කර ඇත. මෙම මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වෙයි.

- ගරු අග්‍ර විනිශ්චයකාර තුමා.
- ගරු අග්‍ර විනිශ්චයකාර තුමා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්.
- අභියාචනාධිකරණයේ සභාපති තුමා.
- අභියාචනාධිකරණයේ සභාපති තුමා විසින් පත් කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්.
- අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වරයා.
- රාජ්‍ය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයා.
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති වරයා.
- කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වරයා.
- මුදල් විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක් සහ
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති තුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක්

## 7.2.1 2016.01.01 සිට 2016.09.30 දක්වා ප්‍රගතිය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදිවේ.

**ගොඩනැගිලි හා සැලසුම්**

- සිවිල් අභියාචනාධිකරණ ගොඩනැගිල්ලේ ලී ජනෙල හා දොරවල් අළුත්වැඩියා කිරිම.
- උපරිමාධිකරණ සංකිර්ණ කළමනාකරණ මණ්ඩලයට අයත් අංක 211 ගොඩනැගිල්ලේ ලී ජනෙල් හා දොරවල් අළුත්වැඩියා කිරිම.
- උපරිමාධිකරණ සංකිර්ණ කළමනාකරණ මණ්ඩලයට අයත් නිලධාරි නිල නිවාස අළුත්වැඩියා කිරිම

**යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම් හා සවිකිරිම්**

- ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛණාගාරයේ වායු සමීකරණය කිරිම.
- කුඩා වර්ගයේ තනි දොර ශීතකරන යන්ත්‍ර 04 ක් මිළදී ගැනීම.
- ගරු අගවිනිසුරුතුමාගේ නිල මැදිරිය සඳහා වායුසමීකරණ යන්ත්‍රයක් සවි කිරීම.
- සිවිල් අභියාචනාධිකරණයේ අංක 01 නිල මැදිරිය සඳහා වායු සමීකරණයක් සවි කිරීම.
- වෙනත් උපකරණ මිළදි ගැනීම්

## 7.2.2 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (228-01-01)

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 186,580,000 | 121,996,000 | 65% | 95% |
| ප්‍රග්ධන වියදම් | 23,500,000 | 3,360,000 | 14% | 30% |
| **එකතුව** | **210,080,000** | **125,356,000** | **60%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 7.3 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

### 7.3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 1985 අංක 46 දරණ පනත යටතේ පිහිටුවා ඇත. මෙම ආයතනයේ පරිපාලනය කළමනාකරණ මණ්ඩලයක් මගින් සිදුවේ. එහි කළමනාකාරිත්වය අගවිනිසුරුතුමා සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන අධිකරණ අමාත්‍යාංශය මගින් වෙන් කරනු ලැබේ.

**ආයතනයේ විෂයයන් හා කාර්යයන්**

I. අධිකරණ නිලධාරීන් අතර අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලැස්වීම

II. අධිකරණ නිලධරන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු නිරිමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරිමේ අදහසින් රුස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරිම සහ පැවැත්විම.

III. යුක්තිය පසිඳලිම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරිම සහ පැවැත්වීම

IV. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම.

### 7.3.2 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා ප්‍රගතිය

| පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| **අන්තරායදායක ඖෂධ විශ්ලේෂණය කිරීමේදී රජයේ රස පරීක්ෂකවරයාගේ භූමිකාව.** | 02 | 123 |
| **ජාතික දණ්ඩන නියම කිරීමේ නියමු උපදෙස් සංවර්ධනය කිරිම.** | 01 | 36 |
| **පරිබාහිර මූලාශ්‍රවලින් සේවාවන් ලබාගැනිම.** | 01 | 31 |
| **බෙදුම් නඩු නීතිය - බෙදුම් නඩු නීතියේ ස්වභාවය, විෂය පථය, අන්තර්ගතය පිළිබද කෙටි සාකච්ඡාවක් සහ නඩු විභාග අදියර දක්වා වන පියවර විශ්ලේෂණය කිරීම සහ ආනුෂංගික කාරණාවන්.** | 02 | 87 |
| **අධිකරණමය චර්යාව උසාවි ශිල්පය සහ අධිකරණ කළමණාකරණයේදී විනිශ්චයකාරවරයාගේ භූමිකාව.** | 02 | 79 |
| **දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් පැවැත්වූ වැඩමුළු.** | 01 | 55 |
| **නඩු විභාගය සහ තදනන්තර පියවර සහ අතුරු සහ අවසානාත්මක තීන්දු ප්‍රකාශවල වැදගත්කම.** | 02 | 84 |
| **නඩු විභාග කරන අධිකරණවලදී අපරාධ නඩු තීන්දු ලිවිම සඳහා ප්‍රශස්ත ප්‍රවේශය.** | 02 | 73 |
| **සම අයිතිකරුවන් අතර කාලාවරෝධය සම්බන්ධ නීති පිළිබඳ සාකච්ඡාව** | 01 | 55 |
| **එකතුව** | 14 | 623 |

7.3.3 විනිශ්චයකාරවරුන් සඳහා පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | ආයතනයේ නම | විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| පුහුණු පාඨමාලාව | අධිකරණ පුහුණු ඇකඩමිය, දිල්ලි නුවර | 30 |
| පුහුණු පාඨමාලාව | අධිකරණ පුහුණු ඇකඩමිය, බෝපාල් නුවර | 32 |
| | එකතුව | 62 |

7.3.4 විශේෂ ජයග්‍රහණ

1. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුස්තකාලයේ පරිශීලනය සඳහා ඉන්දියාවේ සියළුම නීති වාර්තා මිලදී ගන්නා ලදි.
2. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ පුහුණු වන විනිශ්චයකාරවරයන්ගේ පරිශීලනය සඳහා වෙස්ට්ලෝ ඉන්දියා නැමැති නීති දත්ත සංහිතාව මිලදී ගන්නා ලදි.
3. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සඳහා මනුපුත්‍ර නීති දත්ත සංහිතාව නැවත අලුත් කිරීම කරන ලදි.
4. අධිකරණ විනිශ්චයකාරවරයන් හැත්තෑ එක්දෙනෙකු (71) සඳහා ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව වැඩමුළුවක් 2016 මැයි මස 07 සහ 08 යන දෙදින කොළඹ පිහිටි ටාජ් සමුද්‍රා හෝටලයේ දී පවත්වන ලදි.

7.3.5 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 26,000,000 | 15,077,326 | 58% | 80% |
| ප්‍රාග්ධන වියදම | 7,000,000 | 2,103,783 | 30% | 100% |
| එකතුව | **33,000,000** | **17,181,109** | **52%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 7.4 සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරිමෙ ජාතික අධිකාරිය

### 7.4.1 හැදින්වීම

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නීතිමය වැඩපිළිවෙලක් හඳුන්වා දීම මඟින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත.ඒ අනුව බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 428/11ඒ දරණ ස්ථානයෙහි පිහිටුවනු ලැබූ මෙම අධිකාරිය අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.01.08 වන දින විවෘත කරන ලදි.







පසුව අංක 1966/02 හා 2016.05.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් උක්ත අධිකාරියෙහි විෂය පථය 2016.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකරණ අමාත්‍යාංශය වෙත පවරා ඇත.ඒ අනුව ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් අංක 1967/8 හා 2016.05.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීම පනතෙහි සියළු කොටස් වල විධිවිධාන 2016.05.18 දින සිට ක්‍රියාත්මක කිරීමට නියම කර ඇත.

පනතෙහි IV වන කොටසෙහි 12(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 2016.08.11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය පත්කර ඇත. මෙම කළමනාකරණ මණ්ඩලය අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධිත වෘත්තීන් වල අධ්‍යාපනික හෝ වෘත්තිමය ක්ෂේත්‍රවල

අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් ලත් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් හා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්, කාන්තා කටයුතු විෂය හා ළමා කටයුතු විෂය භාර අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරු හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් හා මානව හිමිකම් කොමිෂන් සභාවේ සමාජිකයෙකු, නීතිපතිවරයාගේ නාමිකයෙකු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ධූරය දරන පොලිස්පතිවරයාගේ නාමිකයෙකු ඇතුළත්වන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7)දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයෙකු වන සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුහද කේ ගමලත් මහතා කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා හා අධිකාරියේ සභාපතිවරයා ලෙස පත්කර ඇත.

### 7.4.2 <u>බලතල හා කාර්යභාරය</u>

පනතේ 11 වගන්තිය යටතේ පිහිටුවන ලැබූ මෙම ජාතික අධිකාරියේ බලතල හා කාර්යභාරය පහත සඳහන් පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

**a. <u>බලාත්මක කිරීමේ කාර්යභාරය</u>**

අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් හා අයිතිවාසිකම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරිම, ආරක්ෂා කිරිම හා දැනුවත් කිරීම.

**b. <u>අර්ධ අධිකරණ කාර්යභාරය</u>**

ඔවුන්ගේ හිමිකම් හා අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ෂණ කිරීම හා පරීක්ෂා කිරීම, රාජ්‍ය ආයතන වලට, රාජ්‍ය නිලධාරීන්ට හා අධිකරණයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

**c. <u>ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය</u>**

අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම

**d. <u>නියාමන කාර්භාරය</u>**

නියමු උපදේශන නිකුත් කිරීම හා අධීක්ෂණය

### 7.4.3 <u>අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාශය</u>

2015 අංක 4 දරණ පනතෙහි පිහිටුවන ලබන අනෙකුත් විශේෂිත ඒකකය වනුයේ ජාතික අධිකාරියේ උපදේශනය හා මඟපෙන්වීම මත ශ්‍රී ලංකා පොලිසිය යටතේ පිහිටුවන ලබන “අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාශය” ලෙස හැඳින්වෙන විශේෂ ඒකකයයි. පනතේ 19 (2) වගන්තිය යටතේ කළමනාකරණ මණ්ඩලයට නිළ බලයෙන් පත් කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කරන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වරයෙකු මෙම කොට්ඨාශය භාර ප්‍රධානියා ලෙස පත්කල යුතුය.

### 7.4.4 <u>අපරාධයක වින්දිතයෙකුට සහ සාක්ෂිකරුවෙකුට පනත යටතේ ආරක්ෂාව ඉල්ලුම් කළහැකි ආයතන</u>

- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
- අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාශය
- අධිකරණය
- කොමිසම - (මානව හිමිකම් කොමිසම, අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කිරීමේ කොමිසම් සභාව සහ පරීක්ෂණ කොමිෂන් සභා පනත් යටතේ පත් කරනු ලබන පරීක්ෂණ කොමිෂන් සභා හෝ ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභා)

- ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති වරයාට

### 7.4.5 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා ප්‍රගතිය

- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය සඳහා 2016/08/11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලද කළමනාකරණ මණ්ඩලය සිය ප්‍රථම රැස්වීම 2016/09/01 දින පවත්වා ඇති අතර ඒ අනුව අධිකාරිය සඳහා අවශ්‍ය මූලික කාර්ය මණ්ඩලය ලෙස තනතුරු නාම දහඅට (18)ක් යටතේ පනස් දෙදෙනෙකු (52)ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල් විසින් අනුමත කර ඇති අතර බඳවා ගැනීම් සඳහා අවශ්‍ය අනෙකුත් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- පොලිස් නිලධාරීන් දෙසීය (200)දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුත් පුහුණු වැඩසටහනක් 2016/11/03 හා 04 යන දෙදින පැවැත්වීමට කටයුතු යොදා ඇත.
- පොලිස්පතිවරයා යටතේ "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සහායක හා ආරක්ෂක කොට්ඨාශය" ස්ථාපිත කිරීම ද 2016/11/03 දින සිදු කිරීමට නියමිතය.
- ආයතනයට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා භාණ්ඩ හා සේවා ලබා දීමේ ක්‍රියාවලිය සඳහා 2016/2017 වර්ෂයන්හි ක්‍රියාකාරී වැඩසටහන සකස් කර ඇත.
- කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් සිය විෂය ක්ෂේත්‍රය යටතේ සිය අත්දැකීම් පදනම් කර ගනිමින් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට කටයුතු අරඹා ඇත.

### 7.4.6 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 3,000,000 | **1,494,132** | **50%** | |
| ප්‍රාග්ධන වියදම් | 1,000,000 | **904,791** | **90%** | **100%** |
| **එකතුව** | **4,000,000** | 2,398,923 | 60% | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

# 08. අධිකරණ

පහත සඳහන් අධිකරණ සඳහා වූ ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ වැය සම්මතයට ඇතුළත්වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය
- මහාධිකරණ
- වාණිජ මහාධිකරණ
- පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ
- දිසා අධිකරණ
- මහේස්ත්‍රාත් අධිකරණ
- කම්කරු විනිශ්චය සභා
- කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ 20 ක්, මහාධිකරණ 31ක්, වාණිජ මහාධිකරණයක්, දිසා/මහේස්ත්‍රාත්අධිකරණ 52 ක්, දිසා අධිකරණ 30 ක්, මහේස්ත්‍රාත් අධිකරණ 49 ක්, ළමා මහේස්ත්‍රාත් අධිකරණ 02 ක්, සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 25 ක්, කම්කරු විනිශ්චය සභා 39 ක්, කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි 65 ක් සම්බන්ධයෙන් ගිණුම්කරණ වගකීම් අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ. මහාධිකරණ ගිණුම් කාර්යාල 24 ක් සහ කම්කරු විනිශ්චය සභා ගිණුම් කාර්යාලයක් හරහා වියදම් බෙදා හැරේ.

## 8.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 8.1.1 <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබෙන සියළුම ඉල්ලුම්පත්‍ර එම අධිකරණය විසින් විභාග කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබාදෙයි.

- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය
- උපදේශක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය
- පාර්ලිමේන්තුව විසින් නිතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණවක් පිළිබඳ අධිකරණ බලය

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ටාර් කාර්යාලය ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සඳහා සහාය දක්වන අතර ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ 234 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන සපයයි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රැස්වීම් පිළියෙල කිරීම සහ ඉල්ලීම් දින ගත කිරීම.
- අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට අනුකූලව ප්‍රකාශ වාර්තා ගත කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවා ගැනීම.
- අභියාචනා අධිකරණයෙන් ලැබෙන අභියාචනා නඩුවල පිටපත් සකස් කිරීම නඩු ගාස්තු තක්සේරු කිරීම.

### 8.1.2 2016.01.01 සිට 2016.09.30 දක්වා ප්‍රගතිය

| නඩු වර්ගය | 2016.01.01 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | 2016.01.01 සිට 2016.09.30 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2016.01. 01 සිට 2016.09.30 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2016.01.01 සිට 2016.09.30 ඉල්ලීමට ඉඩ ලබාදුන් සංඛ්‍යාව | 2016.01.01 සිට 2016.09.30 අවසන් කළ නඩු සංඛ්‍යාව | 2016.09.30 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 973 | 344 | 1,317 | - | 422 | 895 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 504 | 199 | 703 | 49 | 190 | 464 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 35 | 35 | - | 34 | 01 |
| අභියාචනා නඩු | 401 | 172 | 573 | - | 161 | 412 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු | 210 | 27 | 237 | - | 36 | 201 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 162 | 58 | 220 | 13 | 55 | 152 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 05 | 05 | 10 | - | 03 | 07 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1,300 | 478 | 1,778 | 110 | 358 | 1,310 |
| ප්‍රතිශෝධන නඩු | 11 | 05 | 16 | - | 05 | 11 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 01 | - | 01 | - | - | 01 |
| විවිධ නඩු | 09 | 10 | 19 | - | - | 19 |
| SC TAB APPEL | 01 | - | 01 | - | - | 01 |
| SC SPECIAL | 12 | - | 12 | - | - | 12 |
| **එකතුව** | **3,589** | **1,333** | **4,922** | **172** | **1,264** | **3,486** |

### 8.1.3 **2016.01.01 සිට** 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2016.09.30 දිනට වියදම (රු) | 2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට පුරෝකථන වියදම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **92,820,000** | 63,659,000 | **69%** | **86%** |
| ප්‍රාග්ධන වියදම් | **8,400,000** | 2,532,000 | **30%** | **70%** |
| එකතුව | **101,220,000** | 66,191,000 | **65%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 8.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 8.2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණ වල, කම්කරු විනිශ්චය සභා වල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරණ සාපරාධී කරුණු වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.

### 8.2.2 **2016.01.01 සිට 2016.09.30 දක්වා නඩු විමසීමේ කාර්ය සාධනය**

| නඩු වර්ගය | **2016.01.01** දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | **2016.01.01- 2016.09.30** දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | **2016.01.01- 2016.09.30** දක්වා තීරණයවූ නඩු සංඛ්‍යාව | **2016.09.30** දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1424 | 333 | 250 | 1507 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 875 | 237 | 82 | 1030 |
| (රෙම්) | 2 | 2 | - | 4 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා | 1060 | 156 | 206 | 1010 |
| සිවිල් අභියාචනා | 773 | - | 118 | 655 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 311 | 125 | 80 | 356 |
| ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පත් | 64 | 40 | 41 | 63 |
| වෙනත් අයදුම්පත් | 172 | 59 | 39 | 192 |
| **එකතුව** | 4681 | 952 | 816 | 4817 |

### 8.2.3 2016.01.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

| **විස්තරය** | **2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු)** | **2016.09.30 දිනට වියදම (රු)** | **2016.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය** | **2016.12.31 දිනට පුරෝකථන වියදම** |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 60,100,000 | **42,920,000** | 71% | 93% |
| ප්‍රාග්ධන වියදම් | 1,000.000 | **310,000** | 31% | 95% |
| **එකතුව** | **61,100,000** | **43,230,000** | **70%** | |

**මේ වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට නියමිතය.**

## 8.3 කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

### 8.3.1 හැඳින්වීම

කාති උසාවි යනු 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද ලියාපදිංචි කිරීමේ පනත අනුව පිහිටුවනු ලැබූ විශේෂිත අධිකරණයකි. මෙම අධිකරණය විසින් මුස්ලිම් විවාහ සම්බන්ධ අධිකරණ කටයුතු ඔවුන්ගේ සිරිත් වලට අනුව ක්‍රියාත්මක කරනු ලැබේ. ඉස්ලාම් භක්තිකයන් පස් දෙනෙකුගෙන් කාති අභියාචනා මණ්ඩලය සමන්විත වන අතර කාති අධිකරණවල අභියාචනා විභාග කිරිමට ක්‍රියාත්මකවේ. වර්තමානයේ කාති උසාවි 65 ක් සහ එක් කාති අභියාචනා මණ්ඩලයක් ක්‍රියාත්මකවේ.

### 8.3.2 කාති උසාවි

| | | |
|---|---|---|
| අඩ්ඩාලච්චේන | කල්මුණේ | පාතහේවාහැට |
| අක්කරෙයිපත්තුව | කල්පිටිය | පානදුර |
| අකුරණ | කළුතර | පොලොන්නරුව |
| අනුරාධපුරය | මහනුවර | පොතුවිල් (පානම්පත්තුව) |
| අව්ස්සාවේල්ල | කාතන්කුඩි (මන්මුනායිපත්තු) | පුල්මුඩේ |
| බදුල්ල | කෑගල්ල | පුත්තලම සහ හලාවත |
| බලපිටිය සහ ඇල්පිටිය | කින්නියා | රත්නපුර |
| බේරුවල | කුලියාපිටිය | සරණාගත ජනසමූහය (කල්පිටිය -පුත්තලම) |
| බෝරා ජනසමූහය | කුරුණෑගල | සායින්දමරුදු |
| බියගම | මහව | සම්මන්තුරෙයි |
| කොළඹ නැගෙනහිර | මන්නාරම | තඹලගමුව සහ කන්තලේ |
| කොළඹ උතුර | මාතලේ | තංගල්ල |
| කොළඹ දකුණ | මාතර | ත්‍රිකුණාමලය |
| කොළඹ බටහිර | මාවනැල්ල | තුම්පනේ |
| එරාවූර් | මෙමොන් ජනසමූහය | ගම්පොල උඩපලාත |
| ගාල්ල | මොණරාගල | උඩතලවින්න (පහත දුම්බර) |
| ගම්පහ (තිහාරිය) | මුතූර් | උඩුනුවර |
| හම්බන්තොට | නාවලපිටිය | වලච්චේන |
| හාරිස්පත්තුව හා පූජාපිටිය | මීගමුව | වවුනියාව |
| හැටන් | නින්දවූර්පත්තු | යටිනුවර |
| හොරණ | නුවර එළිය | යාපනය |
| ඉරක්කාමම් | ඔට්ටමාවඩි | |

8.3.3 **කාති අභියාචනා මණ්ඩලයේ ප්‍රගතිය 2012 – 2016 (ජනවාරි සිට සැප්තැම්බර් දක්වා )**

| වර්ෂය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 2012 | 206 | 69 | 137 |
| 2013 | 219 | 65 | 154 |
| 2014 | 244 | 60 | 184 |
| 2015 | **266** | **112** | 154 |
| **2016** (ජනවාරි සිට සැප්තැම්බර් දක්වා) | 234 | 59 | 175 |

8.3.4 **කාති උසාවිවල ප්‍රගතිය 2012 – 2016 (ජනවාරි සිට සැප්තැම්බර් දක්වා)**

| කාලය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| **2012** | 13,226 | 8,651 | 4,575 |
| **2013** | 12,735 | 7,660 | 5,075 |
| **2014** | 13,479 | 8,479 | 5,005 |
| 2015 | **12,042** | **7,032** | **5,010** |
| **2016** (ජනවාරි සිට **සැප්තැම්බර්** දක්වා) | 10,835 | 5,460 | 5,375 |

# 09. අනෙකුත් ආයතන

## 9.1 නීති විද්‍යාලය

### 9.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නීතිඥ මඩුල්ලට තමන්ගේ නම ඇතුලත් කර ගැනීමට කැමති අයවලුන් හට පවත්වනු ලබන නීති අධ්‍යාපනය පාලනය කිරීම සඳහා 1900 අංක 02 දරණ සංස්ථාගත නීති අධ්‍යාපන සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා නීති විද්‍යාලය ක්‍රියා කරනු ලබයි. සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ සභාපතිත්වය ගරු අගවිනිසුරු තුමා විසින් හොබවන අතර ගරු නීතිපතිතුමා, ගරු සොලිසිටර් ජනරාල්තුමා හා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා හා අගවිනිසුරුතුමා විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන්ද, ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙකුගෙන් හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සභාව සමන්විත වෙයි.

නීති විද්‍යාලය වසර 3 ½ ක පාඨමාලාවක් පවත්වන අතර එක් එක් වසර අවසානයේ පරීක්ෂණ තුනක්, එනම් ප්‍රථම, මධ්‍යම හා අවසාන වසර සඳහා පරීක්ෂණ පවත්වනු ලබයි. එම විභාග සමත්වන අපේක්ෂකයින් නීතිඥයන් ලෙස දිවුරුම් දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලුම් කිරීමට පෙර අවුරුදු 08ක අවම පළපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු යටතේ මාස 06ක ආධුනික කාලයක් ගත කිරීම අවශ්‍ය වෙයි.

මෙම ආයතනය ස්වයං මූල්‍ය සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වේ. එසේම බාහිර කථිකාචාර්යවරුන් ලෙස නීතිඥ වෘත්තියේ යෙදෙන හා සමාගම්වල සේවයේ නියුතු අය බඳවා ගැනේ. ඔවුන් ජනාධිපති නීතිඥවරුන් හෝ පළපුරුදු නීතිඥවරුන් වේ.

**2016-01-01 සිට 2016-09-30 දක්වා ප්‍රගතිය**

2016 අප්‍රේල් විභාගය සඳහා සිසුන් 1,323 ක් පෙනී සිටි අතර 2016 අධ්‍යයන වර්ෂය සඳහා 2016-09-30 තෙක් කාලයට දේශීය හා විදේශීය එල්.එල්.බී. උපාධිධාරි, හා නීති ප්‍රවේශ විභාගය සමත්වූ ශිෂ්‍යයින් ඇතුලුව 582 දෙනෙකු පාඨමාලා සඳහා බඳවා ගෙන ඇත.

2017 වර්ෂයට නීති ශිෂ්‍යයින් ඇතුලත් කරගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් තරඟ විභාගයක් 2016-09-25 දින පැවැත්වීමට නියමිතය. ඊට අයදුම්කරුවන් 5,132 ක් පෙනී සිටීමට ඉල්ලුම් කර ඇත.